# දෙවන පරිච්ඡේදය

## අමාත්‍යාංශය විසින් අත්පත් කරගත් ප්‍රගතිය


# අමාත්‍යාංශය විසින් අත්පත් කරගත් ප්‍රගතිය

වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරදීම, ඔවුන්ගේ සේවා සුරක්ෂිතතාවය සලසා දීම හා රට තුළ කාර්මික සාමය ස්ථාපනය සහ විදේශීය රැකියා වෙළඳපළ වෙත නිපුණ ශ්‍රමිකයින් යොමු කිරීම යන ක්ෂේත්‍රයන් යටතේ ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් වැඩසටහන් සකස් කර ඇත.

මෙරට ශ්‍රම බලකාය මිලියන 8.5ක් වන අතර ඉන් මිලියන 8.1ක් සේවා නියුක්තව සිටී. එම පිරිසෙන් රජයේ සේවකයන්, තමන්ගේ ව්‍යාපාරයක නිරත වන්නන් හා පවුලේ ව්‍යාපාරවලට දායකත්වය දක්වන්නන් හැරුණු කොට පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුක්ත මිලියන 2.4ක සේවා නියුක්තිකයන්ගේ වෘත්තිය අයිතිවාසිකම්, වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය තහවුරු කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමෙන් රට තුළ කාර්මික සාමය පවත්වා ගැනීම හා එතුලින් මෙරට සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීමේ වගකීම මෙම අමාත්‍යාංශය සතුවේ.

එමෙන්ම, රැකියා සඳහා සංක්‍රමණය වීමෙන් ප්‍රතිලාභ ලබන ලෝකයේ බොහෝ රටවල් අතරින් ශ්‍රී ලංකාවද ප්‍රධාන ස්ථානයක සිටී. මෙරට සමස්ත විදේශ විනිමය ඉපැයීමවලින්, විදේශ රැකියාවලින් ලැබෙන ප්‍රේෂණ වැඩි දායකත්වයක් දක්වයි. 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා රුපියල් බිලියන 1,252.6ක විදේශ ප්‍රේෂණ ප්‍රමාණයක් මෙරටට ලැබී ඇති අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 5%කට දායකත්වය දරයි. 2022 වසරේදි පුද්ගලයින් 310,958 දෙනෙකුගෙන් කාන්තාවන් 124,009ක් සහ පිරිමින් 186,949ක් විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් ඇත. මෙම තත්වය තුළ ශ්‍රී ලංකා ආර්ථිකයට සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ දායකත්වය පිළිගනිමින් විගමනික ශ්‍රමික ප්‍රේෂණ උපරිම තත්වයකට ගෙන ඒමටත් නුපුහුණු ශ්‍රමිකයන් වෙනුවට පුහුණු ශ්‍රමිකයින් විදේශගත කිරීමටත් රජය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණ සහ වැඩසටහන් රැසක් ආරම්භ කර ඇත.

අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතන විසින් ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කළ ක්‍රියාකාරකම්හි 2023 වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට ලබා ඇති ප්‍රගතිය පිළිබඳ සාරාංශයක් මෙම පරිච්ඡේදයේ අඩංගු වේ.




රූපසටහන **2.1 -** ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ තොරතුරු 2022
මූලාශ්‍රය: වාර්ෂික වාර්තාව - 2022, ශ්‍රී ලංකා මහ බැංකුව

## 2.1 සේවකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා නීතිමය රාමුව ශක්තිමත් කිරීම

ශ්‍රී ලංකාව තුළ ආයෝජන හිතකාමී වාතාවරණයක් ඇති කිරීම උදෙසා මෙන්ම රටෙහි අනාගත අභිවෘද්ධිය අත්පත් කර ගැනීමට හැකිවන පරිදි පිළිගත් ජාතික සහ ජාත්‍යන්තර සමාජ, ආර්ථික තත්වයන්ට සහ කම්කරු ප්‍රඥප්ති හා ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි නෛතික ප්‍රතිපාදන සම්පාදනය

කරදීම මෙම අමාත්‍යාංශය සතු කාලීන වගකීමකි. වර්තමානයේ දී ශ්‍රී ලංකාව තුළ කම්කරු ප්‍රජාවගේ අයිතිවාසිකම් සහ සුභසාධනය සහතික කිරීම සඳහා අණපනත් සහ රෙගුලාසි 50ක් ක්‍රියාත්මක වේ. කම්කරු දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට මෙම නීතිරීතින් පනවා ඇත. වර්තමාන මෙන්ම අනාගත අභියෝගවලට මුහුණ දීම සඳහා මෙන්ම වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා මෙන්ම පනත් අතර පවතින සංකීර්ණතා ඉවත් කර සරල කරමින් සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ සහතික කිරීම අදාළ පනත් සහ අණපනත් සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

### 2.1.1 වර්තමානයට ගැලපෙන ප්‍රතිපාදන සහිතව නව සේවා නියුක්ති පනතක් සකස් කිරීම

කම්කරු දෙපාර්තමේන්තුව විසින් දැනට බලාත්මක කරනු ලබන අණපනත් වර්තමාන සමාජ ආර්ථික වෙනස්කම් හා ඒ හා බැඳුනු වැඩ ලෝකයේ වෙනස්කම් ආමන්ත්‍රණය සඳහා යෝග්‍ය නොවේ. සේවක ප්‍රජාවගේ අයිතිවාසිකම් තහවුරු කරමින් ව්‍යාපාරවල අඛණ්ඩ පැවැත්ම හා විදේශ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමේ පහසුකම් සලසන කම්කරු නීතියක අවශ්‍යතාවය ඉස්මතු වී තිබේ. එසේම, පනත් අතර පවතින සංකීර්ණතා ඉවත් කර සරල කරමින් සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ සහතික කිරීම අවශ්‍ය වේ. මේ සඳහා වෘත්තීය සමිති, හාම්පුතුන් ඇතුළු විවිධ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා වාර 08ක් පවත්වා දැනට ක්‍රියාත්මක පනත් 13ක ප්‍රතිපාදන සංශෝධනය විය යුතු ආකාරය පිළිබඳ අදහස් ලබා ගන්නා ලදී. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව දැනට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නියෝජනයක් සහිතව පත් කළ කමිටුව විසින් නව සේවා නියුක්ති පනත කෙටුම්පත් කරමින් පවතී.

### 2.1.2 1954 අංක 19 සාප්පු හා කාර්යාල පනත සංශෝධනය කිරීම

සාප්පු හා කාර්යාල පනත සේවක සුභසාධනයට සහ වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කිරීමේ අවශ්‍යතාවක් පවතින අතර පහත සඳහන් සංශෝධයන් සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. අවසන් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇත.

- දැනුම් ක්‍රියාවලිය බාහිරින් සපයා ගැනීමේ ආයතන (KPO), ව්‍යාපාර ක්‍රියාවලිය බාහිරින් සපයා ගැනීමේ ආයතන (BPO) සහ වෙනත් රටවල පිහිටි ව්‍යාපාර ආයතන හා එම සමාගම්වල ගිණුම්, පරිපාලන කටයුතු කරනු ලබන කාර්යාල වැනි ආයතනවල සේවයේ නියුතු කාන්තා සේවිකාවන්ට රාත්‍රී සේවයේ යෙදීමට අවස්ථාව ලබා දීම
- රාත්‍රී සේවයේ යොදවනු ලබන කාන්තාවන් වෙනුවෙන් ප්‍රවාහන පහසුකම්, ආරක්ෂාව හා සේවය කරන ස්ථානයට අදාළ පොදු පහසුකම් ලබා දීමට අදාළ නියෝග සෑදීමේ බලය ලබා දීම
- ඉටු කරන සමාන සේවයක් හෝ වැඩක් සඳහා ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සමාන වේතන ගෙවීම සඳහා සේවායෝජකයන්ට නියම කිරීම

### 2.1.3 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම

සේවක සුභසාධනයට සහ වර්තමාන සමාජ ආර්ථික තත්ත්වයට ගැළපෙන පරිදි සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කළ යුතුය. සේවකයෙකු ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමයක් යටතේ හෝ වර්තමාන වැඩ ලොව අවශ්‍යතා මත වයස අවුරුදු 55 සම්පූර්ණ වීමට පෙර විශ්‍රාම ගැනීමේදී සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීමට ප්‍රතිපාදන සැලසීමට කටයුතු කරනු ලැබේ.

## 2.2 විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නෛතික සහ ප්‍රතිපත්ති රාමුව සවිමත් කිරීම

### 2.2.1 1985 අංක 21 දරණ විදේශ රැකියා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය කිරීම

විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත යටතේ ලියාපදිංචි කිරීමේ ගාස්තු වැඩි කිරීම සඳහා නියෝග සංශෝධනය කිරීමට 51 හා 61 වගන්ති යටතේ සාදන ලද නියෝග සංශෝධනය කිරීම අවසන් කර ඇති අතර සංශෝධිත නියෝග 2023.06.23 දිනැති අංක 2337/27 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

### 2.2.2 රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීම සහ විෂයපථය පුළුල් කිරීම

සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් යාවත්කාලීන කරන ලද රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම 2023.09.04 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙරට ශ්‍රම සංක්‍රමණය සඳහා වූ ප්‍රවේශයේ සැලකිය යුතු ඉදිරි පියවරක් සනිටුහන් කරමින් එය 2023.10. 25 දින සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් නිල වශයෙන් එළිදැක්වීමට නියමිතය.

## 2.3 විදේශ රැකියාවේ නියුක්ත ශ්‍රී ලාංකිකයින් විසින් උපයන මුදල් නීත්‍යානුකූල මාර්ගවලින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීම දිරිමත් කිරීමට කටයුතු කිරීම

### 2.3.1 එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් සඳහා පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබා දීම

එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් විසින් තම විදේශ විනිමය ඉපැයීම් මෙරටට ප්‍රේෂණය කිරීම මඟින් ජාතික ආර්ථිකයට ලබා දෙන දායකත්වය ඇගයීම සඳහා ඔවුන් දිරිමත් කිරීමේ එක් යෝජනා ක්‍රමයක් ලෙස මෙරට බැංකු පද්ධතිය හරහා විදේශ විනිමය මෙරටට ප්‍රේෂණය කරන එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් හට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට හැකි වනු පිණිස ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමන් විසින් ඉදිරිපත් කරන ලද 2022.06.17 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට හා ඊට ආනුෂංගික අමාත්‍ය මණ්ඩල සටහනට අනුව 2022.08.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත. මෙම ප්‍රතිලාභ ලැබීම සඳහා සුදුසුකම් ලැබීමට එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් විසින් මෙරට බැංකු පද්ධතිය හරහා ප්‍රේෂණය කර ඇති විදේශ මුදල් ප්‍රමාණයෙන් අවම වශයෙන් 50%ක් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කර තිබිය යුතුයි.

2023.09.30 දින වන විට මෙම යෝජනා ක්‍රමය යටතේ බලපත්‍ර 133ක් නිකුත් කර ඇති අතර විගමනිකයන් අදාළ කාල සීමාව තුළ ප්‍රේෂණය කර ඇති විදේශ විනිමය ප්‍රමාණය ඇ.එ.ජ.ඩො.මිලි. 15.07 කි.

### 2.3.2 රැකියා සඳහා විදේශගතව සිට නැවත පැමිණෙණ විගමනික ශ්‍රමිකයින් සඳහා අතිරේක තිරු බදු සහන ලබා දීම

විගමණික ශ්‍රමිකයන් නැවත මෙරටට පැමිණෙන අවස්ථාවන්හි දී, ගුවන් තොටුපල තීරු බදු රහිත සාප්පු සංකීර්ණයෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා විදේශගත වී සිටින කාලසීමාව පදනම් කරගෙන දැනට දෙනු ලබන තිරු බදු දීමනාවට අමතරව ඔවුන් විසින් මෙරට බැංකු පද්ධතිය හා

"Lanka Remit" යෙදවුම හරහා ප්‍රේෂණය කර ඇති විදේශ මුදල් ප්‍රමාණය මත පදනම්ව අතිරේක තීරුබදු දීමනාවක් ලබා දීම සිදු කෙරේ.

#### 2.3.3 දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ රැකියාවේ නිරත වන ශ්‍රමිකයෙකුගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු මාසික විශ්‍රාම වැටුපක් ලබාගැනීම සඳහා 'මනුසවි' දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය හා එක්ව ක්‍රියාත්මක කිරීම. මෙම දායකත්ව විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල් විදේශ විනිමයවලින් ගෙවිය යුතු වේ.

#### 2.3.4 ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් හට ගුවන් තොටුපල තුළදී වැඩි පහසුකම් ලබා දීමේ අරමුණින් "බලාපොරොත්තුවේ දොරටුව "(HOPE GATE)" විවෘත කිරීම.

## 2.4 ශ්‍රමයේ අභිමානය (Dignity of Work) වර්ධනය කිරීම

සමාජයේ නිල් කරපටි රැකියාවන් ලෙස හඳුනාගෙන ඇති වෘත්තීන් සඳහා අභිමානයක් ඇති වන පරිදි ඔවුන්ගේ සේවා තත්වයන් උසස් මට්ටමින් සිදු කිරීම සඳහා මඟ පෙන්වීමට හා වෘත්තීය මාර්ගෝපදේශ හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතියි. එම වෘත්තිකයන් හට අවශ්‍ය දැනුම ලබා දීම හා චර්යා ධර්ම හඳුන්වා දීම මඟින් සේවාව සැපයීමේ ඉහළ ප්‍රමිතීන් හඳුන්වා දීමටත් ගුණාත්මක සේවාවක් ලබා දීමටත් හැකි තත්ත්වයට එම වෘත්තිකයන් පත් කෙරෙනු ඇත. එක් එක් අංශවල අවිධිමත් අංශයේ රැකියා කාණ්ඩ හඳුනාගෙන එම අංශ සමඟ සාකච්ඡා කිරීම දිරියේදී ආරම්භ කිරීමට නියමිත අතර ඒ අනුව ඉදිරි සැලසුම් සකස් කෙරේ.

## 2.5 ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම සහ ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් පවත්වාගෙන යාම

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ එම සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඇති කරගත් බැඳීම, අන්තර්ජාතික වශයෙන් පිළිගත් සම්මුතීන් හා නිර්දේශයන් යටතේ මෙරට කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම සහ කම්කරු ක්ෂේත්‍රයේ ගැටලු විසඳීම සඳහා උපයෝගී කර ගැනීමට අදාළ වගකීම මෙම අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලබයි.

කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා අනෙකුත් බහුපාර්ශවීය නියෝජිත ආයතන උදෙසා සාමාජික රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ බැඳීම හා වගකීම් සපුරා ඇති බව සහතික කිරීම හා කම්කරු ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, ජාතික මට්ටමේ සමාජ සංවාද ඇති කිරීම සහ මානව සම්පත් සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සහාය ලබා ගැනීමට ද කටයුතු කරනු ලැබේ. මෙම ඉලක්ක සපුරාලීමට 2023 වසරේ මුල් කාර්තු තුන තුළ පහත පියවර ගෙන ඇත.

#### 2.5.1 ශ්‍රම බලකාය බලගැන්වීම සහ ආරක්ෂා කිරීම

- ත්‍රෛපාර්ශවීය නියෝජනයෙන් යුක්ත ජාතික කම්කරු උපදේශක සභා (NLAC) රැස්වීමේ දී පහසුකම් සපයන්නා ලෙසට ක්‍රියා කිරීම. 2023 වර්ෂය තුළ රැස්වීම් තුනක් පැවැත්වීම මඟින් පහත ක්‍රියාමාර්ග සිදු කර ඇත
  - ජාතික කම්කරු උපදේශක සභාව නියෝජනය සඳහා වතු කම්කරු ක්ෂේත්‍රය නියෝජනය වන පරිදි සිලෝන් එස්ටේට් ස්ටාෆ්ස් යූනියන් වෙත සාමාජිකත්වය ලබා දීමට තීරණය කිරීම හා සාමාජිකත්වය ලබා දීමට කටයුතු කිරීම
  - ජාතික කම්කරු උපදේශක සභාව සඳහා කාන්තා නියෝජනය වෙනුවෙන් වෘත්තීය සමිතියක් ඇතුළත් කිරීමට තීරණය කරන ලදී

- දැනට පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ශ්‍රම වෙළඳපොළ තුළ ඇතිවී තිබෙන ගැටලු හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීම සඳහා ත්‍රෛපාර්ශවීය නියෝජනයෙන් යුක්තව කමිටුවක් පත්කර එයට අදාළ කටයුතු සංවිධානය කිරීම හා ගරු අමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් සාකච්ඡා වාර 01ක් පැවැත්වීම හා එහිදී සමාජ ආරක්ෂණය සහ රැකියා විරහිත වූවන් සඳහා රක්ෂණ පහසුකම් සැපයීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය, මහ බැංකුව, ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල නියෝජනය වන පරිදි කමිටුවක් පිහිටුවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් සිදුකරමින් පවතී.

### 2.5.2 ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් පවත්වාගෙන යාම

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථා අංක 22 යටතේ 2023 වර්ෂය සඳහා සම්මුතීන් 14 ක් සඳහා වාර්තා සම්පාදනය කිරීම හා සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ වාර්තා 10ක් පිළියෙල කර ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ඉදිරිපත් කර ඇත

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථා අංක19 යටතේ පවතින අපරානුමත නොකළ සම්මුති සඳහා වාර්තා සම්පාදනය කිරීම
- අමාත්‍යාංශයට අදාළව ක්‍රියාත්මක වන සියලුම ආකාරයේ ප්‍රතිපත්ති සැකසීම සඳහා මූලිකත්වය දැරීම

- වාර්ෂිකව ජිනීවා හි පැවැත්වෙන ජාත්‍යන්තර කම්කරු සමුළුව සඳහා ත්‍රෛපාර්ශවීය නියෝජිතයන් සහභාගී කරවීමට අදාළ සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ පසුවිපරම් කටයුතු සිදු කිරීම. ඒ අනුව, 2023.06.05 සිට 2023.06.16 දින දක්වා ජාත්‍යන්තර කම්කරු සමුළුව පැවැත්වූවද රටේ පවතින ආරථික අර්බුදය හමුවේ අරමුදල් සපයා ගැනීමේ දුෂ්කරතාව හේතුවෙන් නියෝජිතයන් සහභාගී කරවීමට නොහැකි විය

- ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2023 වර්ෂය සඳහා වන අයවැය කථාව අනුව, ශ්‍රී ලංකාව තුළ පවතින යල්පැන ගිය කම්කරු නීති වෙනුවට නව නීති මාලාවක් හඳුන්වා දී තනි පනතක් ලෙස රැගෙන ඒමට කටයුතු ආරම්භ කිරීම. මේ යටතේ වෘත්තීය සමිති, හාම්පුතුන් ඇතුළු විවිධ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා වාර 08ක් පවත්වා කම්කරු නීති සංශෝධනය විය යුතු ආකාරය පිළිබඳ අදහස් ලබා ගන්නා ලදී. එසේම, අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 27/2023 අනුව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට යෝජිත නව නීති රාමුව කෙටුම්පත් කිරීමට අවශ්‍ය අනුමැතිය ලැබී ඇති අතර, දැනට නීතිපති දෙපාර්තමේන්තුව මඟින් නව පනත කෙටුම්පත් කරමින් පවතී
- ශ්‍රී ලංකාවට අවශ්‍ය සමාජ ආරක්ෂණ ක්‍රමවේදය හඳුනා ගැනීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහායෙන් අධ්‍යයනයක් සිදු කරමින් පවතී. එසේම, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහයෙන් සමාජ ආරක්ෂණ පද්ධතීන් පිළිබඳ දැනුම ලබා දීමේ වැඩසටහනක් ත්‍රෛපාර්ශවීය පාර්ශවකරුවන් වෙත 2023.03.03 හා 2023.05.23 යන දෙදින තුළ පවත්වන ලදී. එසේම, ඉන්දුනීසියාවේ පවතින සමාජ ආරක්ෂණ ක්‍රමවේදය පිළිබඳ දැනුවත්භාවය ලබා ගැනීමටත් එම ක්‍රමවේදයන් ලංකාවේ ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව පිළිබඳ අධ්‍යයනය කිරීමටත් අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ත්‍රෛපාර්ශවීය දූත මණ්ඩලයක් 2023.09.03 දින ඉන්දුනීසියාව බලා පිටත් විය

- ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර කම්කරු ක්ෂේත්‍රයට අදාළව සමාජ ආරක්ෂණ, අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරියේදී ඇතිකර ගැනීමට නියමිත අවබෝධතා ගිවිසුම් හා ඒ සම්බන්ධ සියලු වැඩසටහන්වලට අදාළව කටයුතු කිරීම



**ඡායාරූපය 2.1 -** ජාතික කම්කරු උපදේශන සභාව රැස්වීම

- ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර සමාජ ආරක්ෂණ ගිවිසුමට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සකස් කිරීම හා අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට අදාළ කටයුතු සම්පාදනය
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන කාලීන ආර්ථික සංවර්ධනයේ වැදගත් අංශ සහ ආර්ථික සංවර්ධනයේ ඉදිරි දැක්ම සම්බන්ධයෙන් වන වාර්තාවට අදාළ තොරතුරු සැපයීම සහ මහ බැංකු වාර්ෂික වාර්තාවට අදාළ තොරතුරු සම්පාදනය කිරීම
- විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අනෙකුත් රජයේ අමාත්‍යාංශ වෙත කම්කරු ක්ෂේත්‍රයට අදාළ වන නව ප්‍රවණතා පිළිබඳ වාර්තා සම්පාදනය කිරීම
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහයෝගීතාවය ඇතිව ක්‍රියාත්මක කරන ව්‍යාපෘති හා වැඩමුළුවලට අදාළව සියලුම සම්බන්ධීකරණ කටයුතු කිරීම
- වාර්ෂිකව යැවිය යුතු ශ්‍රම සංඛ්‍යා ලේඛන පිළිබඳ ප්‍රශ්නාවලියට පිළිතුරු ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත සැපයීම
- විදේශීය ශිෂ්‍යත්ව වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සඳහා මෙම අමාත්‍යාංශයට අදාළ අනෙකුත් ආයතන සහ කම්කරු දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් සහභාගී කිරීමට පියවර ගැනීම. 2023 ජනවාරි 01 සිට 2023 සැප්තැම්බර් 30 දක්වා කාල සීමාව තුළ විදේශ පුහුණු පාඨමාලා සහ වැඩමුළු සඳහා නිලධාරීන් 49 දෙනෙකු පාඨමාලාවන්ට සහභාගී වීම සඳහා විදෙස්ගතවී ඇත.



ඡායාරූපය 2.2 - කම්කරු නීතිය ප්‍රතිසංවිධානය කිරීම පිළිබඳ කතිකාවත

## 2.6 ජාත්‍යන්තර සහයෝගිතාව තුළින් විගමනික ශ්‍රමිකයන් සවිබල ගැන්වීම

### 2.6.1 අවබෝධතා ගිවිසුම් / එකඟතා

විදේශ රැකියා අංශයේ ප්‍රවර්ධනය, මානව හැකියාවන් වර්ධනය කිරීම, ජාත්‍යන්තර සමාජ ආරක්ෂක වැඩසටහන්, පුහුණු වැඩසටහන්, නීති කටයුතු සහ අන්‍යොන්‍ය සබඳතා වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය රටවල් සමඟ ගිවිසුම් ගණනාවකට එළඹ තිබේ. දැනට එවැනි අවබෝධතා ගිවිසුම් / එකඟතා විස්සක් (20) සක්‍රීයව ක්‍රියාත්මක කෙරේ.

- **නව අවබෝධතා ගිවිසුම් / එකඟතා**

ශ්‍රී ලංකා රජය, ජපානයේ එහිම් ප්‍රාන්තය අතර කෘෂිකාර්මික හා අනෙකුත් ක්ෂේත්‍රයන්හි සහයෝගීතා ගිවිසුම 2023 ජුනි මස 07 දින අත්සන් කරන ලදී.

- **විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා පහත සඳහන් රටවල් සමඟ අවබෝධතා ගිවිසුම් / එකඟතා අත්සන් කිරීමට අදාළව කෙටුම්පත් හුවමාරු කරගෙන ඇත.**

| | | |
|---|---|---|
| මෝල්ටා ජනරජය | - | මිනිස්බල ක්ෂේත්‍රය |
| රුමේනියාව | - | රැකියා සහ මිනිස්බල ක්ෂේත්‍ර |
| ඉතාලිය | - | සංක්‍රමණය සහ සංචලන හවුල්කාරිත්වය |
| නවසීලන්තය | - | නවසීලන්ත රජය විසින් අරමුදල් සපයන ජාත්‍යන්තර සංක්‍රමණ ප්‍රතිපත්ති සංවර්ධන මධ්‍යස්ථානය (ICMPD) විසින් කළමනාකරණය කරනු ලබන සංක්‍රමණික සම්පත් මධ්‍යස්ථානයක් (MRC) පිහිටුවීම සම්බන්ධයෙන් වන යෝජිත අවබෝධතා ගිවිසුම |
| තුර්කිය | - | ශ්‍රී ලංකා රජය හා තුර්කි රජය අතර ශ්‍රම සංක්‍රමණය පිළිබඳ යෝජිත එකඟතාව |

- **විදේශ රැකියා සම්බන්ධයෙන් ගමනාන්ත රටවල් සමඟ දැනට පවතින අවබෝධතා ගිවිසුම් / ද්වි පාර්ශවික එකඟතා සමාලෝචනය කිරීම**

පහත සඳහන් එකඟතා / අවබෝධතා ගිවිසුම් සමාලෝචනය කිරීම සම්බන්ධ තොරතුරු විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා අදාළ රාජ්‍යයන් වෙත යොමුකර ද්විපාර්ශවීය ලෙස අදහස් හුවමාරු කර ගනිමින් පවතී.

සීෂෙල්ස් රාජ්‍යය - මිනිස්බල ක්ෂේත්‍රය
කුවේට් රාජ්‍යය - කම්කරු රැකියා සහ මිනිස්බල ප්‍රවර්ධන ක්ෂේත්‍රය
කොරියානු ජනරජය - රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ ශ්‍රමිකයින් පිටත් කර යැවීම හා ලබා ගැනීම
මැලේසියාව - ශ්‍රමිකයින් බඳවා ගැනීම, සේවා නියුක්ත කිරීම හා නැවත ගෙන්වා ගැනීම

- **ඒකාබද්ධ කමිටු රැස්වීම්**

ශ්‍රී ලංකාව හා ඕමාන රාජ්‍යය අතර ශ්‍රම සහ පුහුණු ක්ෂේත්‍රයෙහි අවබෝධතා ගිවිසුම යටතේ ඒකාබද්ධ කමිටු රැස්වීම පැවැත්වීම සම්බන්ධව නාම යෝජනා ඕමාන පාර්ශවය වෙත යොමු කර ඇති අතර ඉදිරියේදී ඒකාබද්ධ කමිටු පැවැත්වීමට නියමිතය.

## 2.6.2 ගෝලීය / කලාපීය සංසද

- **කොළඹ ක්‍රියාදාමය**

පිලිපීනය සභාපතිත්වය දරන පෙර විගමනය සහ බලගැන්වීම පිළිබඳ පස්වන (5) හා හයවන (6) වන තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් පිළිවෙලින් 2023.03.14-15 සහ 2023.08.16-17 දක්වා පිලිපීනයේදී හා තායිලන්තයේදී පැවැත්විණි.

සංක්‍රමණික අයිතිවාසිකම් ආරක්ෂා කරන අතරම ආසියාවේ සංක්‍රමණික සේවකයින් සඳහා අනාගත පිළියම් සෙවීමේ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම තුළින් ශ්‍රම සංක්‍රමණයේ ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීම මෙහි අරමුණු විය. තවද, 2023 - 2027 වර්ෂ සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කිරීම ද සිදු විය.

ශ්‍රී ලංකා රජය, සභාපතිත්වය දරන නිපුණතා සහ සුදුසුකම් පිළිගැනීමේ ක්‍රියාවලීන් පිළිබඳ අටවන (8) තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම කොළඹ ක්‍රියාදාමයේ අනෙකුත් සාමාජික රටවලද සහභාගීත්වයෙන් මෙම වසර තුළ ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට තීරණය කරන ලදී.

- **අබුඩාබි සංවාදය**

අබුඩාබි සංවාදයේ හත්වන (7) අමාත්‍ය මණ්ඩල රැස්වීම 2024 පෙබරවාරි මස 10 හා 11 වන දිනයන් හිදී අබුඩාබි හිදී පැවැත්වීමට නියමිතය.

- **සුරක්ෂිත, ක්‍රමවත් හා විධිමත් විගමනය සඳහා ගෝලීය සම්මුතිය (GCM)**

පිලිපීන ජනරජයේ විගමනික සේවකයින්ගේ දෙපාර්තමේන්තුව, ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධානය (IOM), ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සහ එක්සත් ජාතීන්ගේ ජාලයේ සහයෝගය ඇතිව ආසියාවේ - ගල්ෆ් සහයෝගිතා කවුන්සිලයේ (GCC) ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සංවාදය තිරසර සංවර්ධන ඉලක්ක 10.7 සහ සුරක්ෂිත, ක්‍රමවත් හා විධිමත් විගමනය සඳහා ගෝලීය සම්මුතියේ 17 වන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා 2023 මැයි 30-31 දිනවල පිලිපීනයේ Taguig නගරයේදී පැවැත්විණි.

කොළඹ ක්‍රියාවලිය සහ අබුඩාබි සංවාදය ඇතුළු දැනට පවතින කලාපීය උපදේශන ක්‍රියාවලීන් පිළිබඳව ශ්‍රම සංචලනය ගොඩනැගීමේ පොදු අවශ්‍යතා පිළිබඳ ගැටලු සාකච්ඡා කිරීමට මෙම සංවාදය තුළදී අවස්ථාව හිමි වී තිබිණි.

- **ශ්‍රී ලාංකිකයින් සඳහා ආරක්ෂිත හා නිත්‍ය වූ ශ්‍රම සංක්‍රමණය - අදියර IV**

"ශ්‍රී ලාංකිකයින් සඳහා ආරක්ෂිත හා නිත්‍ය වූ ශ්‍රම සංක්‍රමණය" නැමැති ව්‍යාපෘතිය කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකාවේ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය හා එක්ව ස්විස් සංවර්ධන සහයෝගීතාවයේ මූල්‍ය ප්‍රදානය යටතේ ක්‍රියාත්මක කරන ලද අතර මේ වන විට එය හතරවන අදියරෙහි පසුවෙයි. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල යහපැවැත්ම ශක්තිමත් කිරීමයි. මෙම ව්‍යාපෘතියේ ජාතික පාර්ශවකරුවන් වශයෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) හා අයි.ඊ.එස්.සී.ආයතනය (IESC) ක්‍රියාත්මක වන අතර දිස්ත්‍රික්ක මට්ටමේ පාර්ශවකරුවන් ලෙස අනුරාධපුරය දිස්ත්‍රික්කය තුළ SAFE ආයතනය, පුත්තලම දිස්ත්‍රික්කය තුළ VOICE ආයතනය, වවුනියාව දිස්ත්‍රික්කය තුළ FIRM ආයතනය, මහනුවර දිස්ත්‍රික්කය තුළ SAMADANA ආයතනය සහ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ CHRCD ආයතනය කටයුතු කරයි. මෙම දිස්ත්‍රික්කවල 2023 සැප්තැම්බර් මස අවසන් වන තෙක් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 419කි.

### 2.6.3 විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය

- **විදේශ රැකියාවල නියුතුව සිට මෙරටට පැමිණි පුද්ගලයින් / ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සහ අදාළ ප්‍රජාවගේ ආර්ථිකය නඟා සිටුවීමේ ව්‍යාපෘතිය**

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රැකියා අහිමි වූ සහ විවිධ ගැටලුවලට මුහුණ දුන් විගමනික ශ්‍රමිකයින් සඳහා උපායමාර්ගික මැදිහත්කරණයක අවශ්‍යතාව හඳුනා ගනිමින් කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය විසින් විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධානය (IOM), ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සමඟ ඒකාබද්ධව විගමනික ශ්‍රමිකයින් සඳහා වන ජාතික කොවිඩ් 19 ප්‍රතිචාර සැලැස්මක් සකස් කරන ලදී. එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ වූ පාර්ශවකරුවන් වෙතින් අමාත්‍යාංශය සහාය අපේක්ෂා කරන ලදී.

ඒ අනුව, සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මැදිහත්වීමෙන් ජපන් රජයේ මූල්‍ය දායකත්වයෙන් 2023 වර්ෂයේ පොල් කටු අඟුරු හා පරිසර හිතකාමී මලු නිෂ්පාදනය සහ අලෙවිකරණ ව්‍යාපෘති 01ක් හා, මිරිස් ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් ව්‍යාපෘති 01ක් ක්‍රියාත්මක කරන ලදී. මේවන විට මෙම ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික්ක 09ක ව්‍යාපෘති 20 ක් අවසන් කොට ප්‍රජා අයිතියට පවරා දී ඇත.

- **ශ්‍රී ලංකාවේ විදේශ සහ දේශීය රැකියා වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ මාර්ගෝපදේශ සහ යොමු කිරීමේ පද්ධතියක් (IGRS) ඇති කිරීම**

මෙම අමාත්‍යාංශය විසින් අදාළ පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවයෙන් ජාත්‍යන්තර සංක්‍රමණ ආයතනයේ සහාය ඇතිව ශ්‍රී ලංකාවේ විදේශ සහ දේශීය රැකියා වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ මාර්ගෝපදේශ සහ යොමු කිරීමේ පද්ධතියක් (IGRS) ස්ථාපිත කරන ලදී. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මඟින් විදේශ රැකියා ක්ෂේත්‍රය මුහුණ දෙන ප්‍රධාන අභියෝගවලට විසඳුම් සෙවීමට සහ තිරසාර ලෙස රාජ්‍ය ප්‍රතිපත්ති අරමුණු සාක්ෂාත් කර ගැනීමට සුවිශේෂී අවස්ථාවක් සැලසේ.

මෙහි පළමු පියවර ලෙස, මෙම අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ පිහිටි ජාත්‍යන්තර සංක්‍රමණ ආයතනය (IOM Sri Lanka) ඇතුළු අනෙකුත් අදාළ ආයතනවල ප්‍රධානත්වයෙන් යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික උපදෙස් සහ මාර්ගෝපදේශ සැපයීම සඳහා ව්‍යාපෘති මෙහෙයුම්

කමිටුවක් (PSC) පිහිටුවන ලදී. ඒකාබද්ධ මාර්ගෝපදේශ සහ යොමු කිරීමේ පද්ධතිය (IGRS) නිල වශයෙන් දියත් කිරීම 2023 ජූලි 15 වැනි දින සාර්ථකව සිදු කරන ලදී.

- **පුහුණුකරුවන් පුහුණු කිරිමේ කටයුතු**

පුහුණුකරුවන් පුහුණු කිරිමේ ඒකකයේ ධාරිතා සංවර්ධනය සඳහා ස්විස් සංවර්ධන සහයෝගීතාවයේ මූල්‍ය ප්‍රදාන යටතේ හෙල්විටාස් ශ්‍රී ලංකා ආයතනයේ මෙහෙයවීමෙන් සිංහල හා දමිළ මාධ්‍යයෙන් පහත සඳහන් මාතෘකා යටතේ සකස් කරන ලද මාර්ගෝපදේශන 5ක් පිළිබඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

- මනෝ සමාජීය සහාය හා ප්‍රථමාධාර
- දුක්ගැනවිලි කළමනාකරණය
- මහජන සම්බන්ධතා හා පාරිභෝගික සත්කාරය
- සංවර්ධන සැලසුම් සකස් කිරිම
- රැකවරණ සැලසුම් සකස් කිරිම

එමෙන්ම, යාවත්කාලින කරන ලද පුහුණු මොඩියුලය පිළිබඳව සිංහල හා දමිළ මාධ්‍යයෙන් පුහුණු වැඩසටහන් දෙකක් සිදු කරන ලදී. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහයෙන් දත්ත විශ්ලේෂණය පිළිබඳ පුහුණු වැඩසටහනක් පුහුණුකරුවන් පුහුණු කිරිමේ ඒකකයේ තෝරා ගත් නිලධාරින් සඳහා ලබා දෙන ලදි.

සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ අනුග්‍රහයෙන් හෙල්විටාස් ශ්‍රී ලංකා ආයතනයේ පහසුකම් සැලසිම මඟින් නැවත සමාජගතකරණය පිළිබඳව පුහුණුකරුවන් පුහුණුකිරිමේ ඒකකය සඳහා සිංහල හා දමිළ මාධ්‍යයෙන් පුහුණු වැඩසටහන් ලබා දෙන ලදි.

මෙම පුහුණුකරුවන් පුහුණු කිරිමේ ඒකකයේ නිලධාරින්ගේ සම්පත්දායකත්වයෙන් සුරක්ෂිත සංක්‍රමණය, මනෝ සමාජීය සහාය, ළමා ආරක්ෂාව හා රැකවරණය, තැනැත්තන් වෙළඳාම හා මිනිස් ජාවාරම, සංවර්ධන සැලසුම් සකස් කිරිම, ළමා රැකවරණ සැලසුම් සකස් කිරිම, විගමනික ශ්‍රමිකයින් නැවත සමාජගතකරණය යන මාතෘකා ඔස්සේ දිවයින පුරා සිටින විදේශ රැකියා සංවර්ධන නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය සඳහා මෙන්ම ප්‍රජාව සවිබල ගැන්විම සඳහා 2023.09.30 වන විට පුහුණු වැඩසටහන් 486ක් සිදුකර ඇත.

## 2.7 විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ආරක්ෂා කිරීම, සුභසාධනය හා සවිබල ගැන්වීම


### 2.7.1 විදේශ රැකියා අංශය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

- **පවුල් පසුබිම් වාර්තා නිකුත් කිරීම**

විගමනික කාන්තාවන්ගේ බාල වයස්කාර දරුවන්ට ආරක්ෂාව සැලසීම අරමුණු කර ගනිමින් "රැකියා සඳහා විදේශගත වීමට බලාපොරොත්තු වන කාන්තාවන්ගේ බාල වයස්කාර දරුවන්ගේ රැකවරණ වැඩපිළිවෙල පිළිබඳ වාර්තා ලබාගැනීම" යටතේ අංක 02/2023 හා 2023.03.31 දාතමින් නව චක්‍රලේඛයක් නිකුත් කර ඇත. 2023.04.18 දිනැතිව නිකුත් කරන ලද අංක 02/2023 (1) චක්‍රලේඛය මඟින් එයට සංශෝධන ඇතුළත් කිරීම සිදු කර ඇත. ඒ අනුව 2023 වර්ෂයේ සැප්තැම්බර් 30 දින දක්වා පවුල් පසුබිම් වාර්තා 61,160 ක් නිර්දේශ කර ඇති අතර, එය 2023 පළමු කාර්තුවේදී වාර්තා 20,679 ක් ලෙසද දෙවන කාර්තුවේදී 18,037 ක් ලෙස ද , තුන්වන කාර්තුවේදී 22,444 ක් ලෙස ද වේ.

- **'ශ්‍රමික සුරැකුම' වැඩසටහන ක්‍රියාවට නැංවීම**


  විගමනික ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සහ සුභසාධනය ඉලක්ක කර ගනිමින් 2016 දී ආරම්භ කරන ලද මෙම වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් විගමනික ශ්‍රමික පවුල් ලියාපදිංචිය සිදුවේ. ලියාපදිංචි විගමනික ශ්‍රමික පවුල්වල ආර්ථික තත්ත්වය නගා සිටුවීම අරමුණු කරගෙන "පවුල් සංවර්ධන සැලසුම්" සහ විගමනික පවුල්වල සමාජයීය අවදානම් සහගත දරුවන් ඉලක්ක කර ගනිමින් "රැකවරණ සැලසුම්" සකස් කර ක්‍රියාත්මක කිරීම සිදු වේ. මේ යටතේ 2023 වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට ලියාපදිංචි වූ විගමනික ශ්‍රමික පවුල් සංඛ්‍යාව 30,819 කි.




**ප්‍රස්තාරය 2.1 -** ශ්‍රමික සුරැකුම යටතේ ලියාපදිංචිය

ශ්‍රමික සුරැකුම වැඩසටහන යටතේ ලියාපදිංචි විගමනික පවුල් ඉලක්ක කර ගනිමින් 2023 වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පවුල් සංවර්ධන සැලසුම් 3,642 ක් සහ රැකවරණ සැලසුම් 683ක් සකස් කර ඇත.

මෙයට අමතරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ක්‍රියාත්මක විගමනික පවුල්වල දරුවන් සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබාදීම, පාසල් උපකරණ ලබාදීම, නැවත පැමිණි ශ්‍රමිකයින් සඳහා ස්වයං රැකියා ණය ලබාදීම, ආබාධිත පුද්ගලයින් සඳහා ස්වයං රැකියා සහ නිවාස ණය ලබාදීම, වෘත්තීය පුහුණු වැඩසටහන් වෙත යොමු කිරීම හා වෛද්‍ය සායන පැවැත්වීම, යනාදි වැඩසටහන් වෙත යොමු කිරීම සංවර්ධන නිලධාරීන් විසින් සිදු කරයි.




**ප්‍රස්තාරය 2.2 -** සංවර්ධන නිලධාරීන් විසින් සකස් කරන ලද පවුල් සංවර්ධන සහ රැකවරණ සැලසුම්

- **දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

අමාත්‍යාංශයට අනියුක්ත සංවර්ධන නිලධාරින් විසින් විගමනික ප්‍රජාව ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන අතර 2023 වර්ෂයේ ජනවාරි 01 දින සිට සැප්තැම්බර් 30 දින වන විට පහත ක්ෂේත්‍ර ඔස්සේ දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් 6,698ක් පවත්වා ඇත.

- සුරක්ෂිත සංක්‍රමණය
- නැවත සමාජගත කිරීමේ වැඩසටහන
- ස්වයං රැකියා කුසලතා සංවර්ධනය සහ වෘත්තීය මාර්ගෝපදේශ
- ළමා ආරක්ෂාව
- මත්ද්‍රව්‍ය නිවාරණය
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය වැලැක්වීම සම්බන්ධ දැනුවත් බව ලබාදීම
- මිනිස් වෙළඳාමේ ගොදුරක් නොවීම පිළිබඳ දැනුවත් කිරීම්

- **විගමනික ශ්‍රමික සංගම් පිහිටුවීම**

විගමනික ශ්‍රමිකයින්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්, නැවත පැමිණි විගමනික ශ්‍රමිකයින් සහ විදේශ රැකියාගත වීමට අපේක්ෂිත පිරිස් එක්රැස් කරමින් ඔවුන් සමාජය තුළ සවිබල ගැන්වීම හා ඔවුන්ගේ දැනුම, කුසලතා, ආකල්ප වැඩිදියුණු කිරීම හරහා ක්‍රියාකාරි සාමාජිකයෙකු ලෙස සමාජගත කිරීම අරමුණු කරගනිමින් විගමනික ශ්‍රමික සංගම් පිහිටුවීම සංවර්ධන නිලධාරින්ගේ මැදිහත්වීම මත සිදු කිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව, මේ වනවිට දිවයින පුරා විගමනික ශ්‍රමික සංගම් 2,850 ක ප්‍රමාණයක් පිහිටුවා ඇත. එසේම ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමේ විගමනික ශ්‍රමික සංගම් පිහිටුවීම ද මේ වනවිට ආරම්භ කර ඇති අතර, කෑගල්ල දිස්ත්‍රික්කයට අදාළ දිස්ත්‍රික් විගමනික ශ්‍රමික සංගමය ද මේ වනවිට පිහිටුවා අවසන් කර ඇත.



**ඡායාරූපය 2 .3 -** විදේශ රැකියාවක නිරත වෙමින් සිටියදී අනතුරකට පත්ව ආබාධිත වූ ශ්‍රමිකයෙකුට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අනුග්‍රහයෙන් නව නිවසක් ලබා දීම

- **විදේශ රැකියා නිමකර මෙරටට පැමිණි පුද්ගලයින් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම**

මෙම වැඩසටහන යටතේ ස්වයං රැකියාවක හෝ වෙනත් ආදායම් උත්පාදන කටයුතුවලට යොමුවීමට අපේක්ෂිත පුද්ගලයින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් හඳුනා ගැනීම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනියුක්ත කර ඇති සංවර්ධන නිලධාරී (විදේශ රැකියා) විසින් සිදු කරන ලද අතර, ප්‍රතිලාභීන් 1,026කගේ තොරතුරු මෙම අමාත්‍යාංශයට ලැබී ඇත. එම තොරතුරුවලට අනුව උපකරණවල අවශ්‍යතාව පවතින ප්‍රතිලාභීන් 274ක ගේ තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත, එම ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ස්වයං රැකියා සඳහා උපකරණ ලබාදීමේ වැඩසටහනට සම්බන්ධ කර ගැනීම සඳහා යොමු කරන ලදී.

- **විගමනික ශ්‍රමික පවුල්වල පාසල් අධ්‍යාපනය අවසන් කර ඇති දරුවන් සඳහා කාර්මික හෝ වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා සහාය දැක්වීම**

විගමනික ශ්‍රමික පවුල්වල පාසල් අධ්‍යාපනය අවසන් කර, දේශීය/ විදේශීය රැකියාවකට යොමු වීමේ අපේක්ෂාවෙන් කාර්මික හෝ වෘත්තීය පුහුණුව ලබාගැනීමට බලාපොරොත්තු වන හා ඒ සඳහා ආර්ථික අපහසුතා පවතින දරුවන්ට සහාය දැක්වීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් දත්ත හා තොරතුරු එක් රැස් කරන ලදී.

ඒ අනුව මේ දක්වා දිස්ත්‍රික්ක 10කට (ගම්පහ, යාපනය, කිලිනොච්චිය, මඩකලපුව, කුරුණෑගල, පුත්තලම, පොළොන්නරුව, බදුල්ල, මොණරාගල සහ කෑගල්ල යන) අදාළව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 119කින් දරුවන් 956කට අදාළව තොරතුරු ලැබී ඇති අතර, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින වෘත්තීය පුහුණු ආයතන වෙත එම දරුවන් ද සම්බන්ධ කර ගන්නා මෙන් දන්වා එම තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත යොමු කර ඇත.

- **සංවර්ධන නිලධාරින්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය සඳහා වන ප්‍රගති සමාලෝචන හා විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම්**

විගමනික ප්‍රජාව වෙනුවෙන් සහ විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා මෙම අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනියුක්ත සංවර්ධන නිලධාරීන් විසින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ දී සිදුකරනු ලබන කාර්යභාරය අධීක්ෂණය සහ ප්‍රගතිය සමාලෝචනය වෙනුවෙන් ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමාගේ මඟ පෙන්වීම මත ගරු විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සහ අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පවත්වන විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම් මාලාව යටතේ 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 30 දින දක්වා මධ්‍යම, සබරගමුව, උතුරු මැද සහ නැගෙනහිර යන පළාත්වල රැස්වීම් පවත්වා ඇත. උතුර සහ දකුණු පළාත්වලට අදාළ රැස්වීම් 2023 වර්ෂයේ ඉදිරි කාලය තුළ සිදුකිරීමට සැලසුම් කර ඇත.

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනියුක්ත සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රගතිය අධීක්ෂණය සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ රැස්වීම් 13ක් විදේශ රැකියා අංශය විසින් පවත්වා ඇති අතර දිස්ත්‍රික් සංවර්ධන නිලධාරි විසින් කාර්තුමය වශයෙන් දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් 56ක් පවත්වා ඒ සඳහා රු. 238,720.00 ක් වැය කර ඇත.

- **විදේශ රැකියා ප්‍රවර්ධනය කිරීම සඳහා පළාත් සභාවල සහයෝගය ලබා ගැනීම**

විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා පළාත් මට්ටමින් සහයෝගය ලබාගැනීමට ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් 2023.01.30 දින අමාත්‍යාංශ පරිශ්‍රයේ දී පළාත් ආණ්ඩුකාරවරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් රැස්වීමක් පවත්වන ලදී.

මෙහිදී එක් එක් පළාත් සභාව සතු රැකියා පුහුණු විභවතාවයන් හඳුනා ගැනීමට හැකි වූ අතර ඒ තුළින් විදේශ රැකියා ප්‍රවර්ධනයෙහි වැඩි ඵලදායිතාවයක් අත් කර ගැනීමට හැකි විය.

මෙම සාකච්ඡාවට සමගාමීව හෝටල් හා ආගන්තුක සත්කාර සේවය, වෘත්තීය පුහුණු සහ කෘෂිකර්මය යන ක්ෂේත්‍ර 3ට අදාළව ගරු විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා පවත්වන ලද අතර මෙම ක්ෂේත්‍ර 3 ඔස්සේ විදේශ රැකියා ප්‍රවර්ධනය සිදු කළ හැකි බවත් ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව වැඩි දුරටත් සාකච්ඡා කරන ලදී. ඒ අනුව, ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ) මට්ටම් 05 සහ 06 සමත් කෘෂිකර්ම ඩිප්ලෝමාධාරීන් ජපන් විදේශ රැකියා සඳහා යොමු කිරීමත් සාත්තු සේවය සඳහා වැඩි ඉල්ලුමක් පවතින බැවින් ඒ සඳහා සුදුසුකම්ලත් පිරිසක් බිහිකර ගැනීම සඳහා සුදුසු පුහුණු වැඩසටහන් හා NVQ සහතික ලබාගැනීම සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලදී.

- මධ්‍යම පළාත් සභාව විසින් ලබා දී ඇති NVQ සහතිකලත් තරුණ තරුණියන් 31 දෙනෙකු සඳහා බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන සහභාගීත්වයෙන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර විදේශ රැකියා සඳහා තෝරා ගන්නා ලදී
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෘත්තීය හා පුහුණු මධ්‍යස්ථානය මඟින් ලබා දුන් 'කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳව උසස් ජාතික ඩිප්ලෝමාව' සහ 'ජාතික ඩිප්ලෝමාව' සමත් 1,147 ක් වූ ඩිප්ලෝමාධාරීන්ගේ නාමලේඛනය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත යොමු කරන ලදී. මෙම ලැයිස්තුව අනුව වරින් වර සම්මුඛ පරීක්ෂණ පවත්වා ඉදිරි කටයුතු කිරීමට සැලසුම් කර ඇත
- මතුවන අවශ්‍යතාව අනුව ආගන්තුක සත්කාර සේවා ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය පුහුණු ශ්‍රමිකයින් පුහුණු කිරීම සඳහා බදුල්ල සහ ගාල්ල පුහුණු මධ්‍යස්ථානවල ඉඩ පහසුකම් ලබාදීම සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට නියමිතය
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙහි (TVEC) පුහුණු මධ්‍යස්ථානවල පුහුණුව ලත් පුහුණුලාභීන්ගේ යාවත්කාලීන තොරතුරු ලබාගැනීම සඳහා කාර්යාංශයේ තොරතුරු තාක්ෂණ අංශය අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටියි. මෙමඟින්, බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා වෘත්තීය පුහුණුවලත් පුහුණුලාභීන්ගේ යාවත්කාලීන තොරතුරු ලබා ගැනීමට හැකි වේ.



**ඡායාරූපය 2.4 -** රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම

- රැකියා පොළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

වගුව **2.1** රැකියා පොළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

| | පළාත | වැඩසටහන පැවැත්වූ දිනය | වැඩසටහන සහ ස්ථානය |
|---|---|---|---|
| 01 | බස්නාහිර | 2023.06.06 | "Light to Gloom" Career Fair 2023<br>බත්තරමුල්ල දියත උයන පරිශ්‍රය |
| 02 | වයඹ | 2023.03.31 | "යNG" රැකියා පොළ වැඩසටහන ඇතුගල පාමුල වයඹ පළාත් සභා පරිශ්‍රය |
| 03 | ඌව | 2023.03.31 – 2023.04.02 | "Boom UVA Career Fair 2023"<br>බදුල්ල සේනානායක ක්‍රීඩා පිටිය |
| | | 2023.04.28 | "Boom² UVA Career Fair 2023"<br>ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩල ශ්‍රවණාගාරය |

- විදේශ රැකියා අංශයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා විදේශ රැකියා අංශයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා දේශීය පුහුණු වැඩසටහන් දෙකක් 2023 ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා කාලසීමාව තුල සිදු කර ඇත. ඒ අනුව, සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන් 34 දෙනෙකු සඳහා දෙමළ භාෂා පාඨමාලාවක් පවත්වා අවසන් කරන ලද අතර, මූලික කාර්යාල ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන් 52ක් සම්බන්ධ කරගනිමින් පවත්වන ලද අතර මේ සඳහා රු.142,190.00 මුදලක් වැය කර ඇත.

### 2.7.2 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

විගමනික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආරක්ෂා කිරීම හා සවි බලගැන්වීම සඳහා විදේශ රැකියා ක්‍රියාවලියේ අදියර තුනේදීම එනම්; පූර්ව විගමන අවධිය (තීරණ ගැනීම, පෙර විගමනික පුහුණුව ලැබීම සහ පිටත්ව යාම ඇතුළුව), සේවයේ යෙදෙන අවධිය (රැකියාවල නියුතු සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආවරණයවන පරිදි) සහ ආපසු පැමිණීමේ හා නැවත සමාජගතවීමේ අවධිය (සමාජගත කිරීම, පිළිගැනීම සහ අගය කිරීම සැලකිල්ල යන කරුණු ඇතුලත්ව) යන අදියරවල දී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සිය කාර්යභාරය ඉටු කරයි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සිය මෙහෙයුම් ක්‍රියාවලිය තුළින් මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.




ඡායාරූපය **2.5** - විගමනික ශ්‍රමිකයන්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය

- **සුහසාධන ක්‍රියාකාරකම්**

වගුව **2.2** විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් ක්‍රියාත්මක කළ සුහසාධන වැඩසටහන් - ශ්‍රී. ලං. වි. සේ. නි. කා.

| | **විස්තරය** | | **සංඛ්‍යාව** | **මුදල (රු. මිලි.)** |
|---|---|---|---|---|
| 01 | විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් රක්ෂණ වාරික ගෙවීම | | 139,160 | 323.819 |
| 02 | විගමනික ශ්‍රමිකයන් සඳහා රක්ෂණ වන්දි ගෙවීම් (නැවත ගෙන්වා ගැනීම්, වෛද්‍ය වියදම්, මරණ වන්දි සඳහා වන වියදම් ඇතුළත්ව) | | 560 | 89.512 |
| 03 | මැදපෙරදිග කලාපයේ ගෘහස්ථ අංශයේ රැකියාවල නියුතු කාන්තා ශ්‍රමිකයින් සඳහා සේවායෝජක රක්ෂණාවරණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම (2023 වර්ෂයේ ජූලි මස සිට මෙම රක්ෂණ වන්දි ක්‍රමය ක්‍රියාත්මක කර ඇත) | විදේශ සේවායෝජක රක්ෂණාවරණයෙන් ආවරණය ලබා ඇති සේවක සංඛ්‍යාව | 20,123 | |
| | | රක්ෂණ හිමිකම් සඳහා ඉල්ලුම් කළ සේවක සංඛ්‍යාව | 18 | |
| | | ගෙවන ලද රක්ෂණ හිමිකම් සංඛ්‍යාව මුදල | 8 | 0.737 |
| 04 | උපකාර අවැසි විගමනික ශ්‍රමිකයන් වෙත ආහාර පාන, ප්‍රවාහන පහසුකම්, නවාතැන් හා වෛද්‍ය ප්‍රතිකාර සැපයීම | | | 4,745 |
| 05 | විවිධ අපහසුතාවයන්ට පත් වූ විගමනික ශ්‍රමිකයින් විදේශ දූත මණ්ඩලවල මැදිහත්වීම මත නැවත මෙරටට ගෙන්වා ගැනීම | • සේවක සුබසාධක අරමුදල මගින්<br>• රක්ෂණාවරණය මගින්<br>• වෙනත් මූලාශ්‍ර මගින් (රාජ්‍ය නොවන සංවිධාන) | 14<br>93<br>1,103 | 3.3 |
| 06 | සේවක සුබසාධක අරමුදල යටතේ සහන සැලසීම | | 1,123 | 95.01 |
| 07 | ස්වයං රැකියා ආරම්භ කිරීමට / වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රමිකයන් වෙත අවශ්‍ය උපකරණ / ද්‍රව්‍ය ලබා දීම | | 47 | 2.321 |
| 08 | විගමනික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට වෛද්‍ය ප්‍රතිකාර සඳහා සහය දීම | | 16 | 1.086 |
| 09 | විගමනික ශ්‍රමිකයන්ගේ දූ දරුවන් සඳහා පාසල් උපකරණ බෙදා දීම | | 939 | 8.861 |
| 10 | විගමනික ශ්‍රමිකයන්ගේ අවශ්‍යතා ඇති දූ දරුවන් සඳහා අවශ්‍ය සහය ලබා දීම | | 3 | 0.675 |
| 11 | විදේශයන්හිදී මියගිය විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් සහන ලබාදීම | මෘතදේහ ගෙන්වීම සඳහා සේවක සුබසාධක අරමුදල හරහා සහාය වීම | 4 | 1.73 |
| | | අවමංගල්‍ය කටයුතු සඳහා වියදම් දැරීම | 175 | 7.0 |
| 12 | විගමනික ශ්‍රමිකයින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම (2022 සැප්තැම්බර් 22 වන දින මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය ආරම්භ කර ඇත) | විශ්‍රාම වැටුප් දායකත්වය ලබා ගැනීම සඳහා අයදුම්කර ඇති විගමනික ශ්‍රමිකයින් ගණන | 18,320 | |
| | | විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා සුදුසුකම් ලබා ඇති විගමනික ශ්‍රමිකයින් ගණන | 21 | |

- **විගමනික ශ්‍රමිකයන්ගේ දූදරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම**

වගුව **2.3** - විගමනික ශ්‍රමිකයන්ගේ දූදරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම - ශ්‍රී. ලං. වි. සේ. නි. කා.

| | **විස්තරය** | **ප්‍රතිලාභ ලැබූ සිසුන් සංඛ්‍යාව** | **වියදම (රු. මි.)** |
|---|---|---|---|
| 01 | 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය සමත් සිසුන් | 305 | 6.1 |
| 02 | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත් සිසුන් | 719 | 17.975 |
| 03 | අ.පො.ස. (උසස් පෙළ) සමත් සිසුන් | 278 | 9.73 |
| | **එකතුව** | **1,302** | **33.805** |

- **විගමනික ශ්‍රමිකයන්ගේ හැකියාවන් හා කුසලතා වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් හා අනෙකුත් ආශ්‍රිත පුහුණු**

වගුව **2.4** - පුහුණු වැඩසටහන් පැවැත්වීම - ශ්‍රී. ලං. වි. සේ. නි. කා.

| | වැඩසටහන | පැවැත් වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ගෘහස්ථ අංශයේ ගෘහපාලක සහායක පුහුණුව - මැද පෙරදිග (ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම III) | 229 | 5,663 |
| 02 | ගෘහස්ථ අංශයේ ගෘහපාලක සහායක- නැගෙනහිර ආසියාතික සහ යුරෝපා රටවල් සඳහා (ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම III) | 31 | 795 |
| 03 | සාත්තු සේවක පුහුණුව (ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම III) | 55 | 1,916 |
| 04 | පළපුරුදු ගෘහස්ථ ගෘහ පාලන සහකාරවරියන් සඳහා ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන | 35 | 533 |
| 05 | ගෘහස්ථ නොවන රැකියා සඳහා පිටත්ව යන ශ්‍රමිකයින් සඳහා වූ පුහුණුව | 1,492 | 41,283 |
| 06 | පෙර විගමනික පුහුණුව - දකුණු කොරියාව | 51 | 1,919 |
| 07 | පෙර විගමනික පුහුණු පාඨමාලාව - ජපන් තාක්ෂණික සේවාස්ථ පුහුණු පාඨමාලාව (TITP) | 15 | 115 |
| 08 | විශේෂ භාෂා පුහුණුව (ජපන්) | 19 | 453 |
| 09 | විශේෂ භාෂා පුහුණුව ( ඉංග්‍රීසි) | 17 | 504 |

- **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන්**

I. යාපනය දිස්ත්‍රික්කයේ පැවති “GLOCAL – 2023” ජංගම සේවා වැඩසටහනේ දී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සක්‍රීය දායකත්වය ලබා දෙමින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

  - විදේශ රැකියා නියුක්තිය සඳහා ශ්‍රී ලාංකිකයින් වැඩි වශයෙන් යොමු කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන වල සහභාගිත්වයෙන් යුතුව උතුරු පළාත මූලික කරගනිමින් විදේශ රැකියා පොළ වැඩසටහනක් පැවැත්වීම

- කාර්යාංශයේ ලියාපදිංචි උතුරු පළාතේ පදිංචි විගමනික ශ්‍රමිකයින්ගේ දූදරුවන් වෙත අධ්‍යාපනික ශිෂ්‍යත්ව හා පාසල් උපකරණ ප්‍රදානය කිරීම
- උතුරු පළාතේ දූදරුවන්ගේ සෞන්දර්යාත්මක හැකියාවන් ඔප් නැංවීම සඳහා චිත්‍ර, නැටුම් හා සංගීත තරඟ පැවැත්වීම
- නීත්‍යානුකූල හා සුරක්ෂිත අයුරින් විදේශ රැකියා සඳහා යොමුවිය හැකි ආකාරය පිළිබඳව විදේශ රැකියා අපේක්ෂකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියා සඳහා විදේශගතවසිට නැවත මෙරටට පැමිණි විගමනික ශ්‍රමිකයින් හට ස්වයං රැකියා ආරම්භ කිරීමට/වැඩිදියුණු කිරීමට මූල්‍යමය ආධාර ලබාදීම

II. පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභා නිර්දේශය පරිදි තැනැත්තන් වෙළෙඳාමට එරෙහි ජාතික කාර්යය සාධක බලකායේ (NAHTTF) මූලිකත්වයෙන් කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල තුළ ආරක්ෂිත සංක්‍රමණ ප්‍රවර්ධන ඒකකයක් (Safe Migration Promotion Unit – SMPU) පිහිටුවීමට කාර්යාංශය අනුග්‍රහය ලබා දෙන ලදී.

III. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් ක්‍රියාත්මක කරන තාක්ෂණික සේවාස්ථ පුහුණු වැඩසටහන (TITP- IM Japan) යටතේ විදේශගත කරනු ලබන සීමාවාසික පුහුණුලාභීන් නියමිත පුහුණු කාලසීමාව අවසන් කර ශ්‍රී ලංකාවට පැමිණීමේදී ඔවුන් සේවය කළ ජපාන සමාගම විසින් එක් අයෙකුට වසරකට ජපන් යෙන් ලක්ෂ 2 බැගින් දීමනාවක් පිරිනමනු ලැබේ. මෙම සීමාවාසික පුහුණුව වසර 3ක් හෝ 5කට සීමාවේ.
ඒ අනුව, 2023.01.01 සිට 2023.09.30 දක්වා පුහුණුලාභීන් හතලිස් දෙදෙනෙකු (42) වෙනුවෙන් රු. 65,975,556.03ක මුදලක් ප්‍රදානය කර ඇත.



**ඡායාරූපය 2.6 -** සෞදි අරාබි මහකොමසාරිස් සමඟ හමුව

## 2.8 ආර්ථික සංවර්ධනය සඳහා කාර්මික සාමය සුරක්ෂිත කිරීම

අන්තර්ජාතිකව තරඟකාරී ආර්ථිකයක් සඳහා කල්පවත්නා කාර්මික සාමයක් සහිත රටක් නිර්මාණය කිරීම සඳහා දායකත්වය සැපයීම **කම්කරු දෙපාර්තමේන්තුවෙහි** දැක්ම වන හෙයින් කාර්මික සාමය පවත්වා ගැනීම කම්කරු දෙපාර්තමේන්තුවේ මූලික හා අත්‍යවශ්‍ය කාර්යය වේ.

මේ සඳහා සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කතිකාවක් පවත්වාගෙන යාම, ඒකාබද්ධ ශ්‍රමික පරීක්ෂණ සිදු කිරීම, ව්‍යවස්ථාපිත හිමිකම් අහිමිවීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම, ශ්‍රමිකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම යන ප්‍රධාන කාර්යයන් හතර යටතේ කම්කරු දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ.

### 2.8.1 සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කතිකාවතක් පවත්වා ගැනීම


පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවල සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කාර්මික සාමය තහවුරු කෙරෙන වැඩ පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා එම අංශයේ ආයතනවල සේව්‍ය සේවක දෙපාර්ශවයම කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් මෙන්ම රාජකාරි කටයුතු සිදු කිරීමේදී කම්කරු නීති පිළිබඳව දැනුවත්භාවයක් ලැබිය යුතු අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්ද කම්කරු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කොට පවත්වන ලදී.

වගුව **2.5** කම්කරු දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

| | වැඩසටහනෙහි ස්වභාවය | වැඩසටහනෙහි නම | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව / ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | **සමාජ කතිකාව ප්‍රවර්ධනය** | මානව සම්පත් සංවර්ධන අංශය විසින් පැවැත්වූ සමාජ කතිකා ප්‍රවර්ධන වැඩසටහන් | 271 | 17,410 |
| | | දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල විසින් පැවැත්වූ සමාජ කතිකා ප්‍රවර්ධන වැඩසටහන් | 112 | 3,611 |
| | | දිස්ත්‍රික් උපදේශන සභා වැඩසටහන් | 55 | 1,346 |
| | | කලාප සමාජ වේදිකා වැඩසටහන් (Zoom තාක්ෂණය මගින්) | 32 | මාර්ගගත ක්‍රමයට |
| 02 | **වෘත්තීය සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය** | වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳව පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන් | 102 | 3,349 |
| 03 | **වෘත්තීය සෞඛ්‍යය ප්‍රවර්ධනය** | සේව්‍යයන් සහ සේවකයන් සඳහා වූ මාර්ගගත පුහුණු වැඩසටහන් | 65 | 1,982 |
| | | සේව්‍යයන් සහ සේවකයන් සඳහා (field training) පුහුණු වැඩසටහන් | 375 | 2,747 |
| 04 | **ස්ත්‍රීන් සහ තරුණ අයගේ සේවයේ නියුක්ත කරවීමේ අයිවාසිකම් ආරක්ෂා කිරීම සහ ළමා ශ්‍රමය පිටු දැකීම** | පෞද්ගලික අංශයේ සේවිකාවන් සඳහා කාන්තාවන් හා ළමයින් සම්බන්ධ කම්කරු නීති පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් | 28 | 840 |
| | | ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ළමා ශ්‍රමයෙන් තොර කලාප පිහිටුවීම යටත් 2023 වර්ෂයේදී සිදු සිදු කරනු ලැබූ දැනුවත් කිරීමේ වැඩසටහන් | 09 | 1,350 |
| | **එකතුව** | | **1,049** | **32,635** |

### 2.8.2 කම්කරු පරීක්ෂණ සිදු කිරීම

සේවායෝජකයන් විසින් සේවකයන් සේවයේ නියුක්ත කරවීමේ නීති නිසි පරිදි අනුගමනය කරනු ලැබේද යන්න පරීක්ෂාවට ලක් කර, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සේව්‍ය සේවක දෙපාර්ශවය අතර ගැටළු ඇති වීම අවම කර සම්බන්ධතාවය වර්ධනය කිරීම උදෙසා 2023.01.01 සිට 2023.09.30 දක්වා සිදු කරනු ලැබූ පරීක්ෂණ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.





රූපසටහන **2.2 -** කම්කරු පරීක්ෂණ සිදු කිරීම - කම්කරු දෙපා.

සමාජ කතිකාව ප්‍රවර්ධනය උදෙසා ආයතන මට්ටමින් වැඩසටහන් පැවැත්වීම යටතේ 2023 වර්ෂයේ පළමු කාර්තු තුන තුළ දී, ආයතන 08ක පැවති සේව්‍ය හා සේවක දෙපාර්ශවය අතර ආකල්පමය දුර්වලතා, කාර්මික ආරවුලක් දක්වා වර්ධනය විය හැකි තත්ත්වයන් මෙන්ම ඇතිවිය හැකිව තිබූ වැඩ වර්ජන වළක්වා ගැනීමට හැකි වී ඇත. ඒ අනුව, දළ වශයෙන් අහිමි වීමට අවස්ථාව තිබූ මිනිස් දින 1,325ක් නිෂ්පාදන ක්‍රියාවලියට නැවත දායක කරගැනීම තුළින් ජාතික ආර්ථික වර්ධනයට දායක කරවීමට හැකි වී ඇත.

### 2.8.3 ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම


කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය වෙත සහ දිස්ත්‍රික් හා උප කාර්යාල වෙත සේවකයන් හෝ වෘත්තීය සමිති විසින් සිදු කරනු ලැබූ ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳව සහ කාර්මික ආරාවුල් සම්බන්ධයෙන් ලැබූ පැමිණිලි විසඳීමට කටයුතු කරන ලදී. එසේම, සිදු කරනු ලැබූ පැමිණිලි විමර්ශනයක් හෝ ආයතන පරීක්ෂණයක් සම්බන්ධයෙන් සෑහීමට පත් නොවන අයකු විසින් විධිමත් පරීක්ෂණයක් සිදු කරවා ගනු පිණිස කම්කරු කොමසාරිස් ජනරාල් වෙත සිදු කරනු ලබන ඉල්ලීම් අවශ්‍යතාව පරිදි නැවත විමර්ශනය කිරීමද සිදු කරන ලදී.

**2019 වර්ෂයේ සිට 2023.06.30 දක්වා ව්‍යවස්ථාපිත හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම්**




**ප්‍රස්තාරය 2.3** - 2019 වර්ෂයේ සිට 2023.06.30 දක්වා ව්‍යවස්ථාපිත හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් - කම්කරු දෙපා.

**2019 වර්ෂයේ සිට 2023.06.30 දක්වා කාර්මික ආරවුල් පිළිබඳ පැමිණිලි ලැබීම් හා නිරවුල් කිරීම**




**ප්‍රස්තාරය 2.4** - 2019 වර්ෂයේ සිට 2023.06.30 දක්වා කාර්මික ආරවුල් පිළිබඳ පැමිණිලි ලැබීම් හා නිරවුල් කිරීම - කම්කරු දෙපා.

### 2.8.4 වැඩ වර්ජන විසඳීම සඳහා අදාළ මැදිහත්වීම් සිදු කිරීම

කාර්මික ආරවුලක් වැඩ වර්ජනයක් දක්වා වර්ධනය විය හැකි තත්ත්වයන් නිරීක්ෂණය වූ වහාම කම්කරු දෙපාර්තමේන්තුව විසින් එම තත්ත්වය පාලනය කිරීමට කටයුතු කරනු ලබන අතර, වැඩ වර්ජනයක් ඇති වුවහොත් ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදු කර විසඳීමට කටයුතු කරනු ලැබේ. 2023.01.01 සිට 2023.09.30 දක්වා වාර්තා වූ වැඩ වර්ජන පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වගුව **2.6** - වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත -කම්කරු. දෙපා.

| | ක්ෂේත්‍රය | වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාව | සහභාගී වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස්දින සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | වතු | 04 | 842 | 1797 |
| 02 | ඉදි කිරීම් | - | - | - |
| 03 | නිෂ්පාදන | 02 | 101 | 4662 |
| 04 | පතල් හා කැණීම් | - | - | - |
| 05 | නවාතැන් හා ආහාර සැපයුම් | - | - | - |
| 06 | අර්ධ රාජ්‍ය | - | - | - |
| 07 | වෙනත් සේවා | 01 | 70 | 70 |
| | **එකතුව** | **07** | **1013** | **2329** |

### 2.8.5 සාමූහික ගිවිසුම් සඳහා සේව්‍ය හා සේවක දෙපාර්ශවය පෙළඹවීම

සාමූහික ගිවිසුම්වලට එළඹීම මගින් සේවකයන් වෙත කම්කරු නීතිරීති වලින් හිමිකර දී ඇති අයිතිවාසිකම් වලට වඩා වැඩි වරප්‍රසාද හිමි වනවා මෙන්ම සේවායෝජක පාර්ශවයන්ට සේවකයන් වෙතින් වඩා ඵලදායී සේවාවක් ලබා ගැනීම සඳහා අදාළ කොන්දේසි වෙත එළඹීමට හැකියාව ලැබේ.

සමාජ කතිකාව මගින් සේව්‍ය හා සේවක පාර්ශවයන් එවැනි ආකාරයේ සාමූහික ගිවිසුම් වෙත එළඹීම ප්‍රවර්ධනය කරනු ලැබේ. 2023.01.01 සිට 2023.09.30 දක්වා ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ සාමූහික ගිවිසුම් 26ක්ද ඇතුළුව 2023.09.30 දිනට ක්‍රියාත්මකව පවතින සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 220කි.

### 2.8.6 බේරුම්කරණ කටයුතු සිදු කිරීම

ප්‍රාදේශීය කාර්යාල මඟින් හෝ ප්‍රධාන කාර්යාලයේ කාර්මික සම්බන්ධතා අංශය මඟින් කටයුතු කළ ද නිරවුල් කළ නොහැකි වූ කාර්මික ආරවුල්, අනිවාර්ය බේරුම්කරණය වෙත හෝ කාර්මික අධිකරණය වෙත යොමු කිරීම සිදු කරනු ලැබේ. 2023.01.01 සිට 2023.09.30 දක්වා කාල සීමාව තුළදී බේරුම්කරණය සඳහා යොමු කරනු ලැබූ ආරවුල් 51 ද ඇතුලත්ව ආරවුල් 228 ක් සම්බන්ධයෙන් 2023 වර්ෂය තුළදී කටයුතු කිරීමට නියමිතව තිබුණි. ඒ අතුරින් ආරවුල් 127ක් පරීක්ෂණ කටයුතු 2023 වර්ෂයේ පළමු කාර්තු තුන තුළදී අවසන් කර ප්‍රදාන 93ක් ලබා දී ඇති අතර ප්‍රදාන 36ක් ඉදිරියේදී ලබා දීමට ඇත. ඒ අනුව, 2023.09.30 දින වන විට ආරවුල් 101ක් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පැවතිණි.

### 2.8.7 වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම


සෑම වෘත්තීය සමිතියක්ම කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කිරීම වෘත්තීය සමිති ආඥා පනත යටතේ අනිවාර්ය වේ. ඒ අනුව, 2023.01.01 සිට 2023.09.30

දක්වා දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කරනු ලැබූ වෘත්තීය සමිති / සම්මේලන සංඛ්‍යාව 87කි. 2023.09.30 දිනට වලංගු මුළු වෘත්තීය සමිති සංඛ්‍යාව 2,088 කි. 2023 වර්ෂය තුළදී වෘත්තීය සමිති 52ක් අවලංගු කර ඇත.

## 2.9 ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම


පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ වැටුප් හා සේවා කොන්දේසි යාවත්කාලීන කිරීම සහ සුරක්ෂිත කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරයක් වේ. ඒ අනුව, 2023.01.01 දින සිට 2023.09.30 දින දක්වා එම විෂය ක්ෂේත්‍රයට අදාළව පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

### 2.9.1 දින 05 වැඩ සතිය සඳහා අනුමැතිය ලබා දීම





රූපසටහන **2.3 -** දින 05 වැඩ සතිය සඳහා අනුමැතිය ලබා දීම - කම්කරු.දෙපා.

### 2.9.2 සාමූහික ගිවිසුම්වල නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම්





රූපසටහන **2.4** - සාමූහික ගිවිසුම්වල නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම්

### 2.9.3 පඩි පාලක සභා අඥාපනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම




රූපසටහන **2.5** - පඩි පාලක සභා අඥාපනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම - කම්. දෙපා.

### 2.9.4 අණ පනත් සම්බන්ධයෙන් සේවා හා සේවක පාර්ශව විසින් සිදු කරනු ලබන විමසීම් සඳහා පැහැදිලි කිරීම් හා අර්ථ නිරූපණ ලබා දීම




රූපසටහන 2. 6 - අණ පනත් සම්බන්ධයෙන් සේවා හා සේවක පාර්ශව විසින් සිදු කරනු ලබන විමසීම් සඳහා පැහැදිලි කිරීම් හා අර්ථ නිරූපණ ලබා දීම

## 2.10 සේවකයාගේ වෘත්තීය සුරක්ෂිතතාවය සඳහා වූ සුනිසි වැඩ පරිසරය තහවුරු කිරීම

කර්මාන්තශාලා තුළ සේවයෙහි යෙදෙන ශ්‍රමිකයන් හට භෞතිකමය වශයෙන් යම් ශාරීරික හානි සිදුවීම සහ අනතුරු ඇති වීම අවම කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ වගකීමක් වේ. ශ්‍රී ලංකාවේ කර්මාන්තශාලාවල සේවය කරන සේවකයන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා සුභසාධනය සම්බන්ධයෙන් 1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනත යටතේ කටයුතු කරනු ලැබේ.

- **අනතුරු රහිත වැඩ පරිසරය තහවුරුකිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන වශයෙන් පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.**

<table>
<tr><th colspan="2">2023.01.01 සිට 2023.09.30 දක්වා කාලය තුළ දී ඉටු කරනු ලැබූ ක්‍රියාකාරකම්</th></tr>
<tr><td></td><td>කර්මාන්තශාලා ආඥාපනතේ නව රෙගුලාසි යටතේ 2023.01.01 දින සිට 2023.09.30 දින දක්වා ලියාපදිංචි කරන ලද කර්මාන්තශාලා සංඛ්‍යාව = 955</td></tr>
<tr><td><br></td><td>පරීක්ෂා කර අනුමත කරන ලද ගොඩනැගිලි පිඹුරුපත් සංඛ්‍යාව<br>=213</td></tr>
<tr><td></td><td>පරීක්ෂා කරන ලද කර්මාන්තශාලා සංඛ්‍යාව පිළිබඳ තොරතුරු
<table>
<tr><th>කර්මාන්තයේ ස්වභාවය</th><th>පරීක්ෂා කරන ලද කර්මාන්තශාලා සංඛ්‍යාව</th></tr>
<tr><td>බලශක්ති භාවිතා කරන</td><td>2,213</td></tr>
<tr><td>බලශක්ති භාවිතා නොකරන</td><td>23</td></tr>
<tr><td>ඉදිකිරීම් වැඩබිම්</td><td>10</td></tr>
<tr><td>වෙනත්</td><td>98</td></tr>
<tr><td>එකතුව</td><td>2,344</td></tr>
</table></td></tr>
</table>

<table>
<tr><td></td><td>වාර්තා වී ඇති මරණීය අනතුරු සංඛ්‍යාව = 46<br><br>වාර්තා වී ඇති මරණීය නොවන අනතුරු සංඛ්‍යාව = 1,063</td></tr>
<tr><td></td><td>බලයලත් බාහිර නිලධාරීන් විසින් පරීක්ෂා කර ඉදිරිපත් කරනු ලැබූ අධි අන්තරායදායී යන්ත්‍ර පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව = 9,610</td></tr>
</table>

රූපසටහන **2.7 -** අනතුරු රහිත වැඩ පරිසරය තහවුරු කිරීමේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය - කම්.දෙ.

- **සේවක සුරක්ෂිතතාව ඉහළ නැංවීම සඳහා විධිමත් සුරක්ෂිතතා කමිටු පිහිටුවීම**

කර්මාන්තශාලා තුළ සුරක්ෂිතතාව සම්බන්ධයෙන් ස්වයං විගණනයක් සිදු වීම සහ සුරක්ෂිතතා සංස්කෘතියකට මඟ පෑදීම සුරක්ෂිතතා කමිටු පිහිටුවීමේ ප්‍රධාන අරමුණු වේ. ඒ අනුව, සියලුම කර්මාන්ත ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි 2023.01.01 දින සිට 2023.09.30 දින දක්වා කාල සීමාව තුළ දී සුරක්ෂිතතා කමිටු 288 ක් පිහිටුවා ඇත.

## 2.11 සේවකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම්

සේවා ස්ථානයන්හි සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සේවා ස්ථානවල සෞඛ්‍ය ගැටලු හෝ අනතුරු සිදුවීමට හැකි අවස්ථා තිබේද යන්න සම්බන්ධයෙන් විද්‍යාත්මක ක්‍රමවේදයන් යටතේ සොයාබැලීම සහ එම අනතුරු වැළැක්වීම සඳහා පියවර ගැනීම හා වලක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීමට කම්කරු දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලැබේ. ඒ අනුව, 2023.01.01 දින සිට 2023.09.30 දින දක්වා පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

<table>
<tr><td rowspan="3"></td><td>පාරිසරික මිනුම් සංඛ්‍යාව = 293</td></tr>
<tr><td>ජෛව විද්‍යාත්මක පරීක්ෂණ සංඛ්‍යාව = 1620</td></tr>
<tr><td>වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් සංඛ්‍යාව = 372</td></tr>
</table>

රූපසටහන **2.8** - සෞඛ්‍ය හා සුරක්ෂිතතාව සම්බන්ධ පරීක්ෂණ - කම්. දෙ.

ආයතන 08ක ඇති වූ වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් වන ගැටලුකාරී තත්ත්වයන් සඳහා අවශ්‍ය මැදිහත් වීම් සිදු කර එම තත්ත්වයන් විසඳීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී. එමගින්, සේවකයන් 2,287කගේ වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය සුරක්ෂිත කරන ලදී.

එසේම, පානළුව හෝමාගම හා රත්මලාන කාර්මික ජනපදයන්හි වෘත්තීය ස්වස්ථතාවය දියුණු කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. එම ව්‍යාපෘතිය යටතේ පානළුව, හෝමාගම හා රත්මලාන කාර්මික ජනපදයන්හි කර්මාන්තශාලාවන්හි මූලික සංගණනයක් සිදු කරන ලදී. 2023.09.30 දින වන විට පානළුව හා රත්මලාන කාර්මික ජනපදයන්හි සියලුම කර්මාන්තශාලාවල හා හෝමාගම කාර්මික ජනපදයේ කර්මාන්ත ශාලා 75% ක් පමණ ප්‍රමාණයක පාරිසරික මිනුම් හා සෞඛ්‍ය විගණනයන් සිදු කර වෘත්තීය ස්වස්ථතාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

## 2.12 සේවයේ යෙදෙන ස්ත්‍රීන් සහ තරුණ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම

කාන්තාවන් සේවයේ නියුක්ත කරවීමේදී ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා වන පරිදි කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම, එම නීති කාලීනව සමාලෝචනය කරමින් අවශ්‍ය සංශෝධනයන් නිර්දේශ කිරීම මඟින් ඵලදායී කාන්තා ශ්‍රම දායකත්වයක් රටට ලබාදීම මෙන්ම ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා කටයුතු කිරීම කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව, 2023.01.01 දින සිට 2023.09.30 දින දක්වා පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

### 2.12.1 ළමා ශ්‍රමය පිළිබඳව ලද පැමිණිලි සඳහා පරීක්ෂණ සිදු කිරීම

2023.01.01 දිනට ශේෂය = 70 + පැමිණිලි ලැබීම = 69 − විසඳීම = 63 = 2023.09.30 දිනට ශේෂය = 76



ළමා ශ්‍රමයක් ඇති බවට අනාවරණය වූ පැමිණිලි 12ක් අතුරින් 06 ක් සම්බන්ධයෙන් නඩු පැවරීම සිදු කරන ලද අතර ඉතිරි පැමිණිලි 06 සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී.


රූපසටහන 2.9 - ළමා ශ්‍රමය පිළිබඳව ලද පැමිණිලි සඳහා පරීක්ෂණ සිදු කිරීම - කම්. දෙපා.

### 2.12.2 කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ සේවා කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි පිළිබඳ පරීක්ෂණ

2023.01.01 දිනට ශේෂය = 11 + පැමිණිලි ලැබීම = 07 − විසඳීම = 04 = 2023.09.30 දිනට ශේෂය = 14

රූපසටහන 2.10 - කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ සේවා කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි පිළිබඳ පරීක්ෂණ - කම්.දෙ.

### 2.12.3 කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දීම




රූපසටහන 2.11 කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දීම - කම්.දෙ.




**ඡායාරූපය 2.7** - ළමා ශ්‍රම විරෝධී දිනයට සමගාමීව අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා පාසල් උපකරණ බෙදා දීම

### 2.12.4 ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ළමා ශ්‍රමයෙන් තොර කලාප පිහිටුවීමට අදාළව 2023 වර්ෂය තුළ සිදු කරනු ලැබූ වැඩසටහන් පිළිබඳ තොරතුරු

2023 වර්ෂයේදී වැඩසටහන් සිදු කිරීම සඳහා තෝරා ගනු ලැබූ දිස්ත්‍රික්ක 10 (ගාල්ල, ගම්පහ, පුත්තලම, මාතර, බදුල්ල, මොනරාගල, නුවරඑළිය, මහනුවර, කළුතර සහ ත්‍රිකුණාමලය) තුළ ළමා ශ්‍රමය සම්බන්ධයෙන් අවදානම් සහගත ප්‍රදේශයක් හඳුනාගනිමින් එම ප්‍රදේශයේ පාසලක් හෝ ළමා සමාජයක් තුළ 2023 වර්ෂයට අදාළ වැඩසටහන් ආරම්භ කරන ලද අතර 2023.09.30 දින විට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය හැර අනෙකුත් දිස්ත්‍රික්ක 09 තුළ වැඩසටහන් සම්පූර්ණ වශයෙන් සිදු කරන ලදි. මෙම සෑම වැඩසටහනකදීම අඩු ආදායම් ලාභී සහ ළමා ශ්‍රමය සඳහා අවදානමක් සහිත පවුල්වල සිසුන් 25 දෙනෙකු බැගින් තෝරා ගෙන සිසුන් 225 දෙනෙකු සඳහා පාසල් උපකරණ බෙදා දීම සිදු කරන ලදී.

### 2.12.5 ප්‍රධාන සැමරුම් දිනයන් පැවැත්වීම

- **ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් වැඩසටහන - 2023**

"ඇය දැයේ අභිමානයයි" තේමාව කරගත් 2023.03.08 දිනට යෙදී තිබූ ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලැබූ කාන්තා දින සැමරුම් වැඩසටහන කම්කරු හා විදේශ රැකියා ගරු අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2023.03.16 දින පවත්වන ලදී. එහිදී සේවයේ නියුක්ත කාන්තාවන්ගේ සෞන්දර්යාත්මක කුසලතා ද අගයමින්, කාන්තාවන්ට බලපාන නීති ද ඇතුලත් වන පරිදි "ඇගේ ශ්‍රමයෙන් නැගෙන ලෝකය" යන තේමාව යටතේ "වැඩලිය සිත්තම්" නමින් පවත්වනු ලැබූ පෝස්ටර් නිර්මාණ තරඟයේ ජයග්‍රාහකයින් සඳහා කුසලාන, ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානය කරන ලදී. සේවයේ නියුක්ත කාන්තාවන්ගේ සේවා සුරක්ෂිතභාවයට අදාළ කම්කරු නීති පිළිබඳ සරල

බසින් මාර්ගෝපදේශයක් වශයෙන් සකස් කරනු ලැබූ "වැඩලිය රැක දෙන කම්කරු නීතිය" අත්පොත නිල වශයෙන් කම්කරු දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය මගින් එළි දැක්වීම මෙදින සිදුකරන ලදී.

- **ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දින වැඩසටහන - 2023**

2025 වර්ෂය වන විට ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ, ජුනි මස 12 වන දිනට යෙදෙන "ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දිනය"ට සමගාමීව, කම්කරු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලැබූ වැඩසටහන, කම්කරු හා විදේශ රැකියා ගරු අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2023.06.15 වන දින ගාල්ල නෙළුව මණ්ඩලපුර කනිෂ්ඨ විද්‍යාලයේ දී පවත්වන ලදී. මෙහිදී ළමා ශ්‍රමයට අවදානමක් සහිත ආර්ථික අපහසුතා සහිත පවුල් 6ක් සඳහා "මැලිබන් නිදහසේ රන්දරුවෝ අරමුදල" මගින් එම පවුල් වෙත ස්වයං රැකියාවන්හි නිරත වීමට අවශ්‍ය උපකරණ බෙදා දීමක්ද සිදු කරන ලදී.

## 2.13 සේවකයන්ගේ සමාජ ආරක්ෂණය

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ යෙදෙන සේවකයන්ගේ සමාජ ආරක්ෂණය සඳහා 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇත. මෙම අරමුදලෙහි පරිපාලන කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, එහි අරමුදල් කළමනාකරණය පිළිබඳ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දරනු ලැබේ. දෙපාර්තමේන්තුව විසින් මේ වන විට සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත පරිදි දැක්විය හැකිවේ.

- සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවායෝජකයන් ලියාපදිංචිකිරීම
- සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම
- දායක මුදල් නොගෙවන සේවායෝජකයන් වෙතින් දායක මුදල් අයකර ගැනීම
- සාමාජිකයන් වෙත ප්‍රතිලාභ මුදල් ගෙවීම් සිදුකිරීම සඳහා ගෙවීම් නියෝග ලබාදීම
- පෞද්ගලික හා අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය

### 2.13.1 සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම


2023.01.01 දින සිට 2023.09.30 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීමට අදාළව තීරණ ලිපි 137,577ක් යොමු කර ඇති අතර ඒ සම්බන්ධ තොරතුරු ප්‍රස්තාරය 2.3 මගින් නිරූපණය කර ඇත.

### 2.13.2 දායක මුදල් ගෙවීම පැහැර හරිනු ලබන සේවායෝජකයන් වෙතින් දායක මුදල් අයකර ගැනීමට අදාළව නිවේදන යැවීම

| යැවූ පළමු නිවේදන සංඛ්‍යාව | පළමු නිවේදන මගින් අයකර ගනු ලැබූ මුදල රු. | යැවූ අවසන් නිවේදන සංඛ්‍යාව | අවසන් නිවේදන වලින් අයකර ගනු ලැබූ මුදල රු.) |
|---|---|---|---|
| 6,277   | මිලියන 735   | 3,598   | මිලියන 513   |

රූපසටහන **2.12** - නිවේදන යැවීමේ ප්‍රගතිය - (සේ. අ. අ.) - කම්.දෙපා.

දායක මුදල් ගෙවීම පැහැර හරිනු ලබන සේවායෝජකයන් වෙතින් එම මුදල් අයකර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම නිවේදන හා අවසන් නිවේදන යොමු අතර ඒ සඳහා ප්‍රතිචාර නොදක්වන්නේ නම් නීති මඟින් කටයුතු කර එම දායක මුදල් හා අධිභාර අයකර ගිණුම් ගත කිරීමට ක්‍රියා කරනු ලැබේ.




ප්‍රස්තාරය 2.5 - සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම - කම්කරු දෙපා.

**2.13.3 සේවක අර්ථසාධක අරමුදල ප්‍රවර්ධනය සඳහා සහ සේවාලාභීන් වෙත සේවා ලබා දීමේ කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග**

- ABH ලියාපදිංචි කිරීමේ නව මෘදුකාංගය වැඩිදියුණු කිරීම අවසන් අදියරේ පවතී. ඒ අනුව, ඉදිරියේදී එම නව මෘදුකාංගය දිස්ත්‍රික් කම්කරු කාර්යාලයන්හි ස්ථාපිත කර ABH ලියාපදිංචි කිරීමේ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කිරීමට අපේක්ෂිතය.

- සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවා යෝජකයන් ලියාපදිංචි කිරීම, සාමාජිකයින්ගේ තොරතුරු පරීක්ෂා කිරීම (නම, B කාඩ් අංකය ආදිය), අවසන් ප්‍රතිලාභ ලබා ගැනීමේ K අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම, ප්‍රතිලාභ ලබා ගැනීමට අයදුම්පත්‍ර භාරදුන් පසු එහි වර්තමාන තත්ත්වය පරීක්ෂා කිරීම, AH ලියාපදිංචිය ආදී සේවක අර්ථසාධක අරමුදලට අදාළ සේවාවන් ඊ සේවාවන් වශයෙන් ලබා දීම සඳහා අවශ්‍ය මෘදුකාංග පද්ධති වැඩි දියුණු කිරීම් සිදු කෙරෙමින් පවතී.

- ඩිජිටල් ආකෘතියක් හඳුන්වා දීම මඟින් සේවක අර්ථසාධක අරමුදලේ 30% පූර්ව ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වන මූලික සුදුසුකම් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පරීක්ෂා කිරීම සඳහා ප්‍රතිලාභීන් වෙත පහසුකම් ලබා දෙන ලදී. 2023 වර්ෂයේ පළමු කාර්තුව තුළදී හඳුන්වා දෙනු ලැබූ මෙම ක්‍රමවේය මඟින් මේ දක්වා සාමාජිකයන් 1,865 දෙනෙකුගේ මූලික සුදුසුකම් පරීක්ෂා කර ප්‍රතිලාභ ලබා ගැනීමට අවශ්‍ය ඉදිරි පියවර වෙත යොමු කර ඇත.

- සේවක අර්ථසාධක අරමුදලට අදාළ සේවාවන් අවශ්‍යතාව පරිදි ප්‍රාදේශිය කාර්යාල වෙත විමධ්‍යගත කිරීමට ද කටයුතු කරන ලදී. ඒ අනුව, මන්නාරම, යටියන්තොට සහ වරකාපොළ යන උප කම්කරු කාර්යාලයන්හි සේ.අ.අ. ප්‍රතිලාභ ගෙවීම් ශාඛා ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී.

සාමාජිකයන් වෙත සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් නිවැරදි දැනුවත්භාවයක් නොමැතිවීම හේතුවෙන් උද්ගත වන ගැටලු අවම කිරීම සඳහා සහ සාමාජිකයන් මෙන්ම සේවායයන්ද දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ද සහයෝගය සහිතව ජංගම සේවා වැඩසටහන් දෙකක් පවත්වන ලදී. සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයා විසින් ලියාපදිංචි වී ඇති නමෙහි ඇති දෝෂ නිවැරදි කර ගැනීම, ABH ලියාපදිංචි කිරීම, සේවක අර්ථසාධක අරමුදෙලේ සාමාජික ගිණුම් ශේෂ දැන ගැනීම ආදී පහසුකම් මෙම ජංගම සේවා වැඩසටහන් මගින් ලබා දෙන ලදී.

**වගුව 2.7** ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම - සේ. අ. අර., කම්කරු දෙපා.

| ජංගම සේවා වැඩසටහන පැවැත්වූ දිනය | ස්ථානය | අරමුණු | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 2023 මැයි 17 සහ 18 | මාතලේ | ABH ලියාපදිංචිය, B card/ CBSL නම /අංක සංශෝධනය හා වෙනත් ගැටළු | 552 |
| 2023 ජූලි 15 සහ 16 | යාපනය | | 325 |

## 2.14 සේවකයන් සේවයේ යෙදවීමට අදාළ අයිතීන් ආරක්ෂා කර දීම සඳහා නෛතික රැකවරණය


සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පනත් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව විසින් එම නීති උල්ලංඝනය කරන සේවා යෝජකයන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත් ඒ තුළින් සේවක අයිතීන් සුරක්ෂිත කිරීමත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

ඒ අනුව, 2023.01.01 දින සිට 2023.09.30 දින දක්වා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ අධිකරණ ක්‍රියාමාර්ගවලට අදාළ ප්‍රගතිය පහත වගුව පරිදි වේ.

වගුව 2.8 - අධිකරණ අනුව නඩුවල කාර්යසාධනය - කම්කරු දෙපා.

| අධිකරණය | 2023 වර්ෂය දක්වා ඉදිරියට ගෙන ආ ශේෂය | 2023.01.01 දින සිට 2023.09.30 දින දක්වා පවරනු ලැබූ නඩු සංඛ්‍යාව | 2023.09.30 දිනට අවසන් වූ නඩු |
|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 114 | 10 | 0 |
| අභියාචනාධිකරණය | 324 | 73 | 5 |
| මහාධිකරණය | 86 | 41 | 29 |
| වානිජ මහාධිකරණය | 217 | 9 | 2 |

**සටහන -** නීති ක්‍රියා අංශය සෘජු මැදිහත්වීම මත සිදු කරනු ලැබූ අධිකරණ ක්‍රියා මාර්ග පිළිබඳ තොරතුරු ඉහත වගුව මගින් ඉදිරිපත් කර ඇත.




**ප්‍රස්තාරය 2.6** - මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරනු ලැබූ නඩු සහ අවසන් වූ නඩු - කම්කරු දෙපා.

සටහන - ප්‍රාදේශීය කම්කරු කාර්යාලයන්හි විසින් ගනු ලැබූ අධිකරණ ක්‍රියා මාර්ග පිළිබඳ තොරතුරු ඉහත වගුව මගින් ඉදිරිපත් කර ඇත.

## 2.15 කම්කරු දෙපාර්තමේන්තුවේ තොරතුරු සන්නිවේදන කටයුතු

### 2.15.1 ප්‍රකාශන කටයුතු

කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා පහත ප්‍රකාශන එළි දක්වන ලදී.

- **කතිකාව සඟරාව**

  ආයතන තුළ සේව්‍ය හා සේවක දෙපාර්ශවය අතර සුහදතාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම මගින් ආරවුල් අවම කිරීම සඳහා දායකත්වය ලබා දීම කතිකාව සඟරාව එළි දැක්වීමේ අරමුණ වේ. ඒ අනුව, කතිකාව සඟරාවේ 22 වන වෙළුම 2023 අප්‍රේල් මාසයේදී එළි දක්වන ලදී.

- **කර්මාන්තමය සුරක්ෂිතාවය සම්බන්ධ අත්පොත්**

  අනතුරුදායක කර්මාන්තශාලා සහිත ක්ෂේත්‍ර 07ක් හඳුනාගෙන 2022 වර්ෂයේදී ඒම ක්ෂේත්‍රයට අදාල විශේෂඥයින්ගේ මඟ පෙන්වීම්වලට අනුව සිදු කරන ලැබූ පර්යේෂණාත්මක පරීක්ෂණවල ප්‍රතිඵල ඇසුරු කරගෙන සකස් කරන ලද අත්පොත් 05ක්

මුද්‍රණය කිරීමේ කටයුතු 2023 වර්ෂය තුළදී ආරම්භ කරන ලද අතර 2023.09.30 දින වන විට ඒ අතුරින් අත් පොත් 03ක් මුද්‍රණය කර අවසන් කරන ලදී.

- **වැඩ කළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබද සමීක්ෂණය**
  මෙම සමීක්ෂණය මගින් රටේ සංවර්ධන ක්‍රමෝපායන් සැකසීම සඳහා අවශ්‍ය ශ්‍රම පිරිවැය, වැඩකළ පැය ගණන හා සාමාන්‍ය ඉපයීම් පිළිබඳ දත්ත ලබා ගැනීම සිදු කෙරේ. එමගින් රජයේ සහ පෞද්ගලික අංශයේ සැලසුම් සම්පාදනය හා තීරණ ගැනීම සඳහා මෙන්ම සේවා සේවක දෙපාර්ශවයේ උන්නතිය වෙනුවෙන් සකස් කරනු ලබන ඉදිරි සැලසුම් සකස් කිරීමට අවශ්‍ය තොරතුරු ලබා දීම සිදු කෙරේ. වැඩ කළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබද සමීක්ෂණයේ 2022 සහ 2023 වර්ෂයන්ට අදාළ වාර්තා 2023 වර්ෂයේ අවසන් කාර්තුව තුළදී අවසන් කිරීමට අපේක්ෂිත අතර 2023.09.30 දින වන විට එම වාර්තාවන් සඳහා අවශ්‍ය දත්ත රැස්කර ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පැවතිණි.
- **කම්කරු සංඛ්‍යාති වාර්ෂික වාර්තාව 2022**
  කම්කරු ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දත්ත ප්‍රකාශයට පත් කිරීම සහ දත්ත පරිශීලකයන් සඳහා අවශ්‍ය දත්ත ලබා දීමේ අරමුණින් මෙම වාර්තාව සකස් කරනු ලැබේ. ඒ අනුව, 2022 වර්ෂයට අදාළ වාර්තාව 2023 වර්ෂයේ අවසන් කාර්තුව තුළදී අවසන් කිරීමට අපේක්ෂිත අතර 2023.09.30 දින වන විට එම වාර්තාවන් සඳහා අවශ්‍ය දත්ත රැස්කර ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පැවතිණි.

### 2.15.2 කම්කරු දෙපාර්තමේන්තුවේ නිල සමාජ මාධ්‍ය කටයුතු

කම්කරු දෙපාර්තමේන්තුව විසින් නිල යූ ටියුබ් චැනලයක්, ෆේස්බුක් පිටුවක් සහ ට්විටර් ගිණුමක් පවත්වාගෙන යමින් යාවත්කාලීන කරනු ලැබූ තොරතුරු මහජනතාව වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ.

| | |
|---|---|
| YouTube Channel | Subscribers: 1.23K<br>Number of Videos included: 127 |
| Facebook Page | Followers: 3.3K |
| Twitter | Followers: 87 |

### 2.15.3 කම්කරු දෙපාර්තමේන්තු වෙබ් අඩවිය

සේවාලාභීන් සඳහා අවශ්‍ය අයදුම් පත්‍ර, ආකෘති පත්‍ර, උපදෙස් හා කම්කරු අණපනත් මෙන්ම සේවායෝජකයන් විසින් අනුගමනය කළ යුතු පඩි පාලක සභා තීරණ ඇතුළු අවශ්‍ය ලේඛන බාගත කරගත හැකි වන පරිදි www.labourdept.gov.lk යන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි පළ කර ඇති අතර එම තොරතුරු නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. එසේම, දෙපාර්තමේන්තුව සඳහා නව නිල වෙබ් අඩවියක් සකස් කිරීමේ කටයුතු අවසන් අදියරට පැමිණ ඇති අතර වර්තමානය වන විට දෙපාර්තමේන්තුවේ ඊ-සේවාවන් ලබා ගැනීමේ පහසුකම්ද මෙයට ඇතුළත් කර ඇත.

### 2.15.4 කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය

කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණපනත්, පොත්පත් හා ප්‍රකාශන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධානතම පුස්තකාලය කම්කරු දෙපාර්තමේන්තුවේ විසින් පවත්වාගෙන යනු ලැබේ. මෙමගින්

කම්කරු දෙපාර්තමේන්තුවේ, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ සහ ඒ යටතේ පවතින අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩල සඳහා මෙන්ම බාහිර පාඨකයන් සඳහාද කම්කරු ක්ෂේත්‍රයට අදාළ සියලුම අණපනත්, පොත් පත්, ප්‍රකාශන ආදිය පරිශීලනය සඳහා පහසුකම් සලසනු ලබයි.

පුස්තකාලයේ පහසුකම් තව දුරටත් සංවර්ධනය කිරීමේ කටයුතු 2023 වර්ෂයේදී සිදු කරන ලද අතර ඒ අනුව, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මණ්ඩලයේ උපදෙස් සහ මඟපෙන්වීම යටතේ පුස්තකාල දත්ත කළමනාකරණ පද්ධතිය (කොහා මෘදුකාංගය ) ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇත.

## 2.16 කම්කරු දෙපාර්තමේන්තුවේ මානව සම්පත සංවර්ධනය

කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා ගැනීම, අවශ්‍යතාව පරිදි බඳවා ගැනීම් සිදු කිරීම, නිලධාරීන්ගේ උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම්, කාර්යසාධනය ඇගයීම, වැටුප් වර්ධක ලබා දීම, ස්ථාන මාරු කිරීම්, නිලධාරීන් විශ්‍රාම ගැන්වීම, නිලධාරීන්ගේ නිවාඩු කටයුතු සහ කාර්ය මණ්ඩලයේ විනය කටයුතු යන දෛනික කාර්ය මණ්ඩල පරිපාලන කටයුතු 2023 වර්ෂයේදී ද සිදු කරන ලදී.

වගුව. **2.9 -** නිලධාරීන් බඳවා ගැනීම - කම්කරු.දෙපා.

| නිලධාරීන් බඳවා ගැනීම | | | | |
|---|---|---|---|---|
| **බඳවා ගැනීමේ විභාග පැවැත්වීම** | | | | |
| **තනතුර** | **පිරවිය යුතු වූ පුරප්පාඩු සංඛ්‍යාව** | **විභාගය පැවැත්වීමට යෝජිතව තිබූ දිනය** | **විභාගය පැවැත්වූ දිනය** | **ඒ අනුව, නිලධරයන් බඳවා ගන්නා ලද දිනය හා නිලධරයන් සංඛ්‍යාව** |
| කම්කරු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ සහකාර කම්කරු කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) | 13 | 2022 ජූලි මස | 2023 ජනවාරි 28 | 2023.08.31 දින ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වා අදාළ ලේඛන ඉදිරි කටයුතු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත |
| කම්කරු නිලධාරී - II (සීමිත) | 59 | 2023 ජූලි මස | 2023 අප්‍රේල් 29 | ප්‍රතිඵල නිකුත් කර නොමැත |

| සම්මුඛ පරීක්ෂණ මගින් සේවකයන් බඳවා ගැනීම | | | |
|---|---|---|---|
| **තනතුර** | **සම්පූර්ණ කළ යුතු වූ පුරප්පාඩු සංඛ්‍යාව** | **බඳවා ගනු ලැබූ සේවකයන්** | |
| | | **දිනය** | **සේවකයන් සංඛ්‍යාව** |
| කාර්යාල සේවක - අදියර I (බහුකාර්ය සංවර්ධන පුහුණු ලාභීන්) | 41 | 2023.06.07 | 30 |
| කාර්යාල සේවක - අදියර II (බහුකාර්ය සංවර්ධන පුහුණු ලාභීන්) | 11 | 2023.09.19 | 8 |

| කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම | | | | | |
|---|---|---|---|---|---|
| තනතුර | කාර්යක්ෂමතා විභාගයේ නම | පරීක්ෂණය ට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලැබූ නිලධාරීන් / සේවකයන් සංඛ්‍යාව | පරීක්ෂණය පැවැත්වීමට නියමිව තිබූ දිනය | පරීක්ෂණය පැවැත්වූ දිනය | පරීක්ෂණය සඳහා සහභාගී වූ නිලධාරීන්/ සේවකයන් සංඛ්‍යාව |
| පර්යේෂණ නිලධාරී | පර්යේෂණ නිලධාරී තනතුරේ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා අදාළ දෙපාර්තමේන්තු රෙගුලාසි පිළිබඳ ලිඛිත පරීක්ෂණය | 01 | 2023 මාර්තු | 2023 මැයි 09 | 01 |
| කම්කරු නිලධාරී | කම්කරු නිලධාරී තනතුරේ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 07 | 2022 නොවැම්බර් | 2023 ජුනි 28 | 02 (ප්‍රතිඵල නිකුත් කර නොමැත) |
| කම්කරු නිලධාරී | කම්කරු නිලධාරී තනතුරේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 55 | 2022 නොවැම්බර් | 2023 අගෝස්තු 29 | 38 (ප්‍රතිඵල නිකුත් කර නොමැත) |
| කාර්යාල සේවක සේවය - I ශ්‍රේණිය | කාර්යාල සේවක සේවයේ තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 04 | 2023 ජුනි | 2023 අගෝස්තු 28 | 03 |
| කාර්යාල සේවක සේවය - II | කාර්යාල සේවක සේවයේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 03 | 2023 ජුනි | 2023 අගෝස්තු 28 | 03 |
| ලොරි පවිත්‍රකරු - II | ලොරි පවිත්‍රකරු තනතුරේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 01 | 2023 අගෝස්තු | 2023 සැප්තැම්බර් 12 | 01 |

එසේම, කම්කරු දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ පුහුණු අවශ්‍යතා හඳුනා ගෙන අභ්‍යන්තර පුහුණු වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම, බාහිර ආයතන විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා වෙත නිලධාරීන් යොමු කිරීම, සේවා අවශ්‍යතාවය පරිදි උපාධි හා පශ්චාත් උපාධි හැදෑරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නිලධාරීන් වෙත සැපයීම සහ විදේශ පුහුණු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත.

දේශීය පුහුණු වැඩසටහන් සඳහා 2023 වර්ෂය සඳහා රු 6,000,000.00 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. ඒ අතුරින් 2023.09.30 දිනට වියදම රු. 2,297,363.00ක් වන අතර වියදම ප්‍රතිපාදනයන්හි ප්‍රතිශතයක් ලෙස 39% කි.

වගුව 2.10 - නිලධාරීන් සඳහා සංවිධානය කර පවත්වන ලද පුහුණු වැඩසටහන් - කම්කරු. දෙපා.

| කම්කරු දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් සඳහා සංවිධානය කර පවත්වන ලද පුහුණු වැඩසටහන් | | | | |
|---|---|---|---|---|
| අ.අ. | වැඩසටහනේ ස්වභාවය | | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ නිලධරයන් සංඛ්‍යාව |
| 1 | සේවාරම්භක පුහුණු වැඩසටහන් | | 03 | 47 |
| 2 | විෂයානුබද්ධ පුහුණු වැඩසටහන් | භෞතිකව පැවැත්වූ වැඩසටහන් | 04 | 463 |
| | | මාර්ගගත ක්‍රමය ඔස්සේ (Online) පැවැත්වූ වැඩසටහන් | 07 | Zoom තාක්ෂණය මගින් සිදු කරන ලදී |

## 2.17 කම්කරු දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය

දිවයින පුරා විසිරී සිටින සේවාලාභීන්ට වඩාත් ඵලදායී සේවයක් සලසා දීමේ අරමුණ පෙරදැරිව කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි සහ දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාලයන් හි යටිතල පහසුකම් සංවර්ධනයට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

ඒ අනුව, ප්‍රාදේශීය කාර්යාලයන් හි අවශ්‍යතාවය පරිදි සුළු අළුත්වැඩියා කටයුතු සිදු කරන ලද අතර මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ මහල්වල සහ කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ මහල්වල අභ්‍යන්තර නිර්මිත සකස් කිරීමේ කටයුත සිදු කරන ලදී.

වගුව 2.11 - කම්කරු දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය

| ව්‍යාපෘතිය | | 2023.09.30 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ මහල්වල අභ්‍යන්තර නිර්මිත සකස් කිරීම | 8,10,11 මහල | 78% |
| | 9,12 මහල | 89% |
| | 13,14 මහල | 100% |
| | 16 මහල | ලංසු ලේඛන සකස් කෙරෙමින් පවතී |
| කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ මහල්වල අභ්‍යන්තර නිර්මිත සකස් කිරීම | 1 වන මහල | 93% |
| | 3,4,5,6 මහල | ලංසු ලේඛන සකස් කෙරෙමින් පවතී |

## 2.18 කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යයන් අධීක්ෂණය මගින් ඉලක්කයන් කරා මෙහෙයවීම

2023 වර්ෂයේ කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ වන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා සියලුම අංශයන් හා ප්‍රාදේශීය කම්කරු කාර්යාල කටයුතු කරනු ලබන ආකාරය සහ ප්‍රගතිය පරීක්ෂා කරන ලදී. ඒ අනුව, කම්කරු කොමසාරිස්වරුන්ගේ මාසික රැස්වීම සෑම මාසයකදීම පවත්වන ලැබූ අතර එහිදී එක් එක් අංශයන්හි ප්‍රගතිය සහ අංශයන්හි කටයුතු සිදු කරගෙන යාමේදී මතු වී ඇති පරිපාලන ගැටළු සම්බන්ධයෙන් උපදෙස් සහ විසඳුම් ලබා දීමට කටයුතු කරන ලදී.

එසේම, දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන් විසින් අදාළ වාර්ෂික ඉලක්ක කරා යොමු වීම අධීක්ෂණය ද සිදු කරන ලදී. දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල 29ක කටයුතු 2023 වර්ෂයේ මුල් කාර්තු තුන තුළදී පරීක්ෂාකර කර ඉදිරි උපදෙස් ලබා දෙන ලදී.

කලාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු විසින් සිය කලාපයට අදාළ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන්හි 2023 වර්ෂයේ පළමු සහ දෙවන කාර්තුවලට අදාල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී.

## 2.19 විදේශ රැකියා ක්ෂේත්‍රයේ පාලනය හා නියාමනය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණය සඳහා වන මූලික නියාමන ආයතනය වේ. එය විදේශයන්හි රැකියා අපේක්ෂා කරන ශ්‍රී ලාංකිකයින්ගේ අභිමානය, ආරක්ෂාව සහ සමානාත්මතාවය යන කොන්දේසි යටතේ සංක්‍රමණයවීම සහතික කරන ශ්‍රම සංක්‍රමණ ක්‍රියාවලිය නියාමනය කිරීම සඳහා නීතිමය රාමුවක් යටතේ ස්ථාපිත පුළුල් විෂය පථයකින් යුත් ආයතනයකි.

වගුව **2.12** විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා බලපත් නිකුත් කිරීම් ,විදේශ රැකියා ඇණවුම් අනුමත කිරීම් සහ විදේශ රැකියා සඳහා ලියාපදිංචි කිරීම් - ශ්‍රී. ලං.වි.සේ.නි.කා.

| | විස්තරය | | සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම | නිකුත් කරන ලද නව බලපත්‍ර සංඛ්‍යාව | 116 |
| | | අලුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව (වාර්ෂික අලුත්කිරීම්) | 722 |
| 02 | ශ්‍රී ලාංකිකයින් බඳවා ගන්නා විදේශයන්හි පිහිටි රැකියා නියෝජිත ආයතන සහ සමාගම් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම / අලුත්කිරීම | ලියාපදිංචිකල/ අලුත්කල විදේශීය රැකියා නියෝජිත ආයතන/ සමාගම් සංඛ්‍යාව (ගමනාන්ත රටවල) | 1,647 |
| 03 | විදේශ රැකියා නියෝජිත ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන විදේශ රැකියා ඇණවුම් සහ දැන්වීම් සඳහා අනුමැතිය ලබාදීම | අනුමත කරන ලද රැකියා ඇණවුම් සංඛ්‍යාව | 3,056 |
| | | අනුමත කරන ලද විදේශ රැකියා දැන්වීම් සංඛ්‍යාව | 943 |
| 04 | විදේශ රැකියා සඳහා ලියාපංදිංචි කිරීම් | බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන මගින් විදේශ රැකියා ඇබෑර්තු සඳහා ශ්‍රී ලාංකිකයින් බඳවා ගෙන විදේශගත කිරීම සඳහා ලබාදුන් අනුමැති සංඛ්‍යාව | 107,466 |
| | | පුද්ගලික මාර්ගයෙන් විදේශ රැකියා සඳහා පිටත්ව යෑමට ලියාපදිංචි වූ විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව | 72,327 |
| | | පුද්ගලික මාර්ගයෙන් විදේශ රැකියා සඳහා ලියාපදිංචිය අලුත්කල විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව | 39,111 |
| | | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා දකුණු කොරියාව, ජපානය හා ඊශ්‍රායලය යන රටවල් සඳහා ලියාපදිංචි වූ විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව | 5,348 |
| | | විදේශයන්හි පිහිටි දූත මණ්ඩල කාර්යාල හරහා ලියාපදිංචි වු විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව | 2,148 |
| | | විදේශයන්හි පිහිටි දූත මණ්ඩල කාර්යාල හරහා ලියාපදිංචිය අළුත්කල විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව | 3,250 |

වගුව **2.13** විදේශ රැකියා සඳහා බඳවා ගැනීම් සම්බන්ධව බලපත්‍රලාභී නියෝජිත ආයතන/ බලපත්‍රලාභී නොවන වෙනත් පාර්ශවවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම - ශ්‍රී ලං.වි.සේ.නි.කා.

| | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | සිදුකළ පැමිණිලි පරීක්ෂණ සංඛ්‍යාව | 2,500 |
| 02 | විසඳන ලද පැමිණිලි පරීක්ෂණ සංඛ්‍යාව | 913 |
| 03 | නීති විරෝධී බඳවා ගැනීම් සම්බන්ධව සිදුකරන ලද වැටලීම් සංඛ්‍යාව | 11 |
| 04 | නීති විරෝධී බඳවා ගැනීම් සම්බන්ධව සිදුකරන ලද වැටලීම් මගින් අත්අඩංගුවට ගත් සංඛ්‍යාව | 44 |
| 05 | නීතිය උල්ලංඝනය කරන ලද බලපත්‍රලාභී/ බලපත්‍රලාභී නොවන පාර්ශවයන්ට එරෙහිව අධිකරණයේ ගොනුකල නඩු සංඛ්‍යාව | 131 |
| 06 | නීතිය උල්ලංඝනය කරන ලද බලපත්‍රලාභී/ බලපත්‍රලාභී නොවන පාර්ශවයන්ට එරෙහිව අධිකරණයේ/ කම්කරු විනිශ්චය සභාවේ පැවරූ නඩු සඳහා පෙනී සිටි වාර සංඛ්‍යාව | 3,310 |

වගුව **2.14** විගමනික ශ්‍රමිකයන් වෙතින් හෝ ඔවුන් වෙනුවෙන් ලැබෙන පැමිණිලි විසඳීම සහ මිනිස් වෙළඳාමට එරෙහි ක්‍රියාකාරම් - ශ්‍රී. ලං. වි.සේ.නි.කා.

| | විස්තරය | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | විසඳන ලද පැමිණි සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | විගමනික ශ්‍රමිකයන් වෙතින් හෝ ඔවුන් වෙනුවෙන් ලැබෙන පැමිණිලි විසඳීම | 10,000 | 6,982 |
| 02 | ව්‍යාපාර ගැටලු නිරාකරණය කිරීමට අදාළව ලැබුණු පැමිණිලි විසඳීම | 1,686 | 376 |
| 03 | මිනිස් වෙළෙඳාමට අදාළ පැමිණිලි විසඳීම | 49 | 40<br>අපරාධ පරීක්ෂණ දෙපා. වෙත යොමු කළ පැමිණිලි සංඛ්‍යාව |



ඡායාරූපය **2.8** - ශ්‍රම සංක්‍රමණය සම්බන්ධයෙන් වන පර්යේෂණ වාර්තා එක් කරමින් ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් සකස් කළ පර්යේෂණ වාර්තා සංග්‍රහයක් අමාත්‍යවරයා වෙත පිළිගැන්වීම

## 2.20 විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය

### 2.20.1 අන්තර්ජාලගත රැකියා බැංකුව

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් පවත්වාගෙන යනු ලබන අන්තර්ජාල ගත රැකියා බැංකුවෙහි ලියාපදිංචිවීම සඳහා විදේශ රැකියා බලාපොරොත්තු වන පුද්ගලයින් වෙත පහසුකම් සලසා ඇත. විදේශ රැකියා අපේක්ෂිකයින්ට කාර්යාංශයේ වෙබ් අඩවිය හරහා පුද්ගලිකවම ලියාපදිංචි විය හැකි අතර ප්‍රධාන කාර්යාලය සහ පළාත් කාර්යාල මඟින් ද ලියාපදිංචි විය හැක. තම අයදුම්පත රැකියා බැංකුවට යොමු කළ දින සිට උපරිම වසර 2ක කාලයක් සඳහා එය වලංගු වේ. මෙම රැකියා බැංකුව හරහා විදේශ රැකියා යෝජකයින්ට හා බලපත්‍රලාභී රැකියා නියෝජිත ආයතනවලට විදේශ රැකියා අපේක්ෂකයින් සොයා ගැනීමට පහසුකම් සැලසේ. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ලියාපදිංචි වූ රැකියා අපේක්ෂකයන් සංඛ්‍යාව 24,675කි.

වගුව **2.15** ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදේශ රැකියා සඳහා බඳවා ගැනීම-ශ්‍රී. ල. වි.සේ.නි.කා.

| රට | **විස්තරය** | **2023 (ජන - සැප්)** |
|---|---|---|
| | සාමාන්‍ය බලපත්‍ර ක්‍රමය යටතේ විදේශ ගතවූ පුද්ගලයින් සංඛ්‍යාව | 2,687 |
| දකුණු කොරියාව | නැවත තම පෙර සේවා ස්ථානය වෙතම විදේශ ගතවූ පුද්ගලයින් සංඛ්‍යාව | 1,079 |
| | විශේෂ බලපත්‍ර ක්‍රමය යටතේ විදේශ ගතවූ පුද්ගලයින් සංඛ්‍යාව | 1,153 |
| ජපානය | තාක්ෂණික අභ්‍යාසලාභී පුහුණුපාඨමාලාව (TITP) යටතේ රැකියා සඳහා පිටත්ව ගිය පුද්ගලයින් සංඛ්‍යාව | 67 |
| ඊශ්‍රායලය | සාත්තුසේවක රැකියා සඳහා පිටත්ව ගිය පුද්ගලයින් සංඛ්‍යාව | 362 |

වගුව **2.16** විදේශ රැකියා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම-. . ශ්‍රී.ල. වි.සේ.නි.කා.

| **විස්තරය** | | **2023 (ජන - සැප්)** |
|---|---|---|
| විදේශ රැකියා අපේක්ෂකයින් සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් / ජංගම සේවාවන් පැවත්වීම | සහභාගී වූ සංඛ්‍යාව | 13,232 |
| | පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 260 |

### 2.20.2 සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීම

- **ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ වැඩසටහන ක්‍රියාවට නැංවීම**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය සඳහා 2012.11.06 දින ISO 9001:2008 තත්ත්ව සහතිකය ලබා ගන්නා ලදි. ඊට සමගාමීව ගුවන් තොටුපල හා සහන පියස (කටුනායක), පළාත් කාර්යාල 09ක්, දිස්ත්‍රික්ක කාර්යාල 07ක් හා පුහුණු මධ්‍යස්ථාන 02ක් වෙත 2012.11.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි ISO 9001:2008 තත්ත්ව සහතිකය ලබා ගන්නා ලදී. මෙම තත්ත්ව කළමනාකරණ සහතිකය ප්‍රධාන කාර්යාලය සහ අනෙකුත් කාර්යාල වෙත 2018.04.26 වන දින සිට ISO 9001:2015 ලෙස ප්‍රමිතිය වෙනස් කර ගැනීමට කටයුතු කර ඇති අතර, මෙම ප්‍රමිති සහතිකය 2024.04.25 දින දක්වා වලංගුව පවතී.

## 2.21 වෘත්තීය මාර්ගෝපදේශනය, ශ්‍රම වෙළඳපොළ තොරතුරු පවත්වා ගැනීම හා මහජන රැකියා සේවා කටයුතු

රටේ මානව සම්පත සංවර්ධනය සහ කළමනාකරණය සඳහා **මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව** විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

### 2.21.1 වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්

රටේ මානව සම්පත්වල මුළු ශක්තිය කාර්යක්ෂම හා ඵලදායි ලෙස රටේ සංවර්ධනයට යොදාගනිමින්, දේශීය විදේශීය ශ්‍රම වෙළඳපොළට ගැලපෙන මානව සම්පතක් බිහිකිරීම අරමුණු කර ගනිමින් වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම සිදු කරනු ලබයි. මෙම වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සඳහා මනෝමිතික පරීක්ෂණ, අභියෝග්‍යතා පරීක්ෂණ, ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ, සම්මුඛ පරීක්ෂණ, විවිධ නිරීක්ෂණාත්මක පරීක්ෂණ යන මෙවලම් භාවිතා කෙරේ. මෙම වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පුද්ගල, කණ්ඩායම් සහ සමූහ වශයෙන් ගෙන පුද්ගල උපදේශන හා මාර්ගෝපදේශය, මූලික දැණුවත් කිරීම්, වැඩමුළු, ප්‍රායෝගික ක්‍රියාකාරකම් මඟින් සිදු කරනු ලැබේ.

වගුව **2.17** - වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් - මි.හා ර.ර.දෙ.

| | වැඩසටහන | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | 9 ශ්‍රේණියේ පාසල් සිසුන් දැනුවත් කිරීම | 1152 | 31,705 |
| 2 | සාමාන්‍ය පෙළ පාසල් සිසුන් දැනුවත් කිරීම | 1,631 | 1996 |
| 3 | උසස් පෙළ සිසුන් දැනුවත් කිරීම | 892 | 25,726 |
| | **එකතුව** | **3675** | **59,427** |

මීට අමතරව උසස් පෙළ සිසුන් පුහුණුව සඳහා යොමු කිරීම් 17,822 ක් හා ඒක පුද්ගල වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම් 44,770ක් සිදු කර ඇත.

### 2.21.2 රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා මහජන රැකියා සේවා වැඩසටහන්

වගුව **2.18 -** රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා මහජන රැකියා සේවා වැඩසටහන් - මි.බ. හා ර.ර.දෙපා.

| අ.අ. | වැඩසටහන | යෝජිත වැඩසටහන් ගණන | ක්‍රියාත්මක වැඩසටහන් ගණන | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 1 | දිස්ත්‍රික් රැකියා පොළ | 25 | 17 | 9,973 |
| 2 | දිස්ත්‍රික්ක වෘත්තීය පොළ | 25 | 25 | 9,326 |
| 3 | ප්‍රාදේශීය රැකියා පොළ | 200 | 163 | 25,236 |
| 4 | රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම | - | - | 67,585 |
| 5 | රැකියා ඇබෑර්තු ලියාපදිංචි කිරීම | - | - | 35,341 |
| 6 | රැකියා අපේක්ෂිතයන් රැකියා සඳහා යොමු කිරීම | - | - | 56,831 |
| 7 | රැකියා අපේක්ෂිතයන් රැකියා ගත කිරීම | - | - | 9,106 |
| 8 | ව්‍යවසායකයින් හා ස්වයං රැකියාලාභීන් බිහි කිරීම | - | - | 2,819 |

- **ශ්‍රම වෙළඳපොල තොරතුරු හා පර්යේෂණ වැඩසටහන්**

ශ්‍රී ලංකාවේ කාලීන හා සංවර්ධන අවශ්‍යතාවයන්ට සරිලන ලෙස ශ්‍රම වෙළඳපොළ පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම, වෙළඳපොළ අවස්ථා හඳුන්වාදීම, ශ්‍රම ඉල්ලුම හා සැපයුම පිළිබඳ අධ්‍යයන සිදු කිරීම හා එම තොරතුරු බෙදා හැරීම මෙහි අරමුණයි. ජාතික ශ්‍රම වෙළඳපොල පිළිබඳ කාර්යක්ෂම හා ඵලදායී තීරණ ගැනීම සඳහාත්, ප්‍රතිපත්ති සම්පාදන කාර්යය සඳහාත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපන වැඩසටහන්, පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් සම්පාදකයින් සඳහාත් අවශ්‍ය ශ්‍රම වෙළඳපොළ තොරතුරු භාවිතයට පහසු වන ආකාරයෙන් සියලු පාර්ශවකරුවන් වෙත තොරතුරු සම්පාදනය සිදු කරනු ලබයි.

ඒ අනුව, මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවේ ශ්‍රම වෙළඳපොළ තොරතුරු හා පර්යේෂණ ඒකකය විසින් සිදු කරන ලද බුද්ධි කලම්භන සැසි / අධ්‍යයනයන් පහත දක්වා ඇත.

**A. සිද්ධි අධ්‍යයන**

- ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස ප්ලාස්ටික් හා පොලිතීන් ප්‍රතිචක්‍රීකරණය
- නිල් මානෙල් මල් ආශ්‍රිත නවෝත්පාදනවල වෙළඳපොළ විභවතාවය
- අපනයන වෙළඳපොළ සඳහා තල් ආශ්‍රිත නිෂ්පාදන

**B. බුද්ධි කලම්භන සැසි**

- ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියේ අවශ්‍යතාවය
- ආර්ථිකව ආයුර්වේද ඖෂධ වගාව සැකසීම මගින් රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන හැකියාව
- ශ්‍රී ලංකාවේ ජනගහණයේ වියපත්වීම සහ ඒ ආශ්‍රිත ගැටලු

**C මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව මගින් පහත සඳහන් ඒක පුද්ගල අධ්‍යයනයන් සිදු කරමින් පවතී**

- සාමාන්‍ය අධ්‍යාපනය - අධ්‍යයනය අවසන් කර ඇත.
- නැවත පැමිණි විගමණික ශ්‍රමිකයන්ගේ අපේක්ෂාවන්
- විදේශ රටවල මහජන රැකියා සේවා සම්පාදනය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනය
- ශ්‍රී ලංකාවේ ආබාධිත පුද්ගලයන්ගේ රැකියා යෝග්‍යතාවය පිළිබඳ අධ්‍යයනය
- ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම සහභාගිත්වය පිළිබඳ අධ්‍යයනය
- ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියා බිඳ වැටීම පිළිබඳ අධ්‍යයනය
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා බිඳ වැටීම් පිළිබඳ අධ්‍යයනය

### 2.21.3 ප්‍රතිපත්ති හා තොරතුරු තාක්ෂණ වැඩසටහන්

වගුව **2.19 -** ප්‍රතිපත්ති හා තොරතුරු තාක්ෂණ වැඩසටහන් - මි.බ. හා රැ.ර.දෙපා.

| | වැඩසටහන | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ILO මගින් ප්‍රතිපාදන ප්‍රතිපාදිත වැඩසටහන | | |
| 02 | දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 21 | 627 |
| 03 | නැගෙනහිර පළාතේ රැකියා අපේක්ෂිත ආබාධ සහිත පුද්ගලයන් හඳුනා ගැනීම දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 45 | 903 |
| 04 | නැගෙනහිර පළාතේ රැකියා අපේක්ෂිත ආබාධ සහිත පුද්ගලයන් සම්මුඛ පරීක්ෂණ සඳහා සූදානම් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 9 | ජ193 |

| | | | |
|---|---|---|---|
| 05 | නැගෙනහිර පළාතේ ව්‍යාපාර අවස්ථා හඳුනාගැනීම සහ ආබාධ සහිත පුද්ගලයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 160 | ව්‍යාපාර ආයතන 160 |
| 06 | නැගෙනහිර පළාතේ දිස්ත්‍රික් වශයෙන් රැකියාපොළ පැවැත්වීම | 3 | ප්‍රතිලාභීන් 196 (රැකියා ගතකිරීම්-44) |

## 2.22 වඩා හොඳ කාර්මික සබඳතා සඳහා ත්‍රෛයිපාර්ශවීය හවුල්කරුවන් දැනුවත් කිරීම

### 2.22.1 කම්කරු නීතිය, කාර්මික සබඳතා සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය

**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය** (NILS) සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කම්කරු නීතිය හා කාර්මික සබඳතා, මානව සම්පත් කළමනාකරණය සහ වැඩබිම් ඵලදායිතාව යන ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් තුන ඔස්සේ පාඨමාලා පවත්වනු ලබයි. එසේම එම පාඨමාලා භාෂා ත්‍රිත්වයෙන්ම ගුණාත්මක සේවාවක් ලෙස රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශයේ සේවාලාභීන් වෙත ලබා දීමට ආයතනය මේ වනවිට කටයුතු කරනු ලැබේ. ඩිප්ලෝමා හා කෙටිකාලීන පාඨමාලා, සහතික පත්‍ර, පුහුණු සහ වැඩමුළු වශයෙන් මෙම පාඨමාලා පැවැත්වේ.

ආයතනය විසින් 2023 වර්ෂය තුළදී දිගුකාලීන පුහුණු වැඩසටහන් යටතේ ඩිප්ලෝමා පාඨමාලාවන් හයක් ආරම්භ කරන ලදී. මෙම පාඨමාලා විස්තර පහත පරිදි වේ.

වගුව **2.20 -** ඩිප්ලෝමා වැඩසටහන් - ජා.ශ්‍ර.අ.ආ.

| | **ඩිප්ලෝමා නාමය** | **පාඨමාලා ගණන** |
|---|---|---|
| 01 | කාර්මික සබඳතා හා කම්කරු නිති - සිංහල මාධ්‍යය | 01 |
| 02 | කාර්මික සබඳතා හා කම්කරු නිති - ඉංග්‍රීසි මාධ්‍යය | 01 |
| 03 | මානව සම්පත් කළමනාකරණය - සිංහල මාධ්‍යය | 01 |
| 04 | මානව සම්පත් කළමනාකරණය - දෙමළ මාධ්‍යය | 01 |
| 05 | ව්‍යාපාර කළමනාකරණය - (සිංහල / ඉංග්‍රීසි) | සිංහල මාධ්‍යය -03<br>දෙමළ මාධ්‍යය -03 |

වගුව **2.21 -** සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ පැවැත් වූ පාඨමාලාවන්හි ප්‍රගතිය - ජා.ශ්‍ර.අ.ආ.

| **අනු අංක** | **පාඨමාලාවේ නම** | **පාඨමාලා පැවැත්වූ ආයතනය** | **සහභාගී වූ සංඛ්‍යාව** | **අනුමත පාඨමාලා ගාස්තුව (රු.)** |
|---|---|---|---|---|
| 01 | සේව්‍ය සේවක සබඳතා සවිමත් කිරීම වෙනුවෙන් තේ කර්මාන්තශාලා සහ තේ වතු සමාගම් තුළ ගුණාත්මක වැඩ පරිසරයක් නිර්මාණය කිරීම (2023.05.16) | Haupe Estate, කහවත්ත | 40 | 90,200.00 |
| 02 | සේව්‍ය සේවක සබඳතා සවිමත් කිරීම වෙනුවෙන් තේ කර්මාන්තශාලා සහ තේ වතු සමාගම් තුළ ගුණාත්මක වැඩ පරිසරයක් නිර්මාණය කිරීම (2023.05.27) | Berubeula Estate, ඌරුබොක්ක | 20 | 94,100.00 |

| | | | | |
|---|---|---|---|---|
| 03 | සේවා සේවක සබඳතා සවිමත් කිරීම වෙනුවෙන් තේ කර්මාන්තශාලා සහ තේ වතු සමාගම් තුළ ගුණාත්මක වැඩ පරිසරයක් නිර්මාණය කිරීම(2023.08.17) | Thalawakele Plantation Ltd Summer Set | 63 | 101,270.00 |
| 04 | සේවා සේවක සබඳතා සවිමත් කිරීම වෙනුවෙන් තේ කර්මාන්තශාලා සහ තේ වතු සමාගම් තුළ ගුණාත්මක වැඩ පරිසරයක් නිර්මාණය කිරීම (2023.08.18) | Thalawakele Plantation Ltd Logi State | 59 | 97,990.00 |
| **එකතුව** | | | **182** | **383,560.00** |




**ඡායාරූපය 2.9** - ඩිප්ලෝමා සම්මාන ප්‍රධානෝත්සවය - ජා.ශ්‍ර.අ.ආ.

රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීමේ අරමුණින් කම්කරු නීති හා කාර්මික සබඳතා. මානව සම්පත් කළමනාකරණය, කාර්යාල කළමනාකරණය, ප්‍රසම්පාදනය, අභ්‍යන්තර විගණනය, ඉංග්‍රීසි හා දමිළ භාෂාවන් ආවරණය වන පරිදි එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළව දින දහයක පාඨමාලාවක් ලෙස පවත්වයි. සම්පූර්ණ පාඨමාලා සංඛ්‍යාව 10කි.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් එක්දින, දෙදින සහ තෙදින ආදී වශයෙන් වූ කෙටිකාලීන පාඨමාලා ශ්‍රම අධ්‍යයන ආයතනයේ පුහුණු මධ්‍යස්ථායේදී හා සේවාලාභී ආයතනයන්හි ඉල්ලීම පරිදි ඉලක්කගත පාර්ශවයන් වෙනුවෙන් අදාළ සේවා ස්ථානවලදී පවත්වනු ලැබේ. 2023 වසරෙහි රට තුළ ඇතිවූ ආර්ථික පසුබෑම් තත්වය හමුවේ වුවද පාඨමාලා 50ක් පවත්වා ඇති අතර පාඨමාලා මඟින් රුපියල් මිලියන 17.03ක ආදායමක් උපයා ඇත. මේ සඳහා අයදුම්කරුවන් 1,012ක ප්‍රමාණයක් පමණ සහභාගී වී ඇත. විදේශ රැකියා ඉලක්කගත කරමින් සහතිකපත්‍ර පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කර ඇත.මේ වනවිට සහතිකපත්‍ර පාඨමාලා 03ක් ආරම්භ කර පවත්වාගෙන යනු ලැබේ. Fairtrade ජාත්‍යන්තර සංවිධානයේ නිලධාරීන් සඳහා කාර්මික සබඳතා හා කම්කරු නීති යෙදවුම් පිළිබඳව දින තුනක පාඨමාලාවන් පවත්වනු ලබයි.

## 2.22.2 වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය වැඩි දියුණු කිරීම

සේවා ස්ථානවල සිදුවන වෘත්තීය අනතුරු අවම කිරීම සඳහා **ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය (NIOSH)** වෘත්තීය සුරක්ෂිතතා නිලධාරින් පුහුණුව සඳහා ඩිප්ලෝමා පාඨමාලාවන්, සහතික පත්‍ර පාඨමාලාව මෙන්ම වෘත්තීය සුරක්ෂිතතාවය හා ආරක්ෂාව සම්බන්ධයෙන් විවිධ පාඨමාලාවන් පවත්වන අතර වැඩ බිමෙහි ආරක්ෂාව හා සෞඛ්‍ය වෙනුවෙන් පාරිසරික මිනුම් ලබා ගන්නා අතර අවදානම් හඳුනාගැනීම සඳහා ඇගයීම් සිදුකරනු ලබයි. ආයතනය විසින් 2023 සැප්තැම්බර් 30 දින දක්වා සිදු කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය පහත පරිදි වේ.

වගුව **2.22 -** වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ පුහුණු වැඩසටහන් - ජා. වෘ. සු. හා සෞ. ආ.

| | පාඨමාලාව | පැවැත් වූ පාඨමාලා ගණන | සහභාගී වූ සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) |
|---|---|---|---|---|
| 01 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය) | 2 | 74 | 8.22 |
| 02 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 3 | 86 | 4.42 |
| 03 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ පදනම් පාඨමාලාව | 1 | 20 | 0.33 |
| 04 | විධායක ශ්‍රේණි නිලධාරීන් සඳහා වන පාඨමාලාව | 2 | 39 | 1.11 |
| 05 | Surado කැම්පස් ආයතනය විසින් පවත්වනු ලබන සාත්තු සේවක පාඨමාලාව | 1 | 493 | 3.2 |
| 06 | ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ හා Safe foundation ආයතනයේ මූල්‍ය අනුග්‍රහය යටතේ අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජිකයින් සඳහා සාත්තු සේවක පාඨමාලාවක් පැවැත්වීම | 1 | 100 | 0.4 |


සමාලෝචිත කාලය තුළ ආයතනය විසින් පාරිසරික මිනුම් 130ක් සිදු කර ඇති අතර ආයතනගත පුහුණු 20ක් සිදු කර ඇත. සේවයේ නිරතවන වෘත්තිකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය නිසියාකාරව පවතිනවාද යන්න විමසා බැලීම උදෙසා වෛද්‍ය පරීක්ෂණ 800ක් සිදු කර ඇත.





**ඡායාරූපය 2-10** ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මන්ත්‍රණය **-** ජා. වෘ. සු. හා සෞ. ආ.

## 2.23 වෘත්තීය අනතුරු සඳහා වන්දි ගෙවීම

සේවා නියුක්තියේදී තුවාල ලබන, රැකියාවේ ස්වභාවය හේතුවෙන් වැළඳෙන රෝගවලට ගොදුරු වන සේවකයන්ට සහ සේවා ස්ථානවල අනතුරු හේතුවෙන් මිය යන ශ්‍රමිකයින්ගේ යැපෙන්නන්ට **කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය** මඟින් වන්දි ගෙවීමට කටයුතු කරයි. වාර්තා වූ අනතුරු ප්‍රමාණයන් සම්බන්ධ තොරතුරු සහ වන්දි ගෙවා ඇති සංඛ්‍යා පහත පරිදි වේ.




**ප්‍රස්තාරය 2.7** - වාර්තා වූ මාරක නොවන අනතුරු ප්‍රමාණය




**ප්‍රස්තාරය 2.8** - වාර්තා වූ මාරක අනතුරු ප්‍රමාණය

වගුව **2-23** - වන්දි ගෙවීමේ කටයුතුවල ප්‍රගතිය - කම්. වන්දි.කො.කා.

| | කාර්යය | ප්‍රගතිය |
|---|---|---|
| 01 | විධිමත් ලෙස වාර්තාගත කරන ලද අනතුරු සංඛ්‍යාව | 330 |
| 02 | විභාගයට ගන්නා ලද ලිපිගොනු සංඛ්‍යාව | 1,297 |
| 03 | කටයුතු අවසන් කරන ලද වන්දි අයදුම්පත් සංඛ්‍යාව | 246 |
| 04 | ලියාපදිංචි කළ ගිවිසුම් සංඛ්‍යාව | 33 |
| 05 | මාරක අනතුරු සම්බන්ධයෙන් වන්දි ලෙස අයකරගත් මුදල් (රු) | 214,235,568/- |
| 06 | ලියාපදිංචි කළ ගිවිසුම්පත් අනුව මාරක නොවූ අනතුරු වෙනුවෙන් සේවකයින්ට ගෙවා ඇති වන්දි මුදල් ප්‍රමාණය (රු.) | 16,390,990.62 |

| | | |
|---|---|---|
| 07 | මාරක අනතුරු සම්බන්ධයෙන් අයකර ගන්නා ලදුව බාලවයස්කාර යැපෙන්නන්ගේ ඉතිරිකිරීමේ ගිණුම්වල තැන්පත් කළ මුදල් ප්‍රමාණයන් (රු.) | 35,464,890/- |
| 08 | බාලවයස්කරුවන් වෙනුවෙන් විවෘත කළ ගිණුම් සංඛ්‍යාව | 71 |
| 09 | බාලවයස්කරුවන්ගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් පසු නිදහස් කළ ගිණුම් සංඛ්‍යාව | 110 |
| 10 | නිදහස් කළ බාලවයස්කාර ගිණුම්වලින් ගෙවූ මුදල් ප්‍රමාණය (රු.) | 14,275,758.79 |

## 2.24 රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි වඩාත් කාර්යක්ෂම හා ගුණාත්මක සේවා සැපයීමක් සඳහා **ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය** විසින් ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. රාජ්‍ය, අධ්‍යාපන, සේවා හා නිෂ්පාදන, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හා ප්‍රජා යන අංශ, ඵලදායිතා සංකල්ප තුළින් පෝෂණය කිරීම සඳහා වාර්ෂිකව විවිධ වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක වන අතර, ආසියානු ඵලදායිතා සංවිධානයේ (APO) නිරන්තර සහයෝගිතාව තුළින් "දැනුම කේන්ද්‍රික සමාජයක්" බිහිකිරීමට අවශ්‍ය පරිසරය නිර්මාණය වී ඇත.

සේවාලාභින් ආයතන පරිශ්‍රය තුළ රැඳී සිටීමේ කාලය අවම කිරීම සඳහා සුදුසු ක්‍රමවේද සැකසීමත්, ඒ තුළින් ආයතනික කාර්යක්ෂමතාවය සහ සඵලතාවය ඉහළ නැංවීමත් සහ සතුටුදායක හා කාර්යක්ෂම පාරිභෝගික සේවා ක්‍රියාවලි වර්ධනය කිරීම සඳහා වර්තමානයේ භාවිතා වන පාරිභෝගික සේවා ක්‍රියාවලි විශ්ලේෂණය කිරීම, පාරිභෝගික හා සේවක තෘප්තිය පිළිබඳ සංගණනයක් සිදුකිරීම, ඉහළ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා සිදුකිරීම හා ක්‍රියාවලි සංශෝධන ඇතුළත් වාර්තාවක් ඉහළ කළමනාකාරීත්වය වෙත යොමුකිරීම තුළින් අදාළ වැඩිදියුණු කිරීම් සිදුකරනු ලැබේ.

2023.01.01 සිට 2023.09.30 දක්වා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පහත පරිදි වේ.

වගුව **2.24** - ක්‍රියාත්මක කරන ලද ඵලදායිතා වැඩසටහන්හි ප්‍රගතිය - ජා.ඵ.ලේ.කා.

| උප ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රගතිය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ ඵලදායිතාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | 3 වන කාර්තුවට වියදම් ඇස්තමේන්තු කර නැත | පවත්වන ලද මොඩියුල සංඛ්‍යාව | 100% |
| කෙටිකාලීන පුහුණු වැඩසටහන් | 0% | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | 50% |
| රාජ්‍ය අංශයේ මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් සඳහා ඵලදායිතාවය පිළිබඳ පුහුණු වැඩසටහන | 100% | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | 100% |
| KPI දර්ශකය සැකසීම පිළිබඳ නියමු ව්‍යාපෘතිය | 100% | | 100% |
| ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයීය කාර්ය මණ්ඩලය තත්ව පාලන කව විනිශ්චයකරුවන් ලෙස පුහුණු කිරීම | 98% | | 100% |
| ඵලදායිතා සංවර්ධන නිලධාරින් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 77% | | 100% |

ශ්‍රී ලංකාව ආසියානු ඵලදායිතා සංවිධානයේ සාමාජික රටක් වන බැවින්, වාර්ෂිකව එම සංවිධානය හා එක්ව විවිධ වැඩසටහන්, වැඩමුළු හා ව්‍යාපෘති සිදුකරනු ලබයි. ඒ අනුව 2023 වසරේදී ක්‍රියාත්මක වැඩසටහන් පහත පරිදි වේ.

වගුව **2.25** - ආසියානු ඵලදායිතා සංවිධානයේ අනුග්‍රාහකත්වයෙන් ක්‍රියාත්මක කරන ලද ඵලදායිතා වැඩසටහන්හි ප්‍රගතිය - ජා.ඵ.ලේ.කා.

| | උප ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රගතිය | කාර්යසාධන දර්ශක | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1 | වැඩමුළු හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | දේශීය අරමුදල් භාවිතා නොවේ | සහභාගි වූ සංඛ්‍යාව | 94% |
| 2 | ඵලදායිතාවය පිළිබඳ පර්යේෂණ සිදුකිරීම | | පර්යේෂණ සංඛ්‍යාව | 100% |
| 3 | විශේෂ ව්‍යාපෘති සිදුකිරීම | | ක්‍රියාත්මක ව්‍යාපෘති සංඛ්‍යාව | 100% |
| 4 | 5S සහතිකකරණ වැඩසටහන | 52% | | 100% |
| 5 | කොළඹ දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල සහ රෝහල් සඳහා ඵලදායි සෞඛ්‍ය සේවාවක් සැපයීම | 100% | වැඩසටහන් 56ක් පවත්වා ඇත | |
| 6 | ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් සිදුකිරීම | 103% | ආයතන 18ක් සඳහා වැඩසටහන් 97ක් පවත්වා ඇත<br>සහතික පත්‍ර පාඨමාලා 3ක් පවත්වා අවසන් කර ඇත. | |
| 7 | මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන් සිදුකිරීම | 96% | මාර්ගගත ක්‍රමය මගින් නොමිලේ පවත්වන Webinar වැඩසටහන් 10ක් පවත්වා අවසන් කර ඇති අතර, රත්නපුර දිස්ත්‍රික්කය තුළ පවත්වන ලද සහතික පත්‍ර පාඨමාලාව තුළින් සුදුසුකම් ලත් පිරිස් 40 දෙනෙකු සඳහා සහතික පත් ලබාදීම | |
| 8 | දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් වෙත අනුයුක්ත ඵලදායිතා සංවර්ධන නිලධාරින් ගේ කාර්ය සාධන පරික්ෂාව සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | 100% | ප්‍රගති සමාලෝචන රැස්වීම් 8ක් පවත්වා ඇත. | |
| 9 | ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය හා සම්බන්ධව පුහුණු වැඩසටහන් පැවැත්වීම, උපදේශනය, ප්‍රවර්ධනය හා අත්දැකීම් හුවමාරු වැඩසටහන් පැවැත්වීම | 99% | රාජ්‍ය අංශයේ ආයතන වල සේවා කාර්යක්ෂමතාව වර්ධනය උදෙසා ක්‍රියාවලි වැඩිදියුණු කිරීම හා සම්බන්ධ පුහුණු වැඩසටහන් තුනක් සහ ඵලදායිතා සම්මාන තරඟාවලියට අදාලව සේවා හා නිෂ්පාදන සහ පාසැල් යන අංශ සඳහා නිර්ණායක සංශෝධනය කිරීමේ වැඩසටහන් 4ක් පවත්වා ඇත | |

වගුව **2.26** - ක්‍රියාත්මක කරන ලද ඵලදායිතා වැඩසටහන්හි ප්‍රගතිය - ජා.ඵ.ලේ.කා.

| | ව්‍යාපෘතිය | ප්‍රගතිය |
|---|---|---|
| 01 | බදුල්ල දිස්ත්‍රික්කයේ ආරක්ෂිත ආහාර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා ගුණාත්මක කොම්පෝස්ට් සහ ස්වභාවික පත්‍ර පෝෂක නිෂ්පාදනය හා භාවිතය | කාබනික පොහොර නිෂ්පාදනය හා සම්බන්ධ ව්‍යවසායකයින් 98 දෙනෙකු මෙම ව්‍යාපෘතිය තුලින් සවිබල ගැන්වී ඇති අතර, මල්ට් චොපර් යන්ත්‍ර 16ක් මිලදී ගෙන ගොවීන් වෙත ලබාදී ඇත.<br>දියර පොහොර නිෂ්පාදිත ව්‍යවසායකයින් 6 දෙනෙකුද ලෙස ව්‍යවසායකයින් 98 දෙනෙකු සවිබල ගන්වා ඇත.<br>මේ සඳහා ඇ.එ.ජ.ඩො.30,432 වැයකර වැඩ අවසන් කර ඇත. |

| | | |
|---|---|---|
| 02 | තෙල්දෙණිය මූලික රෝහලේ ගුණාත්මක කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම | වාට්ටු, සායන, බාහිර රෝගී අංශය, රසායනාගාර, විකිරණ අංශය, ශල්‍යාගාර යනාදිය ඩිජිටල්කරණය කර ඇත. පද්ධති ජාලගත කර ඇත. ඵලදායිතා සංකල්ප ඇතුලත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙහි වැඩ අවසන් කර ඇති අතර, ඇ.එ.ජ.ඩො. 21,565 වැයවී ඇත. |
| 03 | ධාරිතා සංවර්ධනය තුළින් තිරසාර අගය එකතු කිරීමේ දාම සඳහා ආහාර සුරක්ෂිතතාවය හා ගුණාත්මකභාවය වර්ධනය - ගම්පහ දිස්ත්‍රික්කය | මෙම ව්‍යාපෘතිය මගින් කිරි හා මාංශ, එළවළු හා පළතුරු, ධීවර, සුළු අපනයන භෝග සහ පොල් සංවර්ධන යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ආයතන 08ක ආහාර සුරක්ෂිතතාවය හා ගුණාත්මකභාවය වර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.<br>ආසියානු ඵලදායිතා සංවිධානය, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආහාර විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව, කාර්මික තාක්ෂණ ආයතනය යන ආයතනයන්හි සම්පත් දායකත්වය මත මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.<br>මෙම ව්‍යාපෘතියෙහි වැඩ තවමත් අවසන් වී නොමැති අතර, ආහාර සුරක්ෂිතතා අත්පොත, ආයතනවල ප්‍රගතිය ඇතුලත් වීඩියෝව හා ආයතනයේ ගමන් මග ඇතුලත් අත්පොත යන අයිතමයන්හි වැඩ අවසන් කිරීමට නියමිතව ඇත. ඇ.එ.ජ.ඩො 18,090ක වියදමක් දැරීමට අපේක්ෂිතය. |
| 04 | ආහාර සුරක්ෂිතතා කළමනාකරණය පිළිබඳ තාක්ෂණික විශේෂඥ සේවා වැඩසටහන (Technical Expert Service Program) | ආහාර සුරක්ෂිතතා කළමනාකරණය හා සම්බන්ධ සහභාගිවන්නන් 50 දෙනෙකුගේ දායකත්වය තුළින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර, සම්පත් දායකත්වය ආසියානු ඵලදායිතා සංවිධානයේ උපදේශක Yong Kok Seng මහතා විසින් සිදුකරන ලදී.<br>මේ සඳහා දේශීය අරමුදල් රුපි. 496,801.00ක මුදලක් දරන ලදී. |
| 05 | ඵලදායිතාවය පිළිබඳ ප්‍රධාන සැලසුම (Master Plan) සැකසීම | ආසියානු ඵලදායිතා සංවිධානය සහ කොරියානු සංවර්ධන ආයතනයේ දායකත්වය මත මෙම කාර්යය සිදුකෙරෙන අතර, මේ සඳහා අවශ්‍ය මූලික දත්ත සම්පාදනය කරමින් පවතී |

## 2.25 ශ්‍රමිකයින්ගේ සුභසාධනය

**ශ්‍රම වාසනා අරමුදල** මගින් කම්කරු ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා සුභසාධන වැඩසටහන් පවත්වනු ලැබේ. මේ යටතේ ශ්‍රම වාසනා අරමුදල මගින් අක්ෂි කඳවුරු, වෛද්‍ය කඳවුරු, මියගිය සේවකයින්ගේ පවුල්වල පාසල් දරුවන්ට ශිෂ්‍යත්ව, පාසල් උපකරණ, ජීවනෝපාය ආධාර සඳහා තාක්ෂණික අධ්‍යාපනය සහ අනෙකුත් සුභසාධන වැඩසටහන් දිවයින පුරා පවත්වනු ලැබේ.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ශ්‍රම වාසනා අරමුදල මගින් ප්‍රජාවගේ සුභසාධනය සඳහා පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

වගුව **2.27** කම්කරු ප්‍රජාව සඳහා සුභසාධක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම -ශ්‍ර.වා.අර.

| | | භෞතික ඉලක්ක | භෞතික ප්‍රගතිය | මූල්‍ය ඉලක්ක (මිලියන) | මූල්‍ය ප්‍රගතිය (මිලියන) |
|---|---|---|---|---|---|
| 01 | සුබසාධන වැඩසටහන් | 02 | 01 | 0.5 | 0.41 |
| 02 | අධ්‍යාපන ආධාර | 07 | 04 | 14.5 | 9.07 |
| 03 | දැණුවත් කිරීමේ වැඩසටහන් | 45 | 39 | 0.38 | 0.24 |
| 04 | වෛද්‍ය කඳවුරු | 1000 | 813 | | |
| 05 | Alternative Employment | 100 | 100 | | |
| 06 | වෛද්‍යාධාර ලබා දීම | 10 | 11 | 0.5 | 0.5 |
| 07 | නීති ආධාර ලබා දීම | 50 | 33 | 1.1 | 0.50 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 08 | මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන | 100 | 57 | 7 | 3.80 |
| 09 | ප්‍රවර්ධන ප්‍රචාරණ | 4 | 2 | 0.64 | 0.10 |

ශ්‍රම වාසනා අරමුදල 2022 වසර වූ 5S, තත්ත්ව පාලන සහතිකය 2023 දී ලබා ගන්නා ලදී. දැනට කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයට එය හිමි වූ පළමු අවස්ථාව මෙය වේ.

## 2.26 විදේශ රැකියා සඳහා ශ්‍රමිකයින් යොමු කිරීම

**ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්.) සමාගම** විසින් විදේශ රැකියා සඳහා පුද්ගලයින් යොමු කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව, 2023 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා විදේශ ගත වූ ශ්‍රමිකයින් සංඛ්‍යාව 569ක් වේ.

වගුව **2.28** - විදේශගත වූ ශ්‍රමිකයින් සංඛ්‍යාව - ශ්‍රී.ලං.වි.ර.ඒ.(පුද්).ස.

| තනතුර | සයිප්‍රසය | සිංගප්පූරුව | රුසියාව | සර්බියාව | ඇමරිකාව | කොරියාව | ජපානය | මැලේසියාව | රුමේනියා | කුවේට | ජෝර්දානය | සෞදි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගෘහ පාලිකා | 161 | | | | | | | | | | | | |
| කම්කරු | 05 | | | | | | | | | | | 01 | |
| අරක්කැමි | 09 | | | | | | | | 03 | | | | |
| සහායක | | | | | | | | | | | | 01 | |
| වෑදුම් ශිල්පි | 02 | | | | | 221 | | | | | | | |
| හෝටල් ආශ්‍රිත | | 01 | | | | | | | 01 | | | | |
| ඉංජිනේරු | | | | | | | 01 | | | | | | |
| ආහාර සකසන්නන් | 03 | | | | | | 09 | | | | | | |
| වේටර් | 01 | | | | | | | | 02 | | | | |
| රියදුරු | | | | | | | | | | 6 | | 05 | |
| ස්වීට් මේකර් | | | | | | | | | | 01 | | | |
| කේක් හැඩකරන්නන් | | | | | | | | | | 02 | | | |
| ජුකී මැෂින් ක්‍රියාකරවන්නන් | | | 58 | 14 | | | | | | | | | |
| කෘෂිකාර්මික කම්කරු | | | | | | | | | | | 46 | | |
| හෙදියන් | | 10 | | | 02 | | | | | | | | |
| රෙදිපිළි පිරිසිදුකරන්නන් | | | | | | | | | | | | 01 | |
| යතුරුපැදි ක්‍රියාකරවන්නන් | | | | | | | | | 01 | | | | |
| රෙස්ටුරන්ට් වර්කර්ස් | | | | | | | | 02 | | | | | |
| **එකතුව** | **181** | **11** | **58** | **14** | **02** | **221** | **10** | **02** | **07** | **09** | **46** | **08** | **569** |

## 2.27 සුනිසි මෙහෙවර වැඩසටහන

සංවර්ධනය කරා යන මාර්ගයට ශ්‍රී ලංකාව අවතීර්ණ වීමට නම් යහපත් රැකියා ප්‍රවර්ධනය කළ යුතු වේ. මෙමඟින් නිදහස, සාධාරණත්වය, ආරක්ෂාව හා මානව ගරුත්වය යන තත්ත්වයන් තුළ ඵලදායී වැඩ ලබා ගැනීමට කාන්තාවන්ට හා පිරිමින්ට සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිතය. එසේම, රැකියා නිර්මාණය කිරීම පමණක් අපේක්ෂා නොකරන අතර එම නිර්මාණය කෙරෙන රැකියා පිළිගත හැකි තත්ත්වයේ ඒවා විය යුතු වීම විශේෂත්වයකි. සුනිසි මෙහෙවර වැඩසටහන ප්‍රධාන ස්ථම්භයන් හතරක් තුළ ක්‍රියාත්මක වේ. එනම්, රැකියා උත්පාදනය, ප්‍රවර්ධනය හා ජාතික ඵලදායීතාව, වැඩබිමෙහි හිමිකම, සමාජ ආරක්ෂණය සහ සමාජ කතිකාවත. මෙම ප්‍රධාන ස්ථම්භ 4ට අමතරව ඵලදායිතා ප්‍රවර්ධනය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය තහවුරු කිරීම යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සෑම අංශයක්ම සම්බන්ධීකරණය කරනු ලැබේ.

සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 14.1ක් පහත සඳහන් ආයතනවලට වෙන් කර විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

වගුව **2-29 -** සුනිසි මෙහෙවර වැඩසටහන ක්‍රියාත්මක කිරීම

| | ආයතනය | වෙන් කර ඇති ප්‍රතිපාදනය (රු) | උපයෝජනය කරන ලද ප්‍රමාණය (රු.) | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 01 | **කම්කරු දෙපාර්තමේන්තුව** | | | |
| i | කාන්තා හා ළමා කටයුතු අංශය | 3,723,845.00 | 2,332,022.92 | **63%** |
| ii | මානව සම්පත් සංවර්ධන අංශය | 5,802,500.00 | 2,147,535.28 | **37%** |
| iii | කර්මාන්තමය සුරක්ෂිතතා අංශය | 1,930,000.00 | 25,000.00 | **01%** |
| v | සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය | 620,000.00 | 620,000.00 | **100%** |
| 02 | **ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය** | 2,090,000.00 | 1,729,960.00 | **17%** |
| | **මුළු එකතුව** | 14,166,345.00 | 6,854,518.20 | **52%** |




**ඡායාරූපය 2.11 -** අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල දරුවන් සඳහා පාසල් උපකරණ ප්‍රදානය - ශ්‍ර. වා. අර.

## 2.28 සැලසුම්, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු

- තරුණ තරුණියින්ට දේශීය විදේශීය රැකියා අවස්ථා, වෘත්තීය මාර්ගෝපදේශනය හා පුහුණුව ලබා දීම, මහජනතාවට ඇති කම්කරු ගැටලු සඳහා විසඳුම් ලබා දීම ඇතුළු තවත් සේවාවන් රැසක් ලබා දීම සඳහා රාජ්‍ය හා පෞද්/ලික අංශයේ ආයතන රැසක සහභාගීත්වයෙන් "GLOCAL FAIR – 2023" ජංගම සේවා වැඩසටහන මෙම වර්ෂයේ ජූලි 15 හා 16 දෙදින පුරාවට යාපනය "මුට්‍රවේලි" ක්‍රීඩාංගණයේ දී සාර්ථකව පවත්වන ලදී.

- මෙම අමාත්‍යාංශය විසින් වාර්ෂිකව කම්කරු ක්ෂේත්‍රයේ විවිධ කාලෝචිත තේමාවන් පාදක කර ගනිමින් පර්යේෂණාත්මක ලිපි අඩංගු කරමින් ජර්නලයක් ප්‍රකාශයට පත් කරයි. ඒ අනුව, 2023 වර්ෂයේ "Protecting and Comforting Workers"යන තේමාව පදනම් කර ගනිමින් පර්යේෂණාත්මක ලිපි කැඳවීම සිදු කර අවසන් අතර ඒවා කම්කරු විෂය පිළිබඳ හසළ දැනුමැති විද්වත් කමිටුවක් විසින් ඇගයීම් කටයුතු සිදු කරමින් පවතින අතර, අනතුරුව ජර්නලයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

## 2.29 පාලන සහ ආයතන කටයුතු

- 2023 ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා මෙම අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 35ක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර ඉන් 19ක් සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ ලැබී ඇත.
- මහජන පැමිණිලි 389ක් සමාලෝචිත කාලය තුළ ලැබී ඇති අතර සියල්ල ඉදිරි පියවර ගැනීම සඳහා අදාළ අංශ වෙත යොමු කර ඇත. එම අංශවලින් පිළිතුරු වාර්තා 237ක් ලැබී ඇත
- තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉල්ලීම් 19ක් ලැබී ඇති අතර සියලුම ඉල්ලීම් සම්බන්ධයෙන් තොරතුරු ලබා දී ඇත. Verite Research ආයතනය විසින් සිදු කරන ලද තක්සේරු කිරීම අනුව තොරතුරු දැනගැනීමේ අයිතියට අදාළ හෙළිදරව්කිරීම් සම්බන්ධයෙන් කාර්යක්ෂම ලෙස ක්‍රියා කිරීම හේතුවෙන් රාජ්‍ය ආයතන 31 අතරින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය 10 වන ස්ථානයට තේරී පත්ව ඇත.
- විවිධ ආයතන මඟින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සඳහා අමාත්‍යාංශ නිලධාරීන් 80ක් සමාලෝචිත කාලය තුළ සහභාගි කරවා ඇත. පෞද්ගලික ලිපි ගොනු කළමණාකරණය, ව්‍යාපෘති වාර්තා සැකසීම, බැහැරගත නායකත්ව හා පෞරුෂ සංවර්ධන වැඩමුළු සහ පශ්චාත් උපාධි පාඨමාලා වැනි පාඨමාලාවන් සඳහා මෙම නිලධාරීන් යොමු කරවා ඇත.
- අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශයෙහි සේවයේ නියුක්ත සංවර්ධන නිලධරයන් 769ක් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙම පුහුණු වැඩසටහන්, වත්මන් විදේශ රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම, පවුල් පසුබිම් වාර්තා නව චක්‍රලේඛය පිළිබඳ දැනුවත් කිරීම හා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් වශයෙන් පවත්වා ඇත.
- විදේශීය ශිෂ්‍යත්ව වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සඳහා මෙම අමාත්‍යාංශයට අදාළ සියලුම ආයතන සහ දෙපාර්තමේන්තුවල නිලධාරින් සහභාගි කිරීමට පියවර ගෙන ඇත. 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාල සීමාව තුළ නිලධාරින් 49ක් විදේශ පුහුණු පාඨමාලා සහ වැඩමුළු සඳහා සහභාගි කරවා ඇත
- මීට අමතරව, සමාලෝචිත කාල සීමාව තුළ පහත ආයතනික කාර්යයන් සිදු කරන ලදී

වගුව **2.30** ආයතන කටයුතුවල ප්‍රගතිය

| අ.අං. | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න සඳහා පිළිතුරු | 14 |
| 02 | මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ වාර්තා | 1 |
| 03 | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම | 12 |
| 04 | පාර්ලිමේන්තුවට වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම | 13 |
| 05 | අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ | 15 |

## 2.30 අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය

වගුව **2-31** භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ප්‍රගතිය

| | ආයතනය / අංශය | වැය විෂය | | ශුද්ධ ප්‍රතිපාදනය (රු. 000') | වියදම (රු. 000') | ඉතිරි ප්‍රතිපාදනය (රු. 000') | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|
| 1 | අමාත්‍යාංශ කාර්යාලය - කම්කරු අංශය | 193 | පුනරාවර්තන | 316,886 | 186,011 | 130,875 | 59 |
| | | | මූලධන | 28,100 | 6,345 | 21,755 | 23 |
| | අමාත්‍යාංශ කාර්යාලය - විදේශ රැකියා අංශය | | පුනරාවර්තන | 732,996 | 512,103 | 220,893 | 70 |
| | | | මූලධන | 321,100 | 176,662 | 144,438 | 55 |
| 2 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | | පුනරාවර්තන | - | - | - | |
| | | | මූලධන | - | - | - | |
| 3 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය | | පුනරාවර්තන | - | - | - | |
| | | | මූලධන | - | - | - | |
| 4 | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | | පුනරාවර්තන | 553,220 | 357,731 | 195,489 | 65 |
| | | | මූලධන | 43,800 | 13,967 | 29,833 | 32 |
| 5 | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | | පුනරාවර්තන | 42,770 | 28,593 | 14,177 | 67 |
| | | | මූලධන | 11,000 | 3,002 | 7,998 | 27 |
| | උප එකතුව | | පුනරාවර්තන | **1,645,872** | **1,084,438** | **561,434** | **66** |
| | | | මූලධන | **404,000** | **199,976** | **204,024** | **49** |
| 6 | කම්කරු දෙපාර්තමේන්තුව | 221 | පුනරාවර්තන | 2,596,647 | 1,791,948 | 804,699 | 69 |
| | | | මූලධන | 1,510,000 | 76,023 | 1,433,977 | 5 |
| 7 | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 328 | පුනරාවර්තන | 537,660 | 409,449 | 128,211 | 76 |
| | | | මූලධන | 35,500 | 18,257 | 17,243 | 51 |
| | එකතුව | | පුනරාවර්තන | **4,780,179** | **3,285,835** | **1,494,344** | **69** |
| | | | මූලධන | **1,949,500** | **294,256** | **1,655,244** | **15** |
| | මුළු එකතුව | | | **6,729,679** | **3,580,091** | **3,149,588** | **53** |

# තෙවන පරිච්ඡේදය

## ඉදිරි සැලසුම් සහ වැඩසටහන්

## අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් සහ වැඩසටහන්

වර්තමාන ජාතික හා ජාත්‍යන්තර සමාජ ආර්ථික තත්වයන්ට අනුකූල වන අයුරින් සහ ශ්‍රී ලංකාව තුළ ආයෝජන හිතකාමී වාතාවරණයක් ඇති කිරීම උදෙසා නෛතික ප්‍රතිපාදන ඇති කිරීම අමාත්‍යාංශය සතු කාලීන වගකීමකි. එහි දී පවතින අණ පනත්, නීති රීති වර්තමාන වැඩ ලෝකයට ගැලපෙන අයුරින් සංශෝධනය කරන අතරම වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ද මෙම අමාත්‍යාංශය බැඳී සිටියි. එසේම, විදේශ රැකියා වෙළඳපළ සඳහා නව තාක්ෂණික දැනුම සහ කුසලතාවයන් සහිත නිපුණතා පූර්ණ ශ්‍රමිකයන් යොමු කිරීම ප්‍රධාන අරමුණ කොට ගෙන සාම්ප්‍රදායික විදෙස් ශ්‍රම වෙළඳපළ ඇති රටවලට අමතරව, නව ශ්‍රම වෙළඳපළ වෙත ශ්‍රමිකයන් යැවීම හා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ග්‍රහණය කර නොගත් රටවල් සඳහා ශ්‍රමිකයන් යොමු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. ඒ සඳහා අමාත්‍යාංශය විසින් ඉදිරි සැලසුම් සහ ක්‍රියාකාරකම් සකස් කිරීමේ දී පහත කරුණු පිළිබඳව අවධානය යොමු කර ඇත.

- අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු
- 2022/07/22 දිනැති අංක 2289/43 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් හා කර්තව්‍යයන්
- අමාත්‍යාංශයට අදාළ තිරසාර සංවර්ධන අරමුණු
- කම්කරු හා විදේශ රැකියා ක්ෂේත්‍රයන්ට අදාළව ශ්‍රී ලංකාව එකඟ වී ඇති ජාත්‍යන්තර සම්මුතීන් හා එකඟතාවල ඇතුලත් කරුණු

## 3.1 කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

### 3.1.1 කම්කරු හා විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ නීතිමය රාමුව ශක්තිමත් කිරීම

යල්පැන ගිය කම්කරු නීති වර්තමාන වැඩලෝකයට ගැලපෙන ආකාරයට සහ පනත් අතර පවතින සංකීර්ණතා ඉවත් කර සරල කරමින් සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ සහතික කිරීම සඳහා කිරීමේ දැඩි අවශ්‍යතාවයක් මතුව ඇති බව හඳුනාගෙන ඇත. එමෙන්ම, විදේශ රැකියා ක්ෂේත්‍රයේ වර්තමාන ප්‍රවණතාවයන්ට අනුකූල වන පරිදි මෙරට නීතිමය හා ප්‍රතිපත්තිමය රාමුව සකස් කළ යුතු වේ. ඒ සඳහා වන මූලික ප්‍රතිපත්තිමය තීරණ මේ වන විට ගෙන ඇති අතර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග සිදු කරමින් පවතී.

- **වර්තමාන සමාජ ආර්ථික පරිසරයට ගැලපෙන ප්‍රතිපාදන සහිතව නව සේවා නියුක්ති පනතක් සකස් කිරීම**

කම්කරු අණපනත් සංශෝධනය කිරීමේ කටයුතු මේ වන විටත් අරඹා ඇති අතර වර්තමාන වැඩ ලෝකයට ගැලපෙන ආකාරයට සරල කම්කරු නීතියක් සකස් කිරීම සඳහා වෘත්තීය සමිති, හාම්පුතුන් සහ විවිධ පාර්ශවකරුවන් සමග සාකච්ඡා වාර ගණනාවක් පවත්වා එම අදහස් මත සේවා නියුක්ති පනත් කෙටුම්පතක් සකස් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය. ඒ අනුව, පනත් අතර පවතින විෂමතා ඉවත්කරන අතරම නම්‍යශීලී සේවා කොන්දේසි ආදිය ඇතුලත් කර දළ කෙටුම්පතක් සකස්කර ඇත. එහි දී දැනුම් ක්‍රියාවලිය බාහිරින් සපයා ගැනීමේ (KPO) ආයතන ව්‍යාපාර ක්‍රියාවලිය බාහිරින් සපයා ගැනීමේ (BPO) ආයතන සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් ව්‍යාපාර (ICT Enabling Services) ආවරණය වන පරිදි හා එම ආයතනවල කාන්තා සේවිකාවන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ප්‍රතිපාදන ඇති කිරීම තුළින් සහ කාන්තා සේවා නියුක්තිය වැඩි කිරීමට ද අපේක්ෂිතය. ඒ අනුව, මෙම කාර්යය සඳහා පත්කළ විශේෂ කමිටුව විසින් පනත් කෙටුම්පත සකස් කරමින් පවතී.

- **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය**

විදේශ රැකියා ක්ෂේත්‍රයේ වර්ධනය, ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළ වෙනස්වීම්වලට අනුගත වන පරිදි විදේශ රැකියා ක්ෂේත්‍රය විධිමත් කිරීම, පවතින නෛතික රාමුව ශක්තිමත් කිරීම, ජාත්‍යන්තර බැඳීම්වලට අනුගත වීම සඳහා සහ දේශීය වශයෙන් නීති ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

- **ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ පනත සංශෝධනය**

ශ්‍රී ලංකාවේ වෘත්තීය ආරක්ෂණ සංස්කෘතියක් ඇති කර සුරක්ෂිත, සෞඛ්‍ය සම්පන්න හා වෘත්තීය අනතුරු අවම වන වැඩ පරිසරයක් ඇති කිරීම සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතන පනත සංශෝධනයට අපේක්ෂා කෙරේ.

  - ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය කළමනාකරණ පද්ධතිය ජාතික ප්‍රමිතියක් ලෙස පුද්ගලික අංශයේ ආයතන තුළ ක්‍රියාත්මක කිරීම
  - අදාළ කාර්යයන් ඉටු කිරීම හා නියාමනය කිරීම මඟින් වෘත්තීය සෞඛ්‍ය පිළිබඳ ප්‍රමිතීන් අත්කරලීමට හැකිවන පරිදි සුරක්ෂිතතා නිලධාරීන් පුහුණු කිරීම හා බලගැන්වීම
  - සුරක්ෂිතතා නිලධාරීන්ගේ අවම සුදුසුකම් නීර්ණය කිරීම
  - පුද්ගල ආරක්ෂණ උපකරණ සපයන ආයතන නියාමනය කරමින් ප්‍රමිතීන් ස්ථාපනය හා නියාමනය
  - ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වය සඳහා වන මධ්‍යස්ථානයක් (Center for Excellence) ලෙස සංවර්ධනය කිරීම

එමඟින් සෞඛ්‍ය ආරක්ෂිත වැඩ පරිසරයක් තුළ සුරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් ඇති කිරීමට අවශ්‍ය මානව සම්පත ගොඩ නැගීම මෙන්ම ආදායම් ලබන මාර්ගයන් උත්පාදනය කිරීමටද අපේක්ෂිතය.

- **ශ්‍රම වාසනා අරමුදල් පනත සංශෝධනය**

සිදු කරනු ලබන සුභසාධන කාර්යයන් තව දුරටත් පුළුල් කිරීම සඳහා සේවා නියුක්තිකයා යන අර්ථ නිරූපණය තුළට දෛනික වැටුප් ලබන සේවකයින් ඇතුලත් වන සේ ශ්‍රම වාසනා අරමුදල් පනත සංශෝධනය කිරීමට නියමිතය.

### 3.1.2 විගමනික ශ්‍රමිකයින් එතෙර රැකියාවෙන් උපයන මුදල් නීත්‍යානුකූල මාර්ග ඔස්සේ මෙරටට ප්‍රේෂණය කිරීම දිරි ගැන්වීම

- **විදේශ ප්‍රේෂණ මත පදනම්ව බහුවිධ ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම**

විගමනික ශ්‍රමිකයන් විසින් එවන ලද ප්‍රේෂණ ප්‍රමාණය මත පදනම්ව රු. මි. 2 දක්වා උපරිමයකට යටත්ව සහනදායී පොළී අනුපාතිකයක් යටතේ ණය ලබා ගැනීමේ පහසුකම සලසා දීමට අපේක්ෂිතය. මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව හා මෙරට බැංකු පද්ධතියේ සම්බන්ධීකරණයෙන් ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

- **විදේශ ප්‍රේෂණ මත පදනම්ව අතිරේක තීරු බදු දීමනාවක් ලබා දීම**

විගමනික ශ්‍රමිකයන්, නැවත මෙරටට පැමිණෙන අවස්ථාවන්හි දී ගුවන් තොටුපළ තීරු බදු රහිත සාප්පු සංකීර්ණයේදී මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා විදේශගත වී සිටින කාල සීමාව පදනම් කරගෙන දැනට දෙනු ලබන තීරු බදු දීමනාවට අමතරව ඔවුන් එවන විදේශ විනිමය ප්‍රේෂණ ප්‍රමාණය මත පදනම්ව අතිරේක තීරු බදු දීමනාවක් ලබා දීම. මේ සඳහා චක්‍රලේඛ ප්‍රතිපාදන ඇති කර ඇති අතර පුළුල් දැනුවත් කිරීමක් සිදු කළ යුතු වේ.

### 3.1.3 ශ්‍රමිකයන් සඳහා නව සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දීම

වර්තමානයේදී සෞඛ්‍ය හා වෘත්තිය ආරක්ෂණ ප්‍රතිලාභ, මාතෘ ප්‍රතිලාභ, සේවා වියුක්ති ප්‍රතිලාභ, සේවක වන්දි ප්‍රතිලාභ සේවායෝජකයා විසින් දැරිය යුතු වේ. එම ප්‍රතිලාභ සේවායෝජකයාට අමතර බරක් නොවන පරිදි ලබා දීම සඳහා මෙන්ම සමාජ ආරක්ෂණය සහ රැකියා විරහිත වූවන්

සඳහා රක්ෂණ පහසුකම් සැපයීම සඳහා නව ක්‍රමවේදයන් හඳුන්වා දිය යුතු අතර මේ වන විට ඒ සම්බන්ධ අධ්‍යයනයක් ආරම්භ කර ඇත.

### 3.1.4 ශ්‍රී ලංකාවේ සමස්ත ශ්‍රම බලකාය (රාජ්‍ය සේවයේ නියුතු වූවන් හැර) සම්බන්ධයෙන් ඩිජිටල්කරණය කළ ජාතික ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කිරීම

නම්‍යශීලී ක්‍රියාපටිපාටි, ඩිජිටල් හා ස්වයංක්‍රීය විසඳුම් හරහා සේවා සේවක දෙපක්ෂයටම පහසුවෙන් ප්‍රවේශ විය හැකි මෙන්ම, අඩු වැයකින් විනිවිදභාවයෙන් යුතුව අවශ්‍ය සේවාවන් සැපයීම අරමුණු කරගෙන ජාතික ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ඇති කිරීමට අපේක්ෂිතය. මෙමඟින් කම්කරු දෙපාර්තමේන්තුව මඟින් ලබාදෙනු ලබන සේවාවන් ඩිජිටල්කරණය කරන අතරම හඳුන්වාදෙන ඒකාබද්ධ වේදිකාවක් (Unified platform) හරහා මෙම අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති සියලු ආයතන හරහා සේවාවන් හා සම්බන්ධ වන විවිධ සේවාවන් සපයන අමාත්‍යාංශ / රාජ්‍ය ආයතන සමඟ නිසි සම්බන්ධීකරණයක් ඇති කිරීමට අපේක්ෂිතය. එහිදී සේවාලාභීන් සඳහා අනන්‍ය වූ හඳුනාගැනීමේ අංගයක් යටතේ විද්‍යුත් වැටුප් ගෙවීම, සේවා වියුක්තිකයන් සඳහා රක්ෂණ ක්‍රම, මාතෘ ප්‍රතිලාභ වන්දි ප්‍රදානයන් හා රැකියා වියුක්තිය ආදී සියලු තොරතුරු රැස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

### 3.1.5 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඩිජිටල්කරණය

ශ්‍රී ලංකා රජයට ශුන්‍ය පිරිවැයක් යටතේ යටතේ ශ්‍රී ලංකා ඒකාබද්ධ විදේශ ස්ථානගත කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර එහිදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මුහුණ දෙන පහත සඳහන් අභියෝගයන් ආමන්ත්‍රණය කිරීමට අපේක්ෂිතය.

- විගමනික ශ්‍රමිකයන් සූරා කෑම සහ අපයෝජනය කිරීම
- මිනිස් ජාවාරම
- නීති විරෝධී බඳවා ගැනීමේ පිළිවෙත්
- බඳවා ගැනීමේ නියෝජිතයන් හා නියෝජිතායතන නිරීක්ෂණය සඳහා නිසි ක්‍රමවේදයක් නොමැතිකම
- අනුමත ක්‍රියාවලියේ ප්‍රමාදයන්
- නීති විරෝධී ප්‍රේෂණ ගැටලු
- විගමණික ශ්‍රමිකයන් සේවා යෝජකයන්, අනෙකුත් පාර්ශවකරුවන්ගේ සමස්ත ක්‍රියාවලිය සහ ගමන නිරීක්ෂණය කිරීම සඳහා තනි මාර්ගගත වේදිකාවක් නොමැතිකම

මේ තුළින් විගමනික ශ්‍රමිකයෙකුගේ හා සියලුම පාර්ශවකරුවන් හෝ සමස්ත ක්‍රියාවලීන් සහ සම්පූර්ණ ගමන කළමනාකරණය හා නියාමනය සඳහා ඩිජිටල් වේදිකාවක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

3.1.6 උපාධි ප්‍රදානය කිරීමේ බලතල හිමි වන පරිදි 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යන ආයතන පනත සංශෝධනය මඟින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස සංශෝධනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳ පූර්ණ අධ්‍යනයක් සිදු කර අමාත්‍ය මණ්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කිරීමට නියමිතය

3.1.7 ශ්‍රමික ප්‍රේෂණ වැඩි වශයෙන් රට තුළට ගෙන්වා ගැනීම සඳහා විදේශ රැකියා සඳහා නව රටවල් / ගමනාන්ත සොයා යාමක් සිදු විය යුතු අතර දියුණු රටවල්වල හෙද සේවය සහ වැඩිහිටි සත්කාර සේවය සඳහා වැඩි ප්‍රවණතාවක් ඇති වී තිබේ. එමෙන්ම කුවේට් රාජ්‍යය, කටාර් රාජ්‍යය, ජපානය වැනි රටවල්වලින් විශේෂ සේවා සඳහා විශාල ඉල්ලුමක් නිර්මාණය වෙමින් පවතී. ඒ අනුව නව රටවල් හා නව ක්ෂේත්‍ර හඳුනා ගැනීමට කටයුතු කිරීම

3.1.8 විදේශ රැකියා සම්බන්ධව නව වෙළඳ පොළ අවස්ථා හඳුනා ගැනීම හා ඒ සම්බන්ධ ගිවිසුම්වලට එළඹෙමින් මැදපෙරදිග මෙන්ම යුරෝපා, ආසියා හා ඇමරිකානු කලාප දක්වා පුළුල් කිරීමට

කටයුතු කිරීම

3.1.9 ගමනාන්ත රටවල් 13ක් සමඟ නව අවබෝධතා ගිවිසුම් 15ක් අත්සන් කිරීමට යෝජිතය. මේ යටතේ කුවේට්, කටාර්, ඕමානය, ලෙබනනය, රුමේනියාව, සයිප්‍රස්, සිංගප්පූරුව, ඉතාලිය, මැලේසියාව, ලක්සම්බර්ගය, මෝල්ටාව, තුර්කිය හා මාලදිවයින යන රාජ්‍යයන් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට යෝජිත ය

3.1.10 E7 කාණ්ඩය යටතේ පැස්සුම්කරුවන් කොරියාව රාජ්‍යයේ විදේශ රැකියා සඳහා යොමු කිරීමට පවතින ඉඩ ප්‍රස්ථා හඳුනා ගැනීම

3.1.11 අනිවාර්ය සේවා කාලය අවසන් කර විශ්‍රාම ගොස් සිටින ත්‍රිවිධ හමුදා නිලධාරීන් විදේශීය පුහුණු රැකියා සඳහා යොමු කිරීම හා අවස්ථාවන් ලබා දීම

3.1.12 රැකියා සඳහා සංක්‍රමණය වන ශ්‍රමිකයන්ගේ සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ ආරක්ෂාව සහ සුභසාධනය සඳහා අමාත්‍යාංශය විසින් දැනට ක්‍රියාත්මක කරමින් පවතින පවුල් සංවර්ධන සැලසුම් හා රැකවරණ සැලසුම් යනාදි වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කරමින් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහ ඵලදායි සහ සුරක්ෂිත සංක්‍රමණය පිළිබඳව ප්‍රාදේශීය මට්ටමේදී දැනුවත් කිරිමේ කටයුතු පුළුල් කිරීම

3.1.13 රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාශයට පත් කිරීම හා මෙම ප්‍රතිපත්තියට අදාළ වන රැකියා සඳහා විගමනය පිළිබඳ ජාතික උපදේශක කමිටුවේ කමිටු රැස්වීම් පැවැත්වීම හා ඊට සමගාමීව ජාතික ප්‍රතිපත්තිය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම

3.1.14 විගමනික ශ්‍රමිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම්, ආරක්ෂාව සහ යහපැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා සංවර්ධන හවුල්කරුවන් සමඟ එක් ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මේ යටතේ, සංවර්ධන හා සහයෝගීතාවය සඳහා වන ස්විස් ඒජන්සියේ දායකත්වයෙන් සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ දායකත්වය ඇති ව ආරක්ෂිත හා විධිමත් ශ්‍රම විගමන වැඩසටහනේ සිව් වන අදියර ක්‍රියාත්මක කිරීම

3.1.15 විදේශගත වීමට අපේක්ෂිත රජයේ නිලධාරීන්ට සහ සෙසු ශ්‍රමිකයින්ට සුරක්ෂිත රැකියා අවස්ථා ලබා දීම සම්බන්ධයෙන් සහාය වීම උදෙසා විශේෂ ව්‍යාපෘතියක් විදේශ රැකියා අංශයේ සම්බන්ධීකරණයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමට ජාලයක් ස්ථාපිත කිරීම (establish a network). මේ සඳහා ඒකාබද්ධ මාර්ගෝපදේශ සහ යොමු කිරීමේ පද්ධතියක් (Integrated Guidance and Referral System –IGRS) ස්ථාපිත කර ඇත. මෙම නියමු ව්‍යාපෘතිය සඳහා මූල්‍ය සහ තාක්ෂණික සහාය සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IOM) විසින් ලබා දී ඇත. පළමු පියවර ආරම්භ කර ඇති අතර ඔක්තෝබර් මාසයේදී මහජනතාව වෙත විවෘත කිරීමට සැලසුම් කර ඇත.

3.1.16 මෙම අමාත්‍යාංශය මඟින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනියුක්තව සේවය කරනු ලබන සංවර්ධන නිලධාරීන් (විදේශ රැකියා) ගේ හැකියා වර්ධනය කිරීම තුළින් ක්ෂේත්‍ර මට්ටමින් විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා යොදවා ගැනීම ශක්තිමත් කිරීම

3.1.17 අදාළ අනෙකුත් අමාත්‍යාංශ හා ආයතනවල සහයෝගය ලබා ගනිමින් නැවත පැමිණෙන විගමනික ශ්‍රමිකයන් දේශිය ශ්‍රම වෙළඳපලට ඒකාබද්ධ කිරීම සඳහා දැනට පවතින ක්‍රමවේදය ශක්තිමත් කිරීම

3.1.18 ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් විගමනික ශ්‍රමික සංගම් පිහිටුවීම මඟින් මෙම අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ මනා සම්බන්ධීකරණයෙන්, රැකියා නිම කර නැවත පැමිණෙන පිරිස් වෙනුවෙන් ප්‍රාදේශීය, දිස්ත්‍රික්

සහ ජාතික මට්ටමෙන් ඒකාබද්ධ යාන්ත්‍රණයක් ඇති කිරීම

3.1.19 ශ්‍රම විගමනිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සමාජය තුළ සවිබල ගැන්වීම හා ඔවුන්ගේ දැනුම, කුසලතා, ආකල්ප වැඩිදියුණු කිරීම හරහා ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස සමාජගත කිරීම, විගමනික ශ්‍රමික සංගම් පිහිටුවීම මඟින් අරමුණු කොට ඇත. මෙහි ආරම්භය වශයෙන් ජාතික මට්ටමේ විගමනික ශ්‍රමික සංගම් සම්මේලනයක් පැවැත්වීම

3.1.20 විගමනික ශ්‍රමිකයින් සහ නැවත පැමිණි ශ්‍රමිකයින් සම්බන්ධයෙන් මුළු රටම ආවරණය වන පරිදි සමීක්ෂණයක් සිදු කිරීම

## 3.2 කම්කරු දෙපාර්තමේන්තුව

3.2.1 සේවකයින්ගේ වේතන, සේවා තත්ත්වයන් සහ සේවා කොන්දේසිවලට අදාළව දැනට ක්‍රියාත්මක කරනු ලබන අණ පනත් 13ක් ඒකාබද්ධ කර වර්තමාන සහ අනාගත වැඩ පරිසරයට යෝග්‍ය වන පරිදි සකස් කර ඇති නව සේවා නියුක්ති පනත් සංකල්ප පත්‍රිකාව නීති කෙටුම්පතක් බවට පත් කර ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අමාත්‍යාංශය වෙත අවශ්‍ය සහය ලබා දීම.

3.2.2 ශ්‍රී ලංකාවේ සියලු දිස්ත්‍රික්ක 2025 වර්ෂය වන විට 'ළමා ශ්‍රමයෙන් තොර කලාප' ලෙස තහවුරු කිරීම සඳහා අදාළ කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය. ඒ අනුව, ළමා ශ්‍රමය / අනතුරුදායක ළමා ශ්‍රමය අවධානම වැඩි දිස්ත්‍රික්ක 10ක් 2022 සහ 2023 වර්ෂ තුළ දී තෝරා ගෙන අදාළ ක්‍රියාකාරකම් සිදු කරන ලදී. ඒ අනුව, 2024 වර්ෂයේදී එම දිස්ත්‍රික්කවලට අතිරේකව තවත් දිස්ත්‍රික්ක 10ක් තෝරාගනිමින් ළමා ශ්‍රමයෙන් තොර කලාප ලෙස තහවුරු කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් සහ උප කම්කරු කාර්යාල හරහා අදාළ දිස්ත්‍රික්කයන් හි දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ ළමයින් සම්බන්ධ කටයුතු කරන සියලුම රාජ්‍ය ආයතන මෙන්ම ප්‍රජා නායකයින්, ප්‍රජා සංවිධාන සහ පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතන නියෝජිතයන්ද සම්බන්ධ කර ගනිමින් ළමා ශ්‍රමය පිළිබඳ නීතිමය තත්ත්වය පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම සහ වැඩසටහන් අධීක්ෂණය කිරීමට සැලසුම් කර ඇත. එසේම, විශේෂයෙන්ම ධීවර ක්ෂේත්‍රය ආශ්‍රිත ළමා ශ්‍රමය ශුන්‍ය කිරීමේ අරමුණ පෙරදැරිව එම ක්ෂේත්‍රය ආශ්‍රිතව විශේෂ පරීක්ෂණ සහ වැටලීම් මාලාවක් සිදු කිරීමටද සැලසුම් කර ඇත.

3.2.3 දිස්ත්‍රික් මට්ටමින් සේවක අර්ථසාධක අරමුදල යටතේ නව සාමාජිකයින් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා නව මෘදුකාංග පද්ධතියක් භාවිතා කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව, සියලුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලවල නව මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමටත් නිලධාරීන් පුහුණු කිරීමෙන් අනතුරුව නව සාමාජික ලියාපදිංචි කටයුතු ආරම්භ කිරීමටත් සැලසුම් කර ඇත. මෙම නව මෘදුකාංග පද්ධතිය භාවිතය මගින් රැකියාවට බැඳුනු අවස්ථාවේදීම සේවකයාට අදාළ දිස්ත්‍රික් හෝ උප කම්කරු කාර්යාලය වෙත පැමිණ ඇඟිලි සලකුණු ලබා දී සේවක අර්ථසාධක අරමුදල සඳහා ලියාපදිංචි වීමට අවස්ථාව සැලසේ. එමගින් ආරම්භක අවස්ථාවේදීම සේවකයා පිළිබඳ නිවැරදි දත්ත, මෘදුකාංග පද්ධතියට ඇතුලත් කර ගත හැකි වීම මඟින් සේවකයා වෙත සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලබා දෙනු ලබන අවස්ථාවලදී ඇතිවන ගැටලු අවම කර ගනිමින් කාර්යක්ෂම සේවාවක් සේවාලාභීන් වෙත ලබා දීමට අවස්ථාව සැලසේ.

3.2.4 කොළඹ, කළුතර සහ ගම්පහ යන දිස්ත්‍රික්කයන්හි පිහිටි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආශ්‍රිතව සිදු වන අනතුරු සහ ලෙඩ රෝග අවම කිරීමේ අරමුණින් එම දිස්ත්‍රික්ක තුනෙහි පිහිටි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සම්බන්ධයෙන් මූලික සංගණනයක් සිදු කර එම කර්මාන්තවල වැඩ පරිසර තත්ත්වයන් පිළිබඳ මිනුම් ලබා ගැනීමෙන් අනතුරුව එම කර්මාන්තවල වෘත්තීයමය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය වර්ධනයට අවශ්‍ය නිර්දේශ ලබා දීම සහ නිරන්තර පසු විපරම් කිරීම.

3.2.5 උතුරු පළාතේ සේවකයන්, සේව්‍යයන් සහ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ අධ්‍යාපනය ලබන සිසුන් සඳහා අවශ්‍ය සුරක්ෂිතතා දැනුම ලබා ගැනීමට ඇති අවස්ථා සීමිත බැවින් එම අවස්ථා පුළුල් කිරීමේ අරමුණ පෙරදැරිව යාපනය දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලයේ සුරක්ෂිතතා ප්‍රදර්ශනාගාරයක් ස්ථාපිත කිරීම

3.2.6 කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ 3,4,5 සහ 6 මහල්වල අභ්‍යන්තර නිර්මිත කටයුතු සිදු කිරීම සහ එම ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක අළුත්වැඩියා කටයුතු සිදු කිරීම

3.2.7 රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය (Public Private Partnership – PPP) යටතේ මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ පොදු පහසුකම් වැඩි දියුණු කිරීම

3.2.8 කම්කරු නිලධාරී සහ නීති නිලධාරී තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අදාළ කටයුතු සිදු කිරීම

3.2.9 දේශීය විශ්ව විද්‍යාලවල සහය සහිතව කම්කරු ක්ෂේත්‍රයට අදාල යෝග්‍ය පර්යේෂණ මාතෘකා යටතේ පර්යේෂණ නිබන්ධන සිදු කිරීම

## 3.3 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

3.3.1 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශ රැකියාවල නියුක්තව සිට, ආපසු ශ්‍රී ලංකාවට පැමිණි/පැමිණෙන විගමනිකයින්ට නැවත සමාජගත වීම සඳහා සහයවීමට "විගමනික ශ්‍රමික ප්‍රත්‍යානුකලන සහය කමිටු" ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම

3.3.2 ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධානයේ මූල්‍ය අනුග්‍රහය මත සබරගමුව හා දකුණු පළාත් විගමනික සම්පත් මධ්‍යස්ථාන පරිශ්‍රයන් තුළ පූර්ණ පහසුකම් සහිතව විගමනික ප්‍රජාවට තොරතුරු පහසුවෙන් ලබාදීම සඳහා තොරතුරු මධ්‍යස්ථාන දෙකක් ස්ථාපිත කිරීම

3.3.3 විදේශ රැකියාවක නිරතව සිට ආපසු පැමිණි ශ්‍රී ලාංකිකයින්ව සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආරම්භ කිරීමට දිරි ගැන්වීම උදෙසා, ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධානයේ මූල්‍ය අනුග්‍රහයෙන් ජංගම සේවා වැඩසටහන් දෙකක් දකුණු පළාත සහ සබරගමු පළාත ආශ්‍රිතව පැවැත්වීම

3.3.4 විශේෂ විමර්ශන අංශයට පැමිණිලි යොමු කිරීම සහ යාවත්කාලීන කිරීම මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කිරීම සඳහා පහසුකම් සැලසීම

3.3.5 රැකියා නියෝජිත ආයතන සඳහා බලපත්‍ර අළුත් කිරීම මාර්ගගතව සිදුකිරීම සහ එම තොරතුරු යාවත්කාලීන කිරීම

3.3.6 විදේශ රැකියා නියුක්තිකයින් විසින් එවනු ලබන ප්‍රේෂණ පදනම් කරගනිමින් බහුකාර්ය සහනදායී ණය යෝජනා ක්‍රමයක් පිහිටුවීම

3.3.7 කාර්යාංශයේ ලියාපදිංචි වූ විගමනික ශ්‍රමිකයින්ගේ නිවාස අවශ්‍යතා සපුරාලීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහයෝගීත්වයෙන් නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම

3.3.8 ගෘහස්ත අංශයේ රැකියා සඳහා කාර්යාංශයේ ලියාපදිංචි විදේශගත වන ශ්‍රමිකයින් සඳහා වියලි ආහාර අඩංගු රු. 10,000.00 ක වටිනාකමින් යුත් වවුචර්පත් ලබාදීම

## 3.4 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

3.4.1 රැකියා අපේක්ෂිතයින් හා රැකියා සපයන්නන් මාර්ගගතව ලියාපදිංචි කිරීම

3.4.2 අවිධිමත් අංශයේ වෘත්තීන් හඳුනාගෙන සංවිධිත කොට විධිමත් වෘත්තීන් ලෙස ස්ථාපිත කිරීමේ "Dignity of Labour" වැඩසටහනේ පාර්ශවකාර ආයතනයක් ලෙස දායකත්වය ලබා දීම

3.4.3 දෙපාර්තමේන්තුවේ සේවා මාර්ගගතව ඉටුකිරීම

3.4.4 6 ශ්‍රේණියෙන් ඉහළ පාසල් සිසුන් සඳහා Career Clubs හඳුන්වා දීම

3.4.5 අනෙකුත් මනෝමිතික පරීක්ෂණ (වෘත්තීය යතුර, බහුවිධ බුද්ධි න්‍යාය හැර) ස්වයංක්‍රියකරණය (Automation)

3.4.6 YouTube, FB, Twitter, LinkedIn, TikTok, WhatsApp, Instagram වැනි සමාජ මාධ්‍ය භාවිතයෙන් විවිධ සමාජ ස්ථරයන් ආමන්ත්‍රණය කිරීම

3.4.7 වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම හා සාර්ථක ව්‍යවසායකයින් පිළිබඳව සැකසූ වීඩියෝ පට දෙපාර්තමේන්තු YouTube නාලිකාවෙහි Upload කිරීම

3.4.8 කඩදාසි භාවිතය අවම කළ කාර්යාලයක් බවට පත් වීම

## 3.5 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ පුහුණු අංශය මඟින් 2023 වසර තුළ පහත දක්වා ඇති පුහුණු වැඩසටහන් තුළින් රු 42,950,000.00 ක ආදායමක් උපයා ගැනීමට අපේක්ෂා කෙරේ.

- ඩිප්ලෝමා පාඨමාලා
- එළිමහන් පුහුණු වැඩසටහන් (Outbound Trainings)
- විශේෂ වැඩමුළු
- එක්දින, දෙදින, තෙදින වැඩසටහන්
- ආයතන ඉල්ලීම මත කරන වැඩසටහන්
- සුනිසි මෙහෙවර ව්‍යාපෘතිය
- උපදේශන සේවා (Provide Consultancy Servicers)
- පුද්ගල සහතික කිරීම( Certification scheme for Individual)

ඉහත අපේක්ෂිත ආදායම උපයා ගැනීම සඳහා පහත සඳහන් නව උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

- බාහිර ආයතන සමඟ නව සබඳතා වැඩි දියුණු කිරීම
- සමීක්ෂණයක් මඟින් ඉලක්කගත වෙළෙඳපළ තවදුරටත් හඳුනා ගැනීම
- පංති කාමර වැඩසටහන්වල ගුණාත්මකභාවය තවදුරටත් ඉහළ නැංවීම
- නව වැඩසටහන් හඳුන්වාදීම
- කම්කරු නීති හා කාර්මික සබඳතා ඩිප්ලෝමා පාඨමාලාව ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් - V (NVQ Level V) යටතේ ආරම්භ කිරීම
- විශේෂ වැඩමුළු (Workshop) පැවැත්වීමට අවශ්‍ය පසුබිම සකසා ගැනීම
- පිට පළාත් වෙත පුහුණු පාඨමාලා රැගෙන යාම
- මාර්ගගත තාක්ෂණය ඔස්සේ පවත්වනු ලබන වැඩසටහන් වැඩි කිරීම
- අලෙවිකරණ උපායමාර්ග ප්‍රවර්ධනය කිරීම

## 3.6 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

3.6.1 සුරාබෝ කැම්පස් ආයතනය විසින් පවත්වනු ලබන සාත්තු සේවක පාඨමාලාව අදාළ වෘත්තීය සුරක්ෂිතතා හා ආරක්ෂාව පිළිබඳව විෂයපථය ආයතනය විසින් ඉලක්ක කරනු ලබන අතර මෙම පාඨමාලාව තුළින් වර්තමාන විදේශ විනිමය අර්බුදය වෙනුවෙන් විදේශ සේවයට යන සාත්තු සේවක සේවිකාවන් සඳහා ක්‍රියාත්මක කරනු ලැබේ. මෙමඟින් විදේශ විනිමය මෙරටට ගෙන ඒමට දායකත්වයක් ලබා දීම සිදු කරනු ලැබේ

3.6.2 ශ්‍රී ලාංකික සිසුන් සඳහා දකුණු කොරියාවේ වැංසිං විශ්ව විද්‍යාලයේ Safety Engineering උපාධිය හැදෑරීමට අවශ්‍ය කටයුතු සකස්කර දීමේ ජාතික කර්තව්‍යට එම විශ්ව විද්‍යාලය හා ගිවිසුම් ගත වීමට හැකියාව ලැබී ඇත.

එහි මූලික පියවර වශයෙන් සිසුන් 25 දෙනෙක් තෝරා ගෙන ඔවුන්ට ආයතනයේ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලබා දී ඔවුන් උපාධි පාඨමාලාවට යොමු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇත. ඒ තුළින් ශ්‍රී ලාංකීක සිසුන් හට E – 7 කාණ්ඩය යටතේ වෘත්තීමය හැකියාව ලබාගැනීමට අවස්ථාව උදාවන අතර 50% මට්ටමක් සහිතව උපාධි පාඨමාලාව නිම කිරීමට ද එකග වී ඇත. එහිදී ශ්‍රී ලාංකීක සිසුන් සඳහා දකුණු කොරියාවේ රැකියා අවස්ථා ලබා ගැනීමට පහසුවෙන් අවස්ථාව උදා කර ගැනීමට හැකි වීම තුළින් ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයා ගැනීමට දායකත්වය ලබා දීමට අපේක්ෂිතය.

3.6.3 වැඩබිම් තුළ සිදු වන අනතුරු වැළැක්වීමට හා සේවක සේවිකාවන්ට සුරක්ෂිත වැඩබිමක් නිර්මාණය කිරීම සඳහා සහතික කරනු ලබන පාරිසරික මිනුම් සමීක්ෂණය සහ අවධානම් තක්සේරු කිරීමේ වැඩසටහන වර්ෂය පුරාවටම සිදු කරනු ලබයි. ඉදිරි මාස හතර තුළ පාරිසරික සමීක්ෂණ 60ක් හා අවධානම් තක්සේරු කිරීමේ වැඩසටහන් 04ක් සිදු කිරීමට නියමිතය. මීට අමතරව කර්මාන්තශාලාවලින් ලැබෙන ඉල්ලුම අනුව ඉදිරියේදී ද ආයතනගත පුහුණු සිදු කිරීමට අපේක්ෂිතය. මේ සඳහා සහතික පත්‍රයක් ලබා දෙනු ලබයි. කර්මාන්තශාලා සඳහා ජාත්‍යන්තර වෙළඳපළෙහි පිළිගැනීම ලබා ගැනීමට ඉන් පිටුවහලක් ලැබේ. එසේ ජාත්‍යන්තර පිළිගැනීම තුළින් විදේශීය ගැණුම්කරුවන්ගේ ඇණවුම් ලබා ගැනීමට අවස්ථාව උදාවනු ඇත.

3.6.4 USAID ආයතනය හා එක්ව YOULIED ව්‍යාපෘතියේ ECO Trail නමින් සුළු හා මධ්‍ය පරිමාණ නිවාඩු නිකේතන මෙන්ම හෝටල් පරිශ්‍රයන්ගේ සුරක්ෂිතතාවය ඉහළ නැංවීම උදෙසා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සමඟ එක්ව ආරම්භ කරන ලදි. ඒ තුළින් ඌව පළාතේ පිහිටා ඇති සංචාරක නිකේතන හා හෝටල් 150 ට අධික ප්‍රමාණයක් අධීක්ෂණය කිරීමට නියමිතය. 2023 වර්ෂය අවසන් වීමට පෙර ආයතන අධීක්ෂණය කර තත්ත්ව සහතික නිකුත් කිරීමට නියමිත අතර විදේශීය සංචාරකයින් සුරක්ෂිතතාවය පිළිබඳ අවධානය යොමු කරමින් නිවාඩු නිකේතන හා හෝටල් වල සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය ගොඩනැගීමට අවශ්‍ය ආකාරයට එම ආයතන දැනුවත් කිරීම හා ඒ සඳහා සහතිකයක් ලබා දීම මෙම ව්‍යාපෘතිය තුළින් සිදු කරනු ලැබේ.

3.6.5 ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය සැමරීම පදනම් කර ගනිමින් නොවැම්බර් මස දෙවන සතියේ දි ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මන්ත්‍රණය 2023 පැවැත්වීමට සැලසුම් කර ඇත.

3.6.6 වැඩ කරන සේවක සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය සඳහා කැපවී සේවය කළ ව්‍යාපාර හා ආයතන ඇගයීම අරමුණින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා සම්මාන උළෙල 2023 නොවැම්බර් මස මැද භාගයේ දි පැවැත්වීමට සැලසුම් කර ඇත.

3.6.7 විධායක ශ්‍රේණි නිලධාරීන් සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ පාඨමාලාවන් දෙකක් සහ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ඩිප්ලෝමා පාඨමාලාවන් දෙකක් ආරම්භ කිරීමට නියමිතය.

## 3.7 කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය

1934 අංක 19 දරණ කම්රු වන්දි ආඥා පනත සහ 1950 අංක 43 දරණ කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීම මඟින් කම්කරු වන්දි ලබාදීම සම්බන්ධ කාර්ය කඩිනම් කිරීම සඳහා කම්කරු වන්දි කොමසාරිස් සහ කම්කරු විනිශ්චය සභා වෙත සමගාමී අධිකරණ බලයක් ලබාදීමත් සේවා ස්ථානයේ දී සිදු වූ අනතුරු සඳහා වන්දි ගෙවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම උදෙසා වන්දි ගෙවීමට අදාළ නඩු විභාග කිරීමටත් කම්කරු වන්දි කොමසාරිස් සහ කම්කරු විනිශ්චය සභා වෙත සමගාමී අධිකරණ බලතල ලබා දීමටත් හැකියාව ලැබුණි. මේ තුළින් මහජනතාවගේ සුභසාධනය වැඩි දියුණු කිරීමට කටයුතු කිරීමට හැකියාව ලැබුණු අතර ඉදිරියේදී කම්කරු වන්දි ලබා දීමේ කාර්යය තව දුරටත් කඩිනම් කිරීමට බලාපොරොත්තු වේ.

## 3.8 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

### 3.8.1 සුහුරු ව්‍යවසායකයෝ වැඩසටහන

මෙම වැඩසටහන 2023 වසරේදී ආරම්භ කරන ලද අතර, දිස්ත්‍රික්ක 25 සඳහාම අවශ්‍ය දැනුවත් කිරීම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මේ වනවිට සිදුකර ඇත. 2024 වසර තුළදී ද මෙම විශේෂිත වැඩසටහනෙහි ඉදිරි කටයුතු සිදුකෙරෙන අතර, තෝරාගත් ව්‍යවසායකයන් මෙමඟින් සවිබල ගැන්වීම සිදු කෙරෙනු ඇත.

### 3.8.2 රාජ්‍ය අංශය සඳහා ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ විශේෂිත වැඩසටහන

මෙම වැඩසටහන 2023 වසර තුළදී ආරම්භ කරන ලද අතර, 2024 වසර තුලදී පසු විපරම් ක්‍රමවේදය සමගින් රාජ්‍ය අංශයේ ආයතන තුල ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් සිදුකිරීමට අපේක්ෂිතය. සියළු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි රාජ්‍ය අංශයේ මාණ්ඩලික නිලධාරීන් සඳහාද විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක වනු ඇත.

### 3.8.3 මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන්

මේ යටතේ මාර්ගගත ක්‍රමය තුලින් ප්‍රජා දැනුවත්භාවය ලබාදීම සඳහා WEBINAR SERIES වැඩසටහන් මාලාව ක්‍රියාත්මක කිරීම, ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම, ආයතනික කාර්යභාරය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම අරමුණු කර ගනිමින් රූපවාහිනී වැඩසටහන් තුළින් ප්‍රචාරණ කටයුතු සිදු කිරීම, වැනි ක්‍රියාකාරකම් සිදු කෙරෙනු ඇත.

### 3.8.4 "සුපිළිසර නිවසක්" ප්‍රජා ඵලදායිතා වැඩසටහන

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කේන්ද්‍ර කර ගනිමින් එම කොට්ඨාසයන්හි සිටින ප්‍රජාව වෙත අවශ්‍ය දැනුවත් කිරීම් ලබාදීම තුලින්, ඵලදායිතා සංකල්ප, මෙවලම්, හා තාක්ෂණය භාවිතයෙන් ඔවුන් සවිබලගැන්වීමට අවශ්‍ය පරිසරය සැකසීම 2024 වසර තුළදි සිදු කරනු ඇත.

### 3.8.5 ඵලදායිතා සංකල්ප හා මෙවලම් ආශ්‍රිත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

විවිධ වූ පුහුණු වැඩසටහන් සිදුකිරීම සඳහා දිවයිනේ බොහෝ ආයතන වෙතින් විවිධ වූ ඉල්ලීම් ලැබෙමින් පවතින අතර, මෙම ඉල්ලීම් හා අනෙකුත් යෝජනා ද සැලකිල්ලට ගනිමින් විවිධ වූ ක්ෂේත්‍ර ආවරණය කර ගනිමින් 2024 වසර තුළදී ආදායම් උත්පාදන නොවන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

### 3.8.6 ආසියානු ඵලදායිතා සංවිධානය සමග එක්ව විවිධ වැඩසටහන් සිදුකිරීම

ආසියානු ඵලදායිතා සංවිධානය විසින් විවිධ වැඩමුළු, සම්මන්ත්‍රණ. තාක්ෂණ විශේෂඥ සේවා වැඩසටහන්, ධාරිතා සංවර්ධන වැඩසටහන් වැනි දෑ සිදුකෙරෙන අතර, ඒ සඳහා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ උපරිම දායකත්වය ලබාදීම තුලින් වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙනු ඇත. එමෙන්ම 2023 වසරේ ආරම්භ කරන ලද විවිධ වූ ව්‍යාපෘතිවල පසු විපරම් කටයුතු ද 2024 වසර තුලදී සිදුකිරීමට අපේක්ෂිතය.

### 3.8.7 ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය

වසර දෙකකට වරක් මෙම තරඟාවලිය පැවත්වෙන අතර, 2024 වසර තුලදී ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය සඳහා අයදුම්පත් කැඳවීමට නියමිතය. රාජ්‍ය, අධ්‍යාපන සහ සේවා හා නිෂ්පාදන යන ක්ෂේත්‍රයන්ට අයත් ආයතන මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කරනු ඇති බවට අපේක්ෂා කෙරේ.

## 3.9 ශ්‍රම වාසනා අරමුදල

3.9.1 රට තුළ පවතින ආර්ථික අර්බුදය හමුවේ කම්කරුවන් උදෙසා අරමුදල මඟින් සිදු කරනු ලබන වැඩසටහන් පුළුල් කිරීමේ අරමුණ ඇතිව උපාය මාර්ග සැලැස්මක් අනුව වැඩසටහන් සිදු කිරීමට කටයුතු සංවිධානය කර ඇත

3.9.2 2024 වර්ෂයේ පළමු කාර්තුවේ දී මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ලොතරැයි නියෝජිත ආයතනයක් ආරම්භ කිරීමට හා දෙවන කාර්තුවේ දී අන්තර් ජාතික ලොතරැයියක් හඳුන්වා දීමට සහ කෙටි පණිවිඩ ලොතරැයියක් හඳුන්වා දීමටත් (SMS Lottery) කටයුතු සංවිධානය කර ඇත.



**புகைப்படம்** 3.1 - மாண்புமிகு அமைச்சர் மற்றும் ஜப்பானிய பிரதிநிதியுடனான சந்திப்பு

## 3.10 ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්.) සමාගම

ඉදිරියේ දී විදේශගත කිරීමට අපේක්ෂිත රැකියා ඇණවුම පහත පරිදි වේ.

වගුව **3.1** - විදේශගත කිරීමට අපේක්ෂිත රැකියා ඇණවුම - ශ්‍රී. ලං.වි.ර.ඒ .(පුද්.) සමාගම

| රට | **රැකියා කාණ්ඩ** | **රැකියා ඇණවුම් ප්‍රමාණය** |
|---|---|---|
| සයිප්‍රස් | සෘජු බඳවාගැනීම් | 50 |
| රුමේනියා | කම්කරු | 19 |
| | එක්ස්කැවේටර් ඔපරේටර් | 04 |
| | ඩම්ට්‍රක් | 02 |
| | බරවාහන රියදුරු | 01 |
| | මෝටර්කාර්මික | 01 |
| | බරවාහන කාර්මික | 02 |
| | ඩෑම් ට්‍රක් රියදුරු | 01 |
| | බැකෝලෝඩර් | 02 |
| | වෙල්ඩර් | 05 |
| | අශ්වාරෝහක | 02 |
| | පේස්ට්‍රි සාදන්නන් | 02 |
| | ලොක් ස්මිත් | 07 |
| | වාහන විදුලි කාර්මික | 04 |
| | වාහන ටින්කරින් | 01 |
| | වාහන වායුසමීකරණ ශිල්පීන් | 01 |
| | ටෙරාසෝ | 19 |
| | මෝටර්රථ මැකැනික් | 02 |
| | ඔටෝ පේන්ටර් | 01 |
| | ට්‍රක් රියදුරු | 03 |
| | අරක්කැමි | 07 |
| | පීසා සාදන්නන් | 02 |
| | බුල්ඩොසර් මැකැනික් | 03 |
| | කිරිආශ්‍රිත නිශ්පාදන | 03 |
| ජපානය | ඉංජිනේරු | 05 |
| | සාත්තු සේවක | 10 |
| සිංගප්පූරුව | පුහුණු අභ්‍යාසලාභීන් | 500 |
| කොරියාව | වැද්දුම් ශිල්පීන් | 30 |
| මෝල්දෝවා | ජුකී මැෂින් ක්‍රියාකරවන්නන් | 50 |

7 මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 05
7 ஆவது தளம், "மெஹெவர பியச நாராஹேன்பிட்டி கொழும்பு 05
**7th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 05**

011 2368164 / 011 2581991

011 2582938 / 011 2368165

slmol@slt.lk

www.labourmin.gov.lk

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு
MINISTRY OF LABOUR AND FOREIGN EMPLOYMENT